# අ.පො.ස (සා.පෙළ) විභාගය - 2015

# ඇගයීම් වාර්තාව

# 21 - සිංහල භාෂාව හා සාහිත්‍යය

පර්යේෂණ හා සංවර්ධන ශාඛාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව.

# අ.පො.ස.(සා.පෙළ) විභාගය - 2015

## ඇගයීම් වාර්තාව

# 21 - සිංහල භාෂාව හා සාහිත්‍යය

පර්යේෂණ හා සංවර්ධන ශාඛාව
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව.

**සියලු ම හිමිකම් ඇවිරිණි.**

**සිංහල භාෂාව හා සාහිත්‍යය**

ඇගයීම් වාර්තාව - අ.පො.ස.(සා.පෙළ) විභාගය - 2015


**මූල්‍ය අනුග්‍රහය**

අනාගත දැනුම් කේන්ද්‍රීය පදනම ලෙස පාසල් පද්ධතිය ප්‍රතිනිර්මාණය කිරීමේ ව්‍යාපෘතිය (TSEP-WB) මගිනි.

# හැඳින්වීම

ශ්‍රී ලංකාවේ ප්‍රසිද්ධ විභාග අතුරින් වැඩි ම අයදුම්කරුවන් සංඛ්‍යාවක් පෙනී සිටින්නේ අ.පො.ස.(සා.පෙළ) විභාගය සඳහා ය. ජාතික මට්ටමින් පැවැත්වෙන මෙම විභාගයේ ප්‍රතිඵල මත නිකුත් කෙරෙන සහතිකය, උසස් අධ්‍යාපනය සඳහා සුදුස්සන් තෝරා ගැනීමට පමණක් නොව මධ්‍යම මට්ටමේ රැකියා අවස්ථා ලබාගැනීමට ද ජාතික හා ජාත්‍යන්තර විශ්වවිද්‍යාලවල සමහර පාඨමාලා හැදෑරීමට මූලික සුදුසුකමක් ලෙස සැලකෙන මිනුම් දණ්ඩක් වශයෙන් ද පිළිගැනේ. මෙලෙස පිළිගැනෙන්නේ මෙම විභාගයේ ඇති වලංගුතාව හා විශ්වසනීයතාව මෙන් ම ඉහළ ගුණාත්මක බව ද හේතුවෙනි.

මෙම විභාගයෙන් උසස් සාධන මට්ටමක් ලබා ගැනීම සඳහා සිසුහු ද ඔවුන්ගේ එම අපේක්ෂා සපුරාලීම සඳහා ගුරුවරු හා දෙමව්පියෝ ද දැඩි වෙහෙසක් දරති. මෙම ඇගයීම් වාර්තාව සකස්කර ඇත්තේ ඔවුන්ගේ එම අපේක්ෂා ඉටුකරගැනීම පිණිස ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ සහාය දීමක් වශයෙනි. මෙම ඇගයීම් වාර්තාවේ ඇතුළත් තොරතුරු විභාග අපේක්ෂකයින්ට, ගුරු භවතුන්ට, විදුහල්පතිවරුන්ට, ගුරු උපදේශක මහත්ම මහත්මීන්ට, විෂයභාර අධ්‍යක්ෂවරුන්ට, දෙගුරුන්ට හා අධ්‍යාපන පර්යේෂකයින්ට එක සේ ප්‍රයෝජනවත් වනු නොඅනුමාන ය. මේ නිසා මෙම වාර්තාව වැඩි පිරිසකගේ පරිශීලනය සඳහා පුස්තකාලයට යොමු කිරීම වඩාත් සුදුසු වේ.

මෙම ඇගයීම් වාර්තාව කොටස් තුනකින් යුක්ත වන අතර විෂය අභිමතාර්ථ සහ විෂය සාධනය පිළිබඳ සංඛ්‍යානමය තොරතුරු ද මෙම විෂයයෙහි ප්‍රශ්න පත්‍ර ඇසුරෙන් අයදුම්කරුවන්ගේ සාධනය, එක් එක් ප්‍රශ්නය සඳහා වෙන් වෙන්ව ද මෙහි I කොටසෙහි ඇතුළත් වේ. ඇගයීම් හා පරීක්ෂණ ක්ෂේත්‍රයේ භාවිත වන සම්භාව්‍ය පරීක්ෂණ න්‍යාය (Classical Test Theory) සහ අයිතම ප්‍රතිචාර න්‍යාය (Item Response Theory) පදනම් කරගෙන, විභාග දෙපාර්තමේන්තුවේ පර්යේෂණ හා සංවර්ධන ශාඛාව මඟින් මෙම විශ්ලේෂණ සිදුකර ඇත.

සිංහල භාෂාව හා සාහිත්‍යය විෂයයෙහි I, II හා III ප්‍රශ්න පත්‍ර සඳහා අපේක්ෂිත පිළිතුරු, ලකුණු දීමේ පටිපාටි, පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා ප්‍රතිපෝෂණය සඳහා වූ යෝජනාවලින් මෙම වාර්තාවෙහි II කොටස සමන්විත වේ.

ප්‍රශ්න පත්‍රවල එක් එක් ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේ දී අපේක්ෂකයන් සැලකිලිමත් විය යුතු කරුණු ද ඉගෙනුම් ඉගැන්වීම් කාර්යය පිළිබඳ අදහස් හා යෝජනා ද මෙම වාර්තාවෙහි III කොටසෙහි ඇතුළත් කර ඇත. විවිධ නිපුණතා හා එම නිපුණතා මට්ටම්වලට ළඟාවීම සඳහා ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කරගත යුතු ආකාරය පිළිබඳ ව මෙයින් මහත් පිටිවහලක් ලැබෙනු ඇතැයි සිතමි.

මෙම වාර්තාවේ ගුණාත්මක බව වැඩි දියුණු කිරීම සඳහා ඵලදායී අදහස් හා යෝජනා අප වෙත යොමුකරන ලෙස ඉල්ලමි. මෙම වාර්තාව සකස් කිරීම සඳහා කැප වූ පාලක පරීක්ෂකවරුන් ඇතුළු සම්පත් දායකයින්ටත් RD ආකෘති මගින් තොරතුරු සැපයූ ප්‍රධාන/අතිරේක ප්‍රධාන/සහකාර පරීක්ෂකවරුන්ටත් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ඇතුළු කාර්ය මණ්ඩලයේ සියලු ම දෙනාටත් මාගේ හෘදයංගම ස්තුතිය පළ කරමි.

ඩබ්ලිව්.එම්.එන්.ජේ. පුෂ්පකුමාර
විභාග කොමසාරිස් ජනරාල්

2016 නොවැම්බර් 30
පර්යේෂණ හා සංවර්ධන ශාඛාව,
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
පැලවත්ත,
බත්තරමුල්ල.

| | | |
|---|---|---|
| **උපදේශනය** | : | ඩබ්ලිව්.එම්.එන්.ජේ. පුෂ්පකුමාර<br>විභාග කොමසාරිස් ජනරාල් |
| **මෙහෙයවීම හා සංවිධානය** | : | ගයාත්‍රි අබේගුණසේකර<br>විභාග කොමසාරිස්<br>(පර්යේෂණ හා සංවර්ධන) |
| **සම්බන්ධීකරණය** | : | බුද්ධිකා පෙරේරා<br>නියෝජ්‍ය විභාග කොමසාරිස් |
| **සංස්කරණය** | : | මහාචාර්ය රත්න විජේතුංග<br>ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය |
| | | ශ්‍රියානි අබේවික්‍රම<br>නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ (විශ්‍රාමික)<br>අධ්‍යාපන අමාත්‍යාංශය |
| **සැකසුම් කමිටුව** | : | ශ්‍රියානි අබේවික්‍රම<br>නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ (විශ්‍රාමික)<br>අධ්‍යාපන අමාත්‍යාංශය |
| | | එස්.කේ. පද්මා ඕපාත<br>ගුරු සේවය I<br>කු/ශ්‍රී නිශ්ශංක මහා විද්‍යාලය<br>කුරුණෑගල |
| **පරිගණක පිටපත සැකසුම** | : | කේ. ඒ. අයි. බණ්ඩාර<br>දත්ත සටහන් ක්‍රියාකරු II |

# ඇතුළත පිටු

පිටු අංකය

## I කොටස


1. විෂය අභිමතාර්ථ හා විෂය සාධනය පිළිබඳ තොරතුරු

1.1 විෂය අභිමතාර්ථ 1

1.2 විෂය සාධනය පිළිබඳ සංඛ්‍යානමය තොරතුරු
1.2.1 විෂයය සඳහා පෙනී සිටි අයදුම්කරුවන් සංඛ්‍යාව 2
1.2.2 අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය 2
1.2.3 ප්‍රථම වරට පෙනී සිටි පාසල් අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය - දිස්ත්‍රික්ක අනුව 3
1.2.4 ප්‍රථම වරට පෙනී සිටි පාසල් අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය - අධ්‍යාපන කලාප අනුව 4
1.2.5 ලකුණු ලබාගෙන ඇති ආකාරය - පන්ති ප්‍රාන්තර අනුව 7

1.3 විෂය සාධනය පිළිබඳ විශ්ලේෂණය
1.3.1 I ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය 8
1.3.2 II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න තෝරාගෙන ඇති ආකාරය 9
1.3.3 II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය 9
1.3.4 II ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය 10
1.3.5 III ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න තෝරාගෙන ඇති ආකාරය 11
1.3.6 III ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය 11
1.3.7 III ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය 12


## II කොටස


2. ප්‍රශ්න හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

2.1 I ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු
2.1.1 I ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය 13
2.1.2 I ප්‍රශ්න පත්‍රය 14
2.1.3 I ප්‍රශ්න පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය 18
2.1.4 I ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ (තේමා අනුව) 19
2.1.5 I ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්නවල වරණ තෝරාගෙන ඇති ආකාරය (ප්‍රතිශත ලෙස) 20
2.1.6 I ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා යෝජනා 21

2.2 II ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු
2.2.1 II ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය 24
2.2.2 II ප්‍රශ්න පත්‍රයෙහි එක් එක් ප්‍රශ්නය, එම ප්‍රශ්න සඳහා අපේක්ෂිත පිළිතුරු, ලකුණු දීමේ පටිපාටිය, පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන 25

2.3 III ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු
2.3.1 III ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය 39
2.3.2 III ප්‍රශ්න පත්‍රයෙහි එක් එක් ප්‍රශ්නය, එම ප්‍රශ්නය සඳහා අපේක්ෂිත පිළිතුර, ලකුණු දීමේ පටිපාටිය, පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන 39


## III කොටස


3. පිළිතුරු සැපයීමේදී සැලකිලිමත් විය යුතු කරුණු හා යෝජනා
3.1 පිළිතුරු සැපයීමේදී සැලකිලිමත් විය යුතු කරුණු 54
3.2 ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලියෙහි සංවර්ධනය සඳහා අදහස් හා යෝජනා 55

## I කොටස

1. **විෂය අභිමතාර්ථ හා විෂය සාධනය පිළිබඳ තොරතුරු**

1.1 **විෂය අභිමතාර්ථ**

* අවබෝධයෙන් යුතුව ශ්‍රවණය, කථනය, කියවීම, ලිවීම යන චතුර්විධ භාෂා කුසලතා සංවර්ධනය කිරීම
* නිරවුල් ලිඛිත ප්‍රකාශන ඉදිරිපත් කිරීම සඳහා නිවැරදි භාෂා කුසලතා වර්ධනය කිරීම
* විවිධ සාහිත්‍ය කෘති පරිශීලනය කිරීමෙන් ජීවිත පරිඥානය ලබාදීම
* ජීවන වෘත්තීන්ට අදාළ ව භාෂාව ප්‍රායෝගිකව උපයෝගි කර ගැනීමේ කුසලතා වර්ධනය කිරීම
* සිංහල භාෂා සාහිත්‍ය පරිචය මගින් සංස්කෘතික දායාද, ආචාර ධර්ම හා ජීවන දෘෂ්ටි, ආකල්ප හා ඇගයුම පිළිබඳ කුසලතා වර්ධනය කිරීම
* විවිධ සාහිත්‍ය නිර්මාණ පරිශීලනය කිරීමෙන් ලබාගත් අත්දැකීම් ආශ්‍රයෙන් සාහිත්‍ය රසඥතා වර්ධනය හා නිර්මාණකරණය සඳහා යොමු කිරීම

## 1.2 විෂය සාධනය පිළිබඳ සංඛ්‍යානමය තොරතුරු

### 1.2.1 විෂයය සඳහා පෙනී සිටි අයදුම්කරුවන් සංඛ්‍යාව

| මාධ්‍යය | පාසල් | පෞද්ගලික | එකතුව |
|---|---|---|---|
| සිංහල | 225586 | 9642 | 235228 |

වගුව 1

### 1.2.2 අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය

| ශ්‍රේණිය | පාසල් අයදුම්කරුවන් | | පෞද්ගලික අයදුම්කරුවන් | | එකතුව | ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | ප්‍රතිශතය | සංඛ්‍යාව | ප්‍රතිශතය | | |
| A | 49621 | 22.00 | 641 | 6.65 | 50262 | 21.37 |
| B | 45533 | 20.18 | 1088 | 11.28 | 46621 | 19.82 |
| C | 63597 | 28.19 | 3063 | 31.77 | 66660 | 28.34 |
| S | 42469 | 18.83 | 2980 | 30.91 | 45449 | 19.32 |
| W | 24366 | 10.80 | 1870 | 19.39 | 26236 | 11.15 |
| එකතුව | **225586** | **100.00** | **9642** | **100.00** | **235228** | **100.00** |

වගුව 2

1.2.3 ප්‍රථම වරට පෙනීසිටි පාසල් අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය - දිස්ත්‍රික්ක අනුව

| දිස්ත්‍රික්කය | පෙනී සිටි සංඛ්‍යාව | විශිෂ්ට සම්මාන සාමර්ථ්‍යය (A) ලැබූ | | අධි සම්මාන සාමර්ථ්‍යය (B) ලැබූ | | සම්මාන සාමර්ථ්‍යය (C) ලැබූ | | සාමාන්‍ය සාමර්ථ්‍යය (S) ලැබූ | | සමත් (A+B+C+S) | | දුර්වල (W) | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| 1. කොළඹ | 30960 | 9465 | 30.57 | 6135 | 19.82 | 7189 | 23.22 | 4731 | 15.28 | 27520 | 88.89 | 3440 | 11.11 |
| 2. ගම්පහ | 28188 | 6446 | 22.87 | 5692 | 20.19 | 7463 | 26.48 | 5133 | 18.21 | 24734 | 87.75 | 3454 | 12.25 |
| 3. කළුතර | 14948 | 3530 | 23.62 | 3081 | 20.61 | 3971 | 26.57 | 2729 | 18.26 | 13311 | 89.05 | 1637 | 10.95 |
| 4. මහනුවර | 16616 | 3301 | 19.81 | 3316 | 19.96 | 4856 | 29.22 | 3364 | 20.25 | 14837 | 89.29 | 1779 | 10.71 |
| 5. මාතලේ | 5947 | 911 | 15.32 | 1084 | 18.23 | 1838 | 30.91 | 1375 | 23.12 | 5208 | 87.57 | 739 | 12.43 |
| 6. නුවරඑළිය | 5049 | 710 | 14.06 | 887 | 17.57 | 1640 | 32.48 | 1161 | 22.99 | 4398 | 87.11 | 651 | 12.89 |
| 7. ගාල්ල | 15947 | 4004 | 25.11 | 3340 | 20.94 | 4296 | 26.94 | 2805 | 17.59 | 14445 | 90.58 | 1502 | 9.42 |
| 8. මාතර | 11946 | 2843 | 23.80 | 2455 | 20.55 | 3336 | 27.93 | 2211 | 18.51 | 10845 | 90.78 | 1101 | 9.22 |
| 9. හම්බන්තොට | 9184 | 1778 | 19.36 | 1997 | 21.74 | 2644 | 28.79 | 1788 | 19.47 | 8207 | 89.36 | 977 | 10.64 |
| 10. යාපනය | 6 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 6 | 100 |
| 11. කිලිනොච්චි | 0 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 |
| 12. මන්නාරම | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 13. වව්නියාව | 295 | 16 | 5.42 | 59 | 20.00 | 92 | 31.19 | 72 | 24.41 | 239 | 81.02 | 56 | 18.98 |
| 14. මුලතිව් | 1 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 1 | 100 |
| 15. මඩකලපුව | 5 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 2 | 40.00 | 2 | 40.00 | 3 | 60.00 |
| 16. අම්පාර | 4193 | 507 | 12.09 | 758 | 18.08 | 1298 | 30.96 | 1005 | 23.97 | 3568 | 85.09 | 625 | 14.91 |
| 17. ත්‍රිකුණාමලය | 1647 | 141 | 8.56 | 260 | 15.79 | 494 | 29.99 | 453 | 27.50 | 1348 | 81.85 | 299 | 18.15 |
| 18. කුරුණෑගල | 21881 | 4522 | 20.67 | 4470 | 20.43 | 6464 | 29.54 | 4400 | 20.11 | 19856 | 90.75 | 2025 | 9.25 |
| 19. පුත්තලම | 8205 | 1587 | 19.34 | 1468 | 17.89 | 2425 | 29.56 | 1738 | 21.18 | 7218 | 87.97 | 987 | 12.03 |
| 20. අනුරාධපුරය | 12155 | 1824 | 15.01 | 2372 | 19.51 | 3875 | 31.88 | 2598 | 21.37 | 10669 | 87.77 | 1486 | 12.23 |
| 21. පොළොන්නරුව | 5120 | 665 | 12.99 | 912 | 17.81 | 1582 | 30.90 | 1199 | 23.42 | 4358 | 85.12 | 762 | 14.88 |
| 22. බදුල්ල | 10934 | 1830 | 16.74 | 2114 | 19.33 | 3552 | 32.49 | 2310 | 21.13 | 9809 | 89.68 | 1128 | 10.32 |
| 23. මොනරාගල | 7136 | 1043 | 14.62 | 1292 | 18.11 | 2186 | 30.63 | 1654 | 23.18 | 6175 | 86.53 | 961 | 13.47 |
| 24. රත්නපුරය | 14127 | 3018 | 21.36 | 2765 | 19.57 | 4093 | 28.97 | 2668 | 18.89 | 12544 | 88.79 | 1583 | 11.21 |
| 25. කෑගල්ල | 10738 | 2121 | 19.75 | 2164 | 20.15 | 3366 | 31.35 | 2053 | 19.12 | 9704 | 90.37 | 1034 | 9.63 |
| **සමස්ත දිවයින** | **235228** | **50262** | **21.37** | **46621** | **19.82** | **66660** | **28.34** | **45449** | **19.32** | **208992** | **88.85** | **26236** | **11.15** |

වගුව 3

1.2.4 ප්‍රථම වරට පෙනී සිටි පාසල් අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය - අධ්‍යාපන කලාප අනුව

| අධ්‍යාපන කලාපය | පෙනී සිටි සංඛ්‍යාව | විශිෂ්ට සම්මාන සාමර්ථ්‍යය (A) ලැබූ | | අධි සම්මාන සාමර්ථ්‍යය (B) ලැබූ | | සම්මාන සාමර්ථ්‍යය (C) ලැබූ | | සාමාන්‍ය සාමර්ථ්‍යය (S) ලැබූ | | සමත් (A+B+C+S) | | දුර්වල (W) | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| 1. කොළඹ | 11636 | 4585 | 39.4 | 2200 | 18.91 | 2320 | 19.94 | 1395 | 11.99 | 10500 | 90.24 | 1136 | 9.76 |
| 2. හෝමාගම | 3456 | 713 | 20.63 | 719 | 20.8 | 926 | 26.79 | 653 | 18.89 | 3011 | 87.12 | 445 | 12.88 |
| 3. ශ්‍රී ජයවර්ධනපුර | 7224 | 2326 | 32.2 | 1703 | 23.57 | 1713 | 23.71 | 948 | 13.12 | 6690 | 92.61 | 534 | 7.39 |
| 4. පිළියන්දල | 5614 | 1594 | 28.39 | 1220 | 21.73 | 1383 | 24.63 | 808 | 14.39 | 5005 | 89.15 | 609 | 10.85 |
| 5. ගම්පහ | 7247 | 2539 | 35.04 | 1577 | 21.76 | 1634 | 22.55 | 852 | 11.76 | 6602 | 91.1 | 645 | 8.9 |
| 6 මිනුවන්ගොඩ | 4806 | 975 | 20.29 | 1021 | 21.24 | 1302 | 27.09 | 915 | 19.04 | 4213 | 87.66 | 593 | 12.34 |
| 7. මීගමුව | 6687 | 1263 | 18.89 | 1373 | 20.53 | 1774 | 26.53 | 1322 | 19.77 | 5732 | 85.72 | 955 | 14.28 |
| 8. කැලණිය | 6745 | 1545 | 22.91 | 1490 | 22.09 | 1810 | 26.83 | 1100 | 16.31 | 5945 | 88.14 | 800 | 11.86 |
| 9. කළුතර | 6542 | 1714 | 26.2 | 1433 | 21.9 | 1590 | 24.3 | 1055 | 16.13 | 5792 | 88.54 | 750 | 11.46 |
| 10. මතුගම | 2877 | 633 | 22 | 657 | 22.84 | 854 | 29.68 | 491 | 17.07 | 2635 | 91.59 | 242 | 8.41 |
| 11. හොරණ | 4257 | 1119 | 26.29 | 913 | 21.45 | 1073 | 25.21 | 689 | 16.19 | 3794 | 89.12 | 463 | 10.88 |
| 12. නුවර | 6019 | 2072 | 34.42 | 1444 | 23.99 | 1435 | 23.84 | 722 | 12 | 5673 | 94.25 | 346 | 5.75 |
| 13. දෙනුවර | 1297 | 159 | 12.26 | 255 | 19.66 | 379 | 29.22 | 322 | 24.83 | 1115 | 85.97 | 182 | 14.03 |
| 14. ගම්පොළ | 2051 | 304 | 14.82 | 375 | 18.28 | 666 | 32.47 | 416 | 20.28 | 1761 | 85.86 | 290 | 14.14 |
| 15. තෙල්දෙනිය | 1454 | 201 | 13.82 | 274 | 18.84 | 462 | 31.77 | 288 | 19.81 | 1225 | 84.25 | 229 | 15.75 |
| 16. වත්තේගම | 1538 | 257 | 16.71 | 376 | 24.45 | 446 | 29 | 291 | 18.92 | 1370 | 89.08 | 168 | 10.92 |
| 17. කටුගස්තොට | 2002 | 263 | 13.14 | 448 | 22.38 | 678 | 33.87 | 388 | 19.38 | 1777 | 88.76 | 225 | 11.24 |
| 18. මාතලේ | 2410 | 600 | 24.9 | 525 | 21.78 | 677 | 28.09 | 396 | 16.43 | 2198 | 91.2 | 212 | 8.8 |
| 19. ගලේවෙල | 1763 | 197 | 11.17 | 336 | 19.06 | 570 | 32.33 | 391 | 22.18 | 1494 | 84.74 | 269 | 15.26 |
| 20. නාඋල | 422 | 50 | 11.85 | 64 | 15.17 | 161 | 38.15 | 98 | 23.22 | 373 | 88.39 | 49 | 11.61 |
| 21. විල්ගමුව | 554 | 51 | 9.21 | 94 | 16.97 | 158 | 28.52 | 142 | 25.63 | 445 | 80.32 | 109 | 19.68 |
| 22. නුවරඑළිය | 603 | 82 | 13.6 | 92 | 15.26 | 215 | 35.66 | 124 | 20.56 | 513 | 85.07 | 90 | 14.93 |
| 23. කොත්මලේ | 725 | 140 | 19.31 | 143 | 19.72 | 226 | 31.17 | 143 | 19.72 | 652 | 89.93 | 73 | 10.07 |
| 24. හැටන් | 715 | 94 | 13.15 | 134 | 18.74 | 230 | 32.17 | 178 | 24.9 | 636 | 88.95 | 79 | 11.05 |
| 25. වලපනේ | 876 | 131 | 14.95 | 186 | 21.23 | 277 | 31.62 | 159 | 18.15 | 753 | 85.96 | 123 | 14.04 |
| 26. හඟුරන්කෙත | 1381 | 247 | 17.89 | 275 | 19.91 | 425 | 30.77 | 258 | 18.68 | 1205 | 87.26 | 176 | 12.74 |
| 27. ගාල්ල | 6693 | 2207 | 32.97 | 1422 | 21.25 | 1606 | 24 | 899 | 13.43 | 6134 | 91.65 | 559 | 8.35 |
| 28. ඇල්පිටිය | 3074 | 576 | 18.74 | 752 | 24.46 | 903 | 29.38 | 517 | 16.82 | 2748 | 89.39 | 326 | 10.61 |
| 29. අම්බලන්ගොඩ | 3142 | 825 | 26.26 | 657 | 20.91 | 854 | 27.18 | 504 | 16.04 | 2840 | 90.39 | 302 | 9.61 |
| 30. උඩුගම | 1749 | 371 | 21.21 | 435 | 24.87 | 526 | 30.07 | 310 | 17.72 | 1642 | 93.88 | 107 | 6.12 |
| 31. මාතර | 4960 | 1708 | 34.44 | 1035 | 20.87 | 1129 | 22.76 | 688 | 13.87 | 4560 | 91.94 | 400 | 8.06 |
| 32. අකුරැස්ස | 1845 | 444 | 24.07 | 408 | 22.11 | 525 | 28.46 | 344 | 18.64 | 1721 | 93.28 | 124 | 6.72 |
| 33. මුලටියන-හක්මන | 1971 | 385 | 19.53 | 486 | 24.66 | 588 | 29.83 | 322 | 16.34 | 1781 | 90.36 | 190 | 9.64 |
| 34. මොරවක-දෙනියාය | 2166 | 294 | 13.57 | 476 | 21.98 | 737 | 34.03 | 407 | 18.79 | 1914 | 88.37 | 252 | 11.63 |

| අධ්‍යාපන කලාපය | පෙනී සිටි සංඛ්‍යාව | විශිෂ්ට සම්මාන සාමර්ථ්‍යය (A) ලැබූ | | අධි සම්මාන සාමර්ථ්‍යය (B) ලැබූ | | සම්මාන සාමර්ථ්‍යය (C) ලැබූ | | සාමාන්‍ය සාමර්ථ්‍යය (S) ලැබූ | | සමත් (A+B+C+S) | | දුර්වල (W) | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| 35. තංගල්ල | 2388 | 543 | 22.74 | 554 | 23.2 | 615 | 25.75 | 410 | 17.17 | 2122 | 88.86 | 266 | 11.14 |
| 36. හම්බන්තොට | 3489 | 575 | 16.48 | 737 | 21.12 | 1054 | 30.21 | 682 | 19.55 | 3048 | 87.36 | 441 | 12.64 |
| 37. වලස්මුල්ල | 2473 | 654 | 26.45 | 643 | 26 | 698 | 28.22 | 333 | 13.47 | 2328 | 94.14 | 145 | 5.86 |
| 38. යාපනය | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 39. දූපත් | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 40. තෙන්මාරච්චි | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 41. වලිකාමම් | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 42. වඩමරච්චි | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 43. කිලිනොච්චි | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 44. මන්නාරම | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 45. මඩු | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 46. වව්නියාව | 225 | 16 | 7.11 | 53 | 23.56 | 64 | 28.44 | 49 | 21.78 | 182 | 80.89 | 43 | 19.11 |
| 47. වව්නියාව උතුර | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 48. මුලතිව් | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 49. තුනුක්කායි | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 50. මඩකලපුව | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 51. කල්කුඩා | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 52. පදිරිප්පු | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 53. මඩකලපුව මධ්‍යම | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 54. අම්පාර | 2165 | 366 | 16.91 | 455 | 21.02 | 618 | 28.55 | 425 | 19.63 | 1864 | 86.1 | 301 | 13.9 |
| 55. කල්මුනේ | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 56. සමන්තුරෙයි | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 57. මහඔය | 521 | 41 | 7.87 | 80 | 15.36 | 166 | 31.86 | 137 | 26.3 | 424 | 81.38 | 97 | 18.62 |
| 58. දෙහිඅත්තකණ්ඩිය | 862 | 87 | 10.09 | 168 | 19.49 | 279 | 32.37 | 187 | 21.69 | 721 | 83.64 | 141 | 16.36 |
| 59. තිරුක්කෝවිල් | 4 | 0 | 0 | 0 | 0 | 1 | 25 | 1 | 25 | 2 | 50 | 2 | 50 |
| 60. අක්කරෙයිපත්තුව | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 61. ත්‍රිකුණාමලය | 271 | 26 | 9.59 | 51 | 18.82 | 75 | 27.68 | 78 | 28.78 | 230 | 84.87 | 41 | 15.13 |
| 62. මුතූර් | 11 | 0 | 0 | 0 | 0 | 2 | 18.18 | 1 | 9.09 | 3 | 27.27 | 8 | 72.73 |
| 63. කන්තලේ | 729 | 89 | 12.21 | 128 | 17.56 | 212 | 29.08 | 181 | 24.83 | 610 | 83.68 | 119 | 16.32 |
| 64. ත්‍රිකුණාමලය (උතුර) | 339 | 23 | 6.78 | 58 | 17.11 | 93 | 27.43 | 87 | 25.66 | 261 | 76.99 | 78 | 23.01 |
| 65. කින්නියා | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 66. කුරුණෑගල | 4998 | 1413 | 28.27 | 1039 | 20.79 | 1301 | 26.03 | 806 | 16.13 | 4559 | 91.22 | 439 | 8.78 |
| 67. කුලියාපිටිය | 3628 | 1025 | 28.25 | 821 | 22.63 | 1075 | 29.63 | 489 | 13.48 | 3410 | 93.99 | 218 | 6.01 |
| 68. නිකවැරටිය | 2428 | 451 | 18.57 | 587 | 24.18 | 728 | 29.98 | 451 | 18.57 | 2217 | 91.31 | 211 | 8.69 |

| අධ්‍යාපන කලාපය | පෙනී සිටි සංඛ්‍යාව | විශිෂ්ට සම්මාන සාමර්ථ්‍යය (A) ලැබූ | | අධි සම්මාන සාමර්ථ්‍යය (B) ලැබූ | | සම්මාන සාමර්ථ්‍යය (C) ලැබූ | | සාමාන්‍ය සාමර්ථ්‍යය (S) ලැබූ | | සමත් (A+B+C+S) | | දුර්වල (W) | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| 69. මහව | 3182 | 464 | 14.58 | 676 | 21.24 | 1080 | 33.94 | 648 | 20.36 | 2868 | 90.13 | 314 | 9.87 |
| 70. ගිරිඋල්ල | 2951 | 706 | 23.92 | 665 | 22.53 | 799 | 27.08 | 517 | 17.52 | 2687 | 91.05 | 264 | 8.95 |
| 71. ඉබ්බාගමුව | 2669 | 424 | 15.89 | 533 | 19.97 | 772 | 28.92 | 616 | 23.08 | 2345 | 87.86 | 324 | 12.14 |
| 72. පුත්තලම | 2725 | 273 | 10.02 | 415 | 15.23 | 881 | 32.33 | 687 | 25.21 | 2256 | 82.79 | 469 | 17.21 |
| 73. හලාවත | 4986 | 1296 | 25.99 | 1003 | 20.12 | 1372 | 27.52 | 871 | 17.47 | 4542 | 91.1 | 444 | 8.9 |
| 74. අනුරාධපුරය | 3841 | 916 | 23.85 | 819 | 21.32 | 1005 | 26.17 | 631 | 16.43 | 3371 | 87.76 | 470 | 12.24 |
| 75. තඹුත්තේගම | 1965 | 247 | 12.57 | 413 | 21.02 | 643 | 32.72 | 430 | 21.88 | 1733 | 88.19 | 232 | 11.81 |
| 74. කැකිරාව | 1907 | 308 | 16.15 | 427 | 22.39 | 600 | 31.46 | 336 | 17.62 | 1671 | 87.62 | 236 | 12.38 |
| 75. ගලෙන්බිඳුණුවැව | 1326 | 136 | 10.26 | 263 | 19.83 | 441 | 33.26 | 293 | 22.1 | 1133 | 85.44 | 193 | 14.56 |
| 76. කැබිතිගොල්ලෑව | 1517 | 206 | 13.58 | 321 | 21.16 | 490 | 32.3 | 305 | 20.11 | 1322 | 87.15 | 195 | 12.85 |
| 77. පොළොන්නරුව | 1310 | 241 | 18.4 | 278 | 21.22 | 387 | 29.54 | 224 | 17.1 | 1130 | 86.26 | 180 | 13.74 |
| 78. හිඟුරක්ගොඩ | 2121 | 310 | 14.62 | 392 | 18.48 | 635 | 29.94 | 448 | 21.12 | 1785 | 84.16 | 336 | 15.84 |
| 79. දිඹුලාගල | 1143 | 107 | 9.36 | 203 | 17.76 | 393 | 34.38 | 277 | 24.23 | 980 | 85.74 | 163 | 14.26 |
| 80. බදුල්ල | 1878 | 495 | 26.36 | 438 | 23.32 | 540 | 28.75 | 268 | 14.27 | 1741 | 92.71 | 137 | 7.29 |
| 81. බණ්ඩාරවෙල | 2409 | 640 | 26.57 | 579 | 24.03 | 684 | 28.39 | 322 | 13.37 | 2225 | 92.36 | 184 | 7.64 |
| 82. මහියංගනය | 1789 | 233 | 13.02 | 289 | 16.15 | 590 | 32.98 | 395 | 22.08 | 1507 | 84.24 | 282 | 15.76 |
| 83. වැලිමඩ | 1992 | 292 | 14.66 | 457 | 22.94 | 645 | 32.38 | 403 | 20.23 | 1797 | 90.21 | 195 | 9.79 |
| 84. පස්සර | 610 | 87 | 14.26 | 111 | 18.2 | 216 | 35.41 | 122 | 20 | 536 | 87.87 | 74 | 12.13 |
| 85. වියලුව | 772 | 55 | 7.12 | 138 | 17.88 | 272 | 35.23 | 193 | 25 | 658 | 85.23 | 114 | 14.77 |
| 86. මොනරාගල | 1873 | 323 | 17.25 | 339 | 18.1 | 524 | 27.98 | 386 | 20.61 | 1572 | 83.93 | 301 | 16.07 |
| 87. වැල්ලවාය | 2770 | 485 | 17.51 | 577 | 20.83 | 820 | 29.6 | 538 | 19.42 | 2420 | 87.36 | 350 | 12.64 |
| 88. බිබිල | 1343 | 211 | 15.71 | 253 | 18.84 | 396 | 29.49 | 280 | 20.85 | 1140 | 84.88 | 203 | 15.12 |
| 89. රත්නපුර | 5306 | 1613 | 30.4 | 1107 | 20.86 | 1285 | 24.22 | 740 | 13.95 | 4745 | 89.43 | 561 | 10.57 |
| 90. බලන්ගොඩ | 2234 | 437 | 19.56 | 466 | 20.86 | 637 | 28.51 | 414 | 18.53 | 1954 | 87.47 | 280 | 12.53 |
| 91. නිවිතිගල | 2028 | 379 | 18.69 | 442 | 21.79 | 624 | 30.77 | 384 | 18.93 | 1829 | 90.19 | 199 | 9.81 |
| 92. ඇඹිලිපිටිය | 3039 | 549 | 18.07 | 628 | 20.66 | 871 | 28.66 | 567 | 18.66 | 2615 | 86.05 | 424 | 13.95 |
| 93. කෑගල්ල | 4004 | 1070 | 26.72 | 919 | 22.95 | 1119 | 27.95 | 563 | 14.06 | 3671 | 91.68 | 333 | 8.32 |
| 94. මාවනැල්ල | 2671 | 526 | 19.69 | 526 | 19.69 | 783 | 29.31 | 528 | 19.77 | 2363 | 88.47 | 308 | 11.53 |
| 95. දෙහිඕවිට | 2749 | 505 | 18.37 | 618 | 22.48 | 892 | 32.45 | 465 | 16.92 | 2480 | 90.21 | 269 | 9.79 |
| **සමස්ත දිවයින** | **210142** | **49507** | **23.56** | **44667** | **21.26** | **57629** | **27.42** | **35703** | **16.99** | **187506** | **89.23** | **22636** | **10.77** |

වගුව 4

1.2.5 ලකුණු ලබාගෙන ඇති ආකාරය - පන්ති ප්‍රාන්තර අනුව


| පන්ති ප්‍රාන්තරය | සංඛ්‍යාතය | සංඛ්‍යාත ප්‍රතිශතය | සමුච්චිත සංඛ්‍යාතය | සමුච්චිත සංඛ්‍යාත ප්‍රතිශතය |
|---|---|---|---|---|
| 91 - 100 | 257 | 0.11 | 235228 | 100.00 |
| 81 - 90 | 13987 | 5.95 | 234971 | 99.89 |
| 71 - 80 | 39377 | 16.74 | 220984 | 93.94 |
| 61 - 70 | 48011 | 20.41 | 181607 | 77.20 |
| 51 - 60 | 46943 | 19.96 | 133596 | 56.79 |
| 41 - 50 | 36310 | 15.44 | 86653 | 36.84 |
| 31 - 40 | 25752 | 10.95 | 50343 | 21.40 |
| 21 - 30 | 14966 | 6.36 | 24591 | 10.45 |
| 11 - 20 | 6966 | 2.96 | 9625 | 4.09 |
| 01 - 10 | 2656 | 1.13 | 2659 | 1.13 |
| 00 - 00 | 3 | 0.00 | 3 | 0.00 |

වගුව 5

ඉහත වගුවට අනුව සිංහල භාෂාව හා සාහිත්‍යය විෂයය සඳහා පෙනී සිටි අයදුම්කරුවන් 235228 අතුරෙන් 31 - 40 ප්‍රාන්තරය තුළ ලකුණු ලබාගත් සංඛ්‍යාව 25752 කි. එය ප්‍රතිශතයක් වශයෙන් 10.94% කි. ලකුණු 40 හෝ ඊට අඩුවෙන් ලබා ඇති සංඛ්‍යාව 50343 ක් වන අතර එය ප්‍රතිශතයක් වශයෙන් 21.40% කි.

### 1.3 විෂය සාධනය පිළිබඳ විශ්ලේෂණය


#### 1.3.1 I ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය




ප්‍රස්තාරය 1 (RD/16/05/OL පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරෙන් සකස් කරන ලදී.)

ඉහත ප්‍රස්තාරයට අනුව අයදුම්කරුවන් වැඩිම සංඛ්‍යාවක් නිවැරදිව පිළිතුරු සපයා ඇත්තේ අංක 2 ප්‍රශ්නයටයි. එහි ප්‍රතිශතය 91% කි. එමෙන්ම අයදුම්කරුවන් අඩුම සංඛ්‍යාවක් නිවැරදිව පිළිතුරු සපයා ඇත්තේ අංක 40 ප්‍රශ්නයටයි. එහි ප්‍රතිශතය 10% කි. 8 ප්‍රශ්නයෙහි සියලුම පිළිතුරු නිවැරදි සේ සලකා තිබුණි.


### 1.3.2 II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න තෝරාගෙන ඇති ආකාරය




මෙම ප්‍රශ්න පත්‍රයෙහි සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම අනිවාර්ය වේ. එහෙත් මෙම ප්‍රස්තාරයට අනුව, අංක 1 ප්‍රශ්නය සඳහා ප්‍රතිචාර දක්වා ඇති අයදුම්කරුවන්ගෙන් 99%ක් පිළිතුරු සපයා තිබූ අතර අඩුම සංඛ්‍යාවක් ප්‍රතිචාර දක්වා ඇති අංක 5 ප්‍රශ්නය සඳහා පිළිතුරු සපයා තිබුණේ අයදුම්කරුවන්ගෙන් 93%ක් පමණි.

ප්‍රස්තාරය 2 (RD/16/02/OL පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරෙන් සකස් කරන ලදි.)

### 1.3.3 II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය





අංක 1 ප්‍රශ්නය සඳහා වෙන් කර ඇති ලකුණු 20න්, මෙම ප්‍රස්තාරයට අනුව, 76% - 100% ප්‍රාන්තරයේ එනම් ලකුණු 16 සිට 20 තෙක් ලබා ගත් ප්‍රතිශතය 12% කි. එමෙන්ම වෙන් කර ඇති ලකුණු 20න් 0% - 25% ප්‍රාන්තරයෙහි එනම් ලකුණු 0 සිට 5 තෙක් ලබාගත් ප්‍රතිශතය 17% කි.

ප්‍රස්තාරය 3 (RD/16/04/OL පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරෙන් සකස් කරන

වඩාත් කැපී පෙනෙන ලෙස ඉහළ ලකුණු ප්‍රමාණයක් ලබාගැනීමට අයදුම්කරුවන්ට හැකිවී ඇත්තේ 4 වන ප්‍රශ්නය සඳහායි. එම ප්‍රශ්නය සඳහා හිමි මුළු ලකුණු 10න් ලකුණු 8ක් හෝ ඊට වැඩියෙන් හෝ ලබා ඇති අයදුම්කරුවන් ප්‍රතිශතය 79%ක් පමණ වේ. එනම් මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයූ අයදුම්කරුවන්ගෙන් හතරෙන් තුනකටත් වැඩි ප්‍රමාණයක්ම, ලකුණු 8ක් හෝ ඊට වැඩියෙන් හෝ ලබාගෙන ඇත.


## 1.3.4 II ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය




ප්‍රස්තාරය 4 (RD/16/04/OL පෝර්මයෙන් ලබාගත් තොරතුරු ඇසුරෙන් සකස් කරන ලදි.)

ඉහත ප්‍රස්තාරය අනුව, අංක 1 ප්‍රශ්නයෙහි II කොටසෙහි පහසුතාව 81%කි. වැඩිම පහසුතාව ඇත්තේ අංක II ප්‍රශ්නයටයි. එහි පහසුතාව 81%කි. එමෙන්ම අඩුම පහසුතාව ඇත්තේ අංක 1 ප්‍රශ්නයේ (iii) (ආ) අනුකොටසටයි. එහි පහසුතා 20%ක් පමණි.


1.3.5 III ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න තෝරාගෙන ඇති ආකාරය




මෙහි මුල් ප්‍රශ්න හතරට පිළිතුරු සැපයීම අනිවාර්ය වුවද මෙම ප්‍රස්තාරයට අනුව අංක 1 ප්‍රශ්නය සඳහා 99%ක්ද අංක 4 ප්‍රශ්නය සඳහා 85% ක්ද පිළිතුරු සපයා ඇත. අංක 5, 6, 7 අතුරෙන් එක් ප්‍රශ්නයකට පමණක් පිළිතුරු සැපයිය යුතු අතර අංක 5 ප්‍රශ්නය සඳහා 73%ක්ද, අංක 6 සහ අංක 7 ප්‍රශ්න සඳහා 9%ක්ද පිළිතුරු සපයා ඇත.

ප්‍රස්තාරය 5 (RD/16/02/OL පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරෙන් සකස් කරන ලදි.)

1.3.6 III ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය





අංක 1 ප්‍රශ්නය සඳහා වෙන් කර ඇති ලකුණු 20න්, මෙම ප්‍රස්තාරයට අනුව, 76% - 100% ප්‍රාන්තරයේහි එනම් ලකුණු 16 සිට 20 තෙක් ලබාගත් ප්‍රතිශතය 35% කි. එමෙන්ම වෙන් කර ඇති ලකුණු 20න් 0% - 25% ප්‍රාන්තරයෙහි එනම් ලකුණු 0 සිට 5 තෙක් ලබාගත් ප්‍රතිශතය 13% කි.

ප්‍රස්තාරය 6 (RD/16/04/OL පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදි.)

5, 6, 7 ප්‍රශ්න අතුරෙන් අයදුම්කරුවන්ට කැපී පෙනෙන ලෙස ඉහළ ලකුණු ප්‍රමාණයක් ලබාගැනීමට හැකිවී ඇත්තේ 5 වන ප්‍රශ්නය සඳහා ය. එම ප්‍රශ්නය සඳහා හිමි මුළු ලකුණු 10න්, ලකුණු 6ක් හෝ ඊට වැඩියෙන් ලබා ඇති ප්‍රතිශතය 70%ක් පමණ වේ. එනම් 5 වන ප්‍රශ්නයට පිළිතුරු සැපයූ අයදුම්කරුවන්ගෙන් හරි අඩකටත් වඩා ලකුණු 6 හෝ ඊට වැඩියෙන් ලබා ඇත.

### 1.3.6 III ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය




ප්‍රස්තාරය 7 (RD/16/04/OL පෝර්මයෙන් ලබාගත් තොරතුරු ඇසුරෙන් සකස් කරන ලදි.)

ඉහත ප්‍රස්තාරයට අනුව, වැඩිම පහසුතාව ඇත්තේ අංක 1 ප්‍රශ්නයෙහි (iii) (අ) අනුකොටසටය. එහි පහසුතාව 91%කි. එමෙන්ම අඩුම පහසුතාව ඇත්තේ අංක 1 ප්‍රශ්නයේ (v)(ආ) අනුකොටසටයි. එහි පහසුතාව 25%ක් පමණි.

II කොටස

## 2. ප්‍රශ්න හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

### ප්‍රශ්න පත්‍රවල ස්වභාවය

අ. පො. ස. (සා. පෙළ) විභාගයෙහි (21) සිංහල භාෂාව හා සාහිත්‍යය විෂයයෙහි ශිෂ්‍ය සාධනය ඇගයීම සඳහා ප්‍රශ්න පත්‍ර තුනක් ඉදිරිපත් කෙරේ. ඒවා අතුරින් I පත්‍රය සහ II පත්‍රය යන ප්‍රශ්න පත්‍ර දෙකම අපේක්ෂකයින්ට එක වර දෙනු ලබන අතර එම පත්‍ර දෙකම සඳහා නියමිත කාලය පැය තුනකි. සිංහල සාහිත්‍යය ආශ්‍රිත කුසලතා මැනීම සඳහා වෙනම දෙනු ලබන III පත්‍රය සඳහා නියමිත කාලය පැය දෙකකි.

**අවසාන ලකුණු ගණනය කිරීම**

| | | | | |
|---|---|---|---|---|
| I | පත්‍රය සඳහා | - | ලකුණු | 40 |
| II | පත්‍රය සඳහා | - | ලකුණු | 80 |
| III | පත්‍රය සඳහා | - | ලකුණු | 80 |
| | එකතුව | - | ලකුණු | 200 |

අවසාන ලකුණ - 200 ÷ 2 = 100

## 2.1 I ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

### 2.1.1. I ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය

* මුළු ලකුණු 40 කි.
* වරණ හතර බැගින් ඇති බහුවරණ ප්‍රශ්න 40 කින් සමන්විත වේ. එම එක් එක් ප්‍රශ්නයට දී ඇති (1), (2), (3) හා (4) වරණවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ වරණය තේරීම අපේක්ෂා කෙරේ.
* ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයීම අපේක්ෂිත ය.
* සිංහල භාෂාව හා සාහිත්‍යය විෂයය යටතේ,
  භාෂා කුසලතා,
  වියරණ භාවිතය පිළිබඳ කුසලතා,
  භාෂා සාහිත්‍යය පිළිබඳ කුසලතා සහ
  විශ්ලේෂණය හා අවබෝධය පිළිබඳ කුසලතා මැන බැලීමේ අරමුණින් මෙම බහුවරණ ප්‍රශ්න 40 සකස් කර ඇත.

2.1.2 **I ප්‍රශ්න පත්‍රය**

- අංක **1** සිට **3** තෙක් ප්‍රශ්නවල එක් එක් වාක්‍යයෙහි **තදකළු අකුරෙන්** මුද්‍රිත කොටසේ අර්ථයට **වඩාත් සමීප අර්ථය** දෙන වචනය තෝරන්න.

**1.** **උඩක් බිමක් නොබලා** වැඩ නොකරන්නැයි ගුරුතුමා තම ශිෂ්‍යයාට අවවාද කළේ ය.
(1) වැඩිහිටි අවවාද නොතකා (2) අනුන්ගේ උපදෙස්වලින් තොරව
(3) කිසිවක් සොයා නොබලා (4) වටපිට නොබලා

**2.** සුමල්, ප්‍රදේශයේ ප්‍රචලිත ව ඇත්තේ **අනුන්ට ගිනි දෙන** කෙනකු ලෙසිනි.
(1) විපත් ඇති කරන (2) මුදල් ලබා දෙන
(3) ගින්දර ලබා දෙන (4) උදවුපදවු කරන

**3.** පසුගිය කාලයේ සිදු වූ දේවල් නිසා ඔහුගේ **තටු කැඩී ඇති බව** ගම්වැසියෝ පැවසූහ.
(1) මනස විකෘත වී (2) දුප්පත් වී
(3) අසනීප උග්‍ර වී (4) බලය පිරිහී

- අංක **4** සිට **6** තෙක් ඇති ප්‍රශ්නවල හිස්තැන්වලට **වඩාත් සුදුසු** පදය තෝරන්න.

**4.** ලෝකප්‍රකට ක්‍රීඩිකාවක තමා අසල සිටිනු දුටු අමාලි ............................. පත් විය.
(1) වික්ෂිප්තභාවයට (2) සංකුලතාවට (3) සංවේදීභාවයට (4) සුරක්ෂිතතාවට

**5.** සාගරයේ රාත්‍රිය ගොඩබිමට වඩා ....................... ලෙසින් අලංකාර ය.
(1) අසදෘශ (2) පරිමිත (3) අපරිමිත (4) විස්මිත

**6.** මාර්ටින් වික්‍රමසිංහ සූරීන් සිංහල සාහිත්‍යයට කළ .................... සේවය පැසසිය යුතු ය.
(1) වන්දනීය (2) සම්භාවනීය (3) අභිභවනීය (4) අනභිභවනීය

**7.** අකාරාදි පිළිවෙළ **නිවැරදි ව** යෙදී ඇති පද පේළිය තෝරන්න.
(1) උෂ්ණත්වය, ඌෂ්මාක්ෂර, උල්ලංඝනය, උපදේශක
(2) කඩොලාන, කණ්ඩිය, කණිසම, කම්පනය
(3) ගාන්ධර්ව, ගිනිකොන, ගිම්හානය, ගුණධර්ම
(4) නිධානය, නිබන්ධනය, නැණසල, නේපථ්‍යාගාරය

**8.** සෑම පදයක ම අක්ෂර වින්‍යාසය **නිවැරදි ව** යෙදී ඇති පද පේළිය තෝරන්න.
(1) මධ්‍යස්ථානය, තාක්ෂනය, අළුත්වැඩියාව, පළපුරුද්ද
(2) කළමණාකරු, විශ්වසනීය, වාච්‍යාර්ථය, ජනශ්‍රැත්‍ය
(3) ශ්‍රේෂ්ඨ, පරිනාමය, පර්යේෂණ, අබිරුචිය
(4) අභිමත, සමීපස්ථ, පෙළපාලිය, ළයාන්විත

**9.** **අන්‍යාර්ථ සමාසයට** උදාහරණයක් වන්නේ,
(1) නැගෙනහිර ය. (2) පාපියුම් ය. (3) ඉම්හිරි ය. (4) කෑම්හානි ය.

**10.** 'ඔවුහු දරුවන්ගේ කෙළිසෙල්ලම් බලා සතුටු වූහ.' යන වාක්‍යයේ **කෙළිසෙල්ලම්** යනු,
(1) තද්ධිත පදයකි. (2) සර්වනාම පදයකි.
(3) යුගල පදයකි. (4) කෘදන්ත පදයකි.

**11.** **උක්ත නාමපද** පමණක් යෙදී ඇති වරණය තෝරන්න.
(1) ක්‍රීඩිකාවක, මිනිස්සු, ශිෂ්‍යයෝ, නුඹ (2) අපි, තරුණයෝ, ළමයෙක්, නිලධාරිහු
(3) මම, වනමෘගයෝ, ගායිකාවක, තරුණයෙක් (4) ගායකයෙක්, අපේක්ෂකයන්, ඇතැමෙක්, පියාණෝ

**12.** **උපසර්ගයක්** රහිත පදයක් ඇති වරණය තෝරන්න.
(1) නිෂ්ප්‍රභ, පරදේශ, අයැදුම්, නිදුක් (2) ප්‍රතිඵල, පරිභ්‍රමණය, අභිනික්මන, අධිභාරය
(3) අනුකම්පුව, අන්ධකාර, නිර්ලෝභී, විසම (4) අවප්‍රමාණය, සදහම්, සංවර්ධනය, ඉමහත්

**13.** "සම්පූර්ණයෙන් විනාශ කිරීම" යන්න සඳහා යෙදිය හැකි **තනි පදයක්** දැක්වෙන වරණය කුමක් ද?

(1) වියෝජනය (2) විසංයෝජනය

(3) විමංසනය (4) විධ්වංසනය

- අංක **14** සිට **16** තෙක් ප්‍රශ්නවල **තදකළු අකුරෙන්** මුද්‍රිත කොටසේ අර්ථය නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.

**14.** සීගිරි ගී ලියූවන් අතර **විදග්ධ** කවීන් සිටි බව කියැවේ.

(1) විදේශීය (2) විශේෂ (3) නිපුණ (4) ප්‍රසිද්ධ

**15.** **යථෝක්ත** කාරණය පිළිබඳ ව සැලකිලිමත් වන ලෙස නිලධාරියා තම සේවකයන්ට දැන්වී ය.

(1) දන්වන ලද (2) කීමට අපේක්ෂා කරන

(3) ඉහත කියන ලද (4) විශේෂයෙන් කියන ලද

**16.** හොඳ සාහිත්‍ය නිර්මාණයක් බිහිවීමට සාහිත්‍යකරුවා තුළ **ව්‍යුත්පත්තිය** ද තිබිය යුතු ය.

(1) උචිත අනුචිත දේ තෝරා ගැනීමේ හැකියාව (2) අලුත් දේ නිර්මාණය කිරීමේ හැකියාව

(3) නිරන්තරව කරන අභ්‍යාසය (4) අත්දැකීම් බහුල වීම

**17.** මුලින් දී ඇති ව්‍යාකරණ වර්ගයට අයත් **නො වන** පදයක් සහිත වරණය තෝරන්න.

(1) කෘදන්ත - නැටුම, ගයන්නේ, තොටිල්ල, පැවිල්ල

(2) සර්වනාම - අපි, එතුමා, ඔබ, ඔහු

(3) නිත්‍ය බහුවචන - ඇතැමෙක්, කෙනෙක්, අයෙක්, සමහරෙක්

(4) ක්‍රියා විශේෂණ - සෙමෙන්, වේගයෙන්, උවමනාවෙන්, අමාරුවෙන්

**18.** පූර්වස්වර ලෝප සන්ධියට උදාහරණයක් **නො වන** පදය තෝරන්න.

(1) දකුණත (2) මැදැගිල්ල (3) දැත (4) දිවැස

**19.** මුලින් දී ඇති පදයට සමානාර්ථයක් **නො දෙන** පදයක් ඇතුළත් වරණය තෝරන්න.

(1) ආලෝකය - අලු, ප්‍රභා, පහන්, කාන්ති (2) කැලෑව - වල, අරණ, ළන්ද, රුකුල

(3) පොකුණ - විල, තඩාග, සරසි, තළා (4) ප්‍රසිද්ධ - පසිඳු, විශද, පළ, ලකළ

**20.** **විරුද්ධාර්ථවත්** පද යුගලයක් **නො වන** වරණය තෝරන්න.

(1) ප්‍රපාතය – මස්තකය (2) සම්භාවනීය – නින්දනීය

(3) සංවෘත – ආවෘත (4) සාමූහික – ඒකල

**21.** **පූර්ව ක්‍රියාවක්** යෙදී ඇති වාක්‍යය තෝරන්න.

(1) හොඳින් පාඩම් කළහොත් විභාගය ජයගත හැකි වේවි.

(2) ක්‍රීඩකයා දුවද්දී ප්‍රේක්ෂකයෝ ඔල්වරසන් දුන්හ.

(3) ගායිකාව ගීයක් ගයමින් නර්තනයක යෙදුණා ය.

(4) මම පොත කියවා නිදාගත්තෙමි.

**22.** **වැරදි** අදහස සහිත වරණය තෝරන්න.

(1) වෛකල්පික යනු අනිවාර්ය යන පදයෙහි විරුද්ධාර්ථ පදයයි.

(2) නිපාත, වාක්‍යවල මැද පමණක් යෙදී අර්ථ ප්‍රකාශ කරයි.

(3) අසිරිමත් යන පදයේ මත් යනු තද්ධිත ප්‍රත්‍යයකි.

(4) කව්සිළුමිණ යනු සමාස පදයකි.

**23.** **ඌෂ්මාක්ෂර** පමණක් ඇතුළත් වන වරණය තෝරන්න.

(1) ක, ශ, ස, හ, ග (2) ච, ට, ප, ත, ද

(3) ෂ, ෆ, ස, ළ, ව (4) ශ, ෂ, ස, හ, ෆ

- අංක **24** සිට **26** තෙක් දී ඇති ප්‍රස්තාව පිරුළුවලට **වඩාත් ගැළපෙන** අදහස සහිත වරණය තෝරන්න.

**24.** ආඬි හත්දෙනාගේ කැඳ හැළිය වගේ

(1) සාමූහික ව එක් වී යම් කාර්යයක් කිරීම (2) අනුන් රැවටීමට ගොස් තමන් ම රැවටීම

(3) අර්ථ විරහිත කාර්යයක් සිදු කිරීම (4) උත්සාහය මගින් ජයග්‍රහණය ලැබීම

**25.** නැග්ග ඉනිමගට පයින් ගැසුවා වගේ

(1) උපකාර ලබාගත් පසු උපකාර කළ තැනැත්තා අමතක කිරීම
(2) උපකාර කළ පසු ප්‍රත්‍යුපකාර අපේක්ෂා නොකිරීම
(3) ධනවත් වූ පසු දුප්පත් මිනිසුන් අමතක කිරීම
(4) ඉහළ නිලතලවලට පත් වූ පසු අනෙක් අයට නොසැලකීම

**26.** ඇටිකෙහෙල් කෑ උගුඩුවා වගේ

(1) තමන් කළ වරද තමන්ට ම දැනීම
(2) නොදන්නා දේ කිරීමට ගොස් අමාරුවේ වැටීම
(3) තමන් කළ වැඩ ගැන පසුතැවීමට පත් වීම
(4) දැන දැන ම වැරදි කර තමන් ම විඳ වීම

- අංක **27** සිට **29** තෙක් ප්‍රශ්නවල **ව්‍යාකරණානුකූලව නිවැරදි වාක්‍යය** තෝරන්න.

**27.**
(1) අපි දක්ෂ දරුවන් වෙමු.
(2) අප දක්ෂ දරුවෝ වෙමු.
(3) අපි දක්ෂ දරුවෝ වෙමු.
(4) අප දක්ෂ දරුවන් වෙමු.

**28.**
(1) දෙමාපියන් සියල්ලෝ ම රැස්වීමට සහභාගි වෙති.
(2) දෙමාපියන් සියල්ලන් ම රැස්වීමට සහභාගි වෙති.
(3) දෙමාපියෝ සියල්ලන් ම රැස්වීමට සහභාගි වෙති.
(4) දෙමාපියෝ සියල්ලෝ ම රැස්වීමට සහභාගි වෙති.

**29.**
(1) ගුරුවරු ළමයි කැටුව චාරිකාව ගියහ.
(2) ගුරුවරුන් ළමයි කැටුව චාරිකාව ගියහ.
(3) ගුරුවරු ළමයින් කැටුව චාරිකාව ගියහ.
(4) ගුරුවරුන් ළමයින් කැටුව චාරිකාව ගියහ.

**30.** පහත දැක්වෙන වාක්‍යය ලේඛන ව්‍යවහාරයට හැරවූ විට **වඩාත් නිවැරදි** ලෙස ලැබෙන වාක්‍යය තෝරන්න.

"අපි කතා කළා ම සමහර අය හිනා වුණා"

(1) අප කතා කළ විට සමහරු සිනාසුණහ.
(2) අපි කතා කළ විට සමහරෙක් සිනාසුණේ ය.
(3) අපි කතා කළ විට සමහරුන් සිනාසුණහ.
(4) අප කතා කළ විට සමහරුන් සිනාසුණහ.

**31.** පහත සඳහන් කවියේ **තදකළ** අකුරෙන් මුද්‍රිත පද සඳහා යෙදෙන අර්ථ පිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.

මෙ නිරිඳුගෙ දූ ළඳ
උලකුඩය දේවී **සඳ**
සොමි ගුණෙනි පුන් **සඳ**
පවති සිරි **සඳ** සිරින් ඇම **සඳ**

(1) කාන්තාව, චන්ද්‍රයා, උතුම්, කල්හි
(2) කල්හි, උතුම්, චන්ද්‍රයා, කාන්තාව
(3) උතුම්, චන්ද්‍රයා, කාන්තාව, කල්හි
(4) කාන්තාව, උතුම්, චන්ද්‍රයා, කල්හි

**32.** රූපකයක් සහිත වරණය තෝරන්න.

(1) පාළොස්වක සඳ පායනු වැන්නේ
(2) දුනුකෙයියා මලක් වගේ දුරට පෙනෙනවා
(3) වී පැදුරෙන් ඉගිලී යන කුරුල්ලකු ලෙසින්
(4) අම්මා සඳකි මම ඒ ලොව හිරුය රිදී

- අංක **33** සහ **34** යන ප්‍රශ්නවල මුලින් ඉදිරිපත් කර ඇති පාඨ සඳහා **වඩාත් සමීප අර්ථය** දෙන වරණය තෝරන්න.

**33.** වැව මුල් කරගත් ජලාශ්‍රයකට විපතක් සිදු වේ නම් එය රටවැසි සියල්ලන්ට ම සිදු වන විපතක් වශයෙන් දූරාතීතයේ සිට ම සැලකිණි.

(1) ජල සම්පතට සිදු වන විපත් රටට ම සිදු වන විපතක් ලෙස අතීත කාලයේ දී සැලකිණි.
(2) වැවකට සිදු වන විපතක් රටවැසියන්ට සිදු වන විපතක් ලෙස සලකන්නට අතීත වැසියෝ පුරුදු වූහ.
(3) වැව මූලික කරගත් ජල සම්පතට විපත් සිදු වීම රටවාසින්ට සිදු වූ විපතක් වශයෙන් අතීතයේ පටන් ම සැලකී ය.
(4) වැව මූලික කරගත් ජල සම්පතට හානි සිදු වීම රටට ම වූ හානියක් බව අතීත කාලයේ දී සැලකිණි.

34. මුල් වකවානුවේ සිට හත්වැනි සියවස තෙක් ලියැවී තිබෙන සෙල්ලිපි එක් ගණයකටත් එතැන් සිට ලියැවී ඇති සෙල්ලිපි තවත් ගණයකටත් ඒවායේ භාෂා ලක්ෂණ අනුව වෙන් කළ හැකි ය.
(1) සෙල්ලිපි වර්ගීකරණයකට ලක් කළ හැකි අතර එහි දී ඒවායේ භාෂා ලක්ෂණ සැලකිල්ලට ගැනේ.
(2) ලියැවුණු කාලය අනුව සෙල්ලිපි කොටස් දෙකකට වෙන් කළ හැකි අතර එහි දී සැලකිල්ලට ගෙන ඇත්තේ ඒවායේ භාෂා ලක්ෂණයි.
(3) සෙල්ලිපි ලියැවී ඇති කාලය අනුව භාෂා ලක්ෂණ දක්නට ලැබෙන අතර ඒවා කොටස් දෙකකට වර්ග කර ඇත.
(4) සෙල්ලිපි ලියැවී ඇති භාෂාවේ ස්වරූපය අනුව ඒවා වර්ග දෙකකට වෙන් කිරීමට හැකියාව ඇත.

35. බ්‍රාහ්මී සෙල්ලිපිවල 'නාඩීර' යනුවෙන් සඳහන් කර ඇත්තේ,
(1) පොල් ය. (2) පුවක් ය. (3) තල් ය. (4) කොස් ය.

36. පහත සඳහන් ජනකවියේ හතරවැනි පදය දී ඇති වරණ අතුරෙන් තෝරන්න.
"සිටිති පෙළින් පෙළ රන්තරු විලසට
ගනිති එරන් කැති දහසක් එමවිට
දමති එරන් කැති මාරුව අහසට
............................................"

(1) නළා පිඹිති දෙපසේ බෙර නදකොට
(2) වලා යටින් සඳ පෑයූ විලසට
(3) බලා සිටිති රජු ඇවිදින් එතනට
(4) කපති ගොයම් අඟනෝ බැස කුඹුරට

37. "වෙසක් කැකුළු අතු අග හිඳ නටන විලාසේ
ඉරෙත් හඳෙත් සිරි විඳ විඳ රඟන විලාසේ"
'රේඛාව' චිත්‍රපටය සඳහා නිර්මාණය කරන ලද ඉහත සඳහන් පද ඇතුළත් ගීතයේ පද රචකයා,
(1) ලූෂන් බුලත්සිංහල මහතා ය. (2) ගරු මර්සලින් ජයකොඩි පියතුමා ය.
(3) මහගම සේකර මහතා ය. (4) සුනිල් දයානන්ද කෝණාර මහතා ය.

38. පහත සඳහන් පද්‍යාර්ථයෙහි අර්ථය නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.
"සොඳුරු තුරුණු සියපත් සිය රස් වතුර
ඉඳුරු දෙසින් වැද නුබ ගඟ එත පැතිර"
(1) සුන්දර වූ තරුණ සූර්යයාගේ රශ්මිය නමැති ජලය නැගෙනහිර දිශාවෙන් ආකාශ ගංගාවට වැදී පැතිරෙන කල්හි
(2) සුන්දර වූ තරුණ සූර්යයාගේ රශ්මිය නමැති වතුර දිව්‍ය ලෝකය දෙසින් ආකාශ ගංගාව කරා පැතිර ගොස්
(3) සුන්දර වූ තරුණ නෙළුම් මල් සිය රශ්මි නම් ජලය නැගෙනහිර දිශාවෙන් විහිදුවා ආකාශ ගංගාව කරා පැතිර ගොස්
(4) සුන්දර වූ තරුණ නෙළුම් මල්වල පෙති ජලය මත පා කර දිව්‍ය ලෝකය දෙසින් ආකාශය කරා පැතිර යද්දී

39. "ලෝ දහමින් වැදෙනා රළු පහරින්
ගත සිත රිදෙනා කල නිතියෙන්
නැත ලොවේ අන් රසඳුනා
ආදරේ සේ සුව දෙනා"
යන ගී ඛණ්ඩය ඇතුළත් වන්නේ,
(1) මනමෙ නාට්‍යයේ ය. (2) සිංහබාහු නාට්‍යයේ ය.
(3) වෙස්සන්තර නාට්‍යයේ ය. (4) නරිබෑනා නාට්‍යයේ ය.

40. වැවක් ජලයෙන් පිරීගොස් වාන් දමන අවස්ථාවේ වැවේ ජල පහර චණ්ඩ වන අතර එයින් වැවට සිදු වන විනාශය වළක්වා ගැනීමේ අරමුණින් වැවට අධිපති දෙවියන්ට බාර වී සිදු කරන පූජාව හැඳින්වෙන්නේ,
(1) මුට්ටි නැම්ල්ල නමිනි. (2) නානුමුරය නමිනි.
(3) නිහර වී පූජාව නමිනි. (4) වැවේ රාජකාරිය නමිනි.


**

## 2.1.3 I පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය


| ප්‍රශ්න අංකය | පිළිතුර | ප්‍රශ්න අංකය | පිළිතුර |
|---|---|---|---|
| 01. | ...3.... | 21. | ...4.... |
| 02. | ..1.... | 22. | ...2.... |
| 03. | ...4.... | 23. | ...4.... |
| 04. | ...1.... | 24. | ...2.... |
| 05. | ...3.... | 25. | ...1.... |
| 06. | ...4.... | 26. | ...4.... |
| 07. | ...3.... | 27. | ...3.... |
| 08. | ..සියල්ලම... | 28. | ...4.... |
| 09. | ...1.... | 29. | ...3.... |
| 10. | ...3.... | 30. | ...1.... |
| 11. | ...2.... | 31. | ...3... |
| 12. | ...3.... | 32. | ...4.... |
| 13. | ...4.... | 33. | ...3.... |
| 14. | ...3.... | 34. | ...2.... |
| 15. | ...3.... | 35. | ...1.... |
| 16. | ...1.... | 36. | ...4.... |
| 17. | ...1.... | 37. | ...2.... |
| 18. | ...3.... | 38. | ...1.... |
| 19. | ...4.... | 39. | ...2.... |
| 20. | ...3.... | 40. | ...3.... |

නිවැරදි එක් පිළිතුරකට ලකුණු 01 බැගින් මුළු ලකුණු 40කි.

## 2.1.4 I ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ (තේමා අනුව)




| තේමාව | පහසුතාව වැඩිම ප්‍රශ්නය හා එහි පහසුතාව | පහසුතාව අඩුම ප්‍රශ්නය හා එහි පහසුතාව |
|---|---|---|
| භාෂා කුසලතා | 2 (91%) | 20 (19%) |
| ව්‍යාකරණ | 23 (84%) | 28 (27%) |
| භාෂා සාහිත්‍යය | – | – |
| විශ්ලේෂණය හා අවබෝධය | 36 (87%) | 40 (10%) |




I ප්‍රශ්න පත්‍රය සැකසීමේදී පදනම් කරගනු ලැබූ තේමා හතර අතුරින්, එක් එක් තේමාවට අයත් ප්‍රශ්නවල පහසුතා සලකා, එම එක් එක් තේමාවෙහි මධ්‍යක පහසුතාව මෙම ප්‍රස්තාරයෙහි නිරූපණය කර ඇත. ඒ අනුව එම තේමා අතුරෙන් පහසුතාව වැඩිම ප්‍රශ්නය භාෂා කුසලතාව තේමාව යටතේ වන අතර එහි පහසුතාව 91% කි. පහසුතාව අඩුම ප්‍රශ්නය වන්නේ විශ්ලේෂණය හා අවබෝධය යටතේ ඇති 40 ප්‍රශ්නයයි. එහි පහසුතාව 10% කි.

සමස්ත වශයෙන් I ප්‍රශ්න පත්‍රයෙහි මධ්‍යක පහසුතාව 52%කි.

### 2.1.5 I ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්නවල වරණ තෝරා ඇති ආකාරය (ප්‍රතිශත ලෙස) (සිංහල)

| ප්‍රශ්න අංකය | නිවැරදි වරණය | එක් එක් වරණය තේරූ ශිෂ්‍ය ප්‍රතිශතය | | | |
|---|---|---|---|---|---|
| | | පළමුවන වරණය | දෙවන වරණය | තෙවන වරණය | සිවුවන වරණය |
| 1 | 3 | 2% | 4% | 80% | 14% |
| 2 | 1 | 91% | 6% | 2% | 1% |
| 3 | 4 | 8% | 15% | 5% | 72% |
| 4 | 1 | 77% | 9% | 11% | 2% |
| 5 | 3 | 7% | 2% | 35% | 56% |
| 6 | 4 | 3% | 27% | 11% | 59% |
| 7 | 3 | 16% | 43% | 29% | 12% |
| 8 | සියල්ලම | 15% | 39% | 16% | 31% |
| 9 | 1 | 35% | 35% | 20% | 9% |
| 10 | 3 | 16% | 11% | 55% | 19% |
| 11 | 2 | 15% | 43% | 13% | 28% |
| 12 | 3 | 14% | 20% | 46% | 19% |
| 13 | 4 | 43% | 24% | 11% | 21% |
| 14 | 3 | 28% | 13% | 30% | 29% |
| 15 | 3 | 24% | 13% | 33% | 30% |
| 16 | 1 | 40% | 40% | 5% | 15% |
| 17 | 1 | 63% | 18% | 11% | 8% |
| 18 | 3 | 13% | 15% | 46% | 26% |
| 19 | 4 | 14% | 15% | 33% | 38% |
| 20 | 3 | 40% | 23% | 19% | 17% |
| 21 | 4 | 19% | 15% | 16% | 50% |
| 22 | 2 | 25% | 45% | 13% | 17% |
| 23 | 4 | 4% | 5% | 7% | 84% |
| 24 | 2 | 10% | 67% | 20% | 2% |
| 25 | 1 | 82% | 5% | 5% | 7% |
| 26 | 4 | 9% | 33% | 14% | 43% |
| 27 | 3 | 32% | 5% | 57% | 5% |
| 28 | 4 | 29% | 15% | 29% | 27% |
| 29 | 3 | 8% | 23% | 50% | 19% |
| 30 | 1 | 31% | 17% | 32% | 20% |
| 31 | 3 | 48% | 5% | 28% | 18% |
| 32 | 4 | 8% | 14% | 14% | 64% |
| 33 | 3 | 8% | 8% | 69% | 15% |
| 34 | 2 | 8% | 58% | 17% | 17% |
| 35 | 1 | 46% | 24% | 23% | 7% |
| 36 | 4 | 2% | 7% | 4% | 87% |
| 37 | 2 | 14% | 47% | 26% | 13% |
| 38 | 1 | 11% | 11% | 63% | 16% |
| 39 | 2 | 31% | 41% | 16% | 12% |
| 40 | 3 | 30% | 36% | 10% | 24% |

## 2.1.6 සිංහල භාෂාව හා සාහිත්‍යය I පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා යෝජනා

බහුවරණ ප්‍රශ්න හතළිහකින් සමන්විත මෙම ප්‍රශ්න පත්‍රය මගින් සිංහල භාෂාව හා සාහිත්‍යය පිළිබඳ ව අයදුම්කරුවන් සතු නිරවුල් දැනුම, අවබෝධය, ස්මරණ හැකියාව, භාෂා පරිචය හා භාවිතය යන කුසලතා මැන බැලීම හා ඇගයීම අපේක්ෂිතය.

මෙම බහුවරණ ප්‍රශ්න හතළිහටම ඒ සඳහා විශේෂයෙන් සැකසුණු ආකෘතියක පිළිතුරු සැපයීම අනිවාර්ය වේ. සිංහල භාෂාව හා සාහිත්‍යය I හා II පත්‍ර දෙකටම හිමි පැය තුනක කාලයෙන් නිශ්චිත කොටසක් මෙම I පත්‍රයේ ප්‍රශ්න හතළිහට පිළිතුරු සැපයීම සඳහා වෙන් කර නොමැති වුවත්, සාමාන්‍යයෙන් පැය එකක කාලයක් ඒ සඳහා යෙදවීම ප්‍රමාණවත් යැයි අපේක්ෂා කෙරේ.

අංක 8 පිටුවෙහි ප්‍රස්තාරයෙහි දැක්වෙන තොරතුරුවලට අනුව එම ප්‍රශ්න 40 අතුරෙන් අංක 1, 2, 4, 23, 25, 36 යන ප්‍රශ්නවල පහසුතාව 75% ඉක්මවා ඇත. එනම් මෙම පත්‍රයට පිළිතුරු සැපයූ අයදුම්කරුවන්ගෙන් 75%කට වඩා වැඩි පිරිසකට මෙම ප්‍රශ්නවලට නිවැරදිව පිළිතුරු සැපයීමට හැකි වී තිබේ. එබැවින් එකී ප්‍රශ්න පහසුතම ප්‍රශ්න ලෙස සැලකිය හැකි වෙයි. එම ප්‍රශ්න අතුරෙන් අංක 2 ප්‍රශ්නය වඩාත්ම පහසු ප්‍රශ්නය වී ඇති අතර එහි පහසුතාව 91%ක් වේ.

අංක 3, 6, 10, 17, 21, 24, 27, 29, 32, 33, 34 යන ප්‍රශ්නවල පහසුතා 50%-75% අතර ප්‍රාන්තරයට අයත් වේ. අනෙකුත් ප්‍රශ්නවලට සාපේක්ෂව මෙම ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සිසුනට පහසු වී ඇති බව අනාවරණය වේ.

අංක 5, 9, 11, 12, 14, 15, 16, 18, 19, 22, 26, 30, 35, 37, 39 යන ප්‍රශ්නවල පහසුතා 30%-50% අතර ප්‍රාන්තරයට අයත් වේ.

අංක 8 ප්‍රශ්නයෙහි පහසුතාව 100%ක් වී ඇත්තේ එම ප්‍රශ්නය සඳහා නිවැරදි පිළිතුරක් නොමැති වීම නිසාය.

අංක 7, 13, 20, 28, 31, 38, 40 යන ප්‍රශ්නවල පහසුතා 30%ට වඩා අඩුවන බැවින් එම ප්‍රශ්න බොහෝ අයදුම්කරුවන්ට නිවැරදිව පිළිතුරු සැපයීමට දුෂ්කර වූ ප්‍රශ්න ලෙස සැලකිය හැකිය. එයින් වඩාත්ම දුෂ්කර වී ඇති ප්‍රශ්නය වන්නේ 40 ප්‍රශ්නයයි. එහි පහසුතාව 10%ක් වේ.

සිංහල භාෂාව හා සාහිත්‍යය I ප්‍රශ්න පත්‍රයෙහි අඩංගු බහුවරණ ප්‍රශ්න හතළිහ පහත සඳහන් පරිදි ප්‍රධාන තේමා හතරක් යටතේ වර්ගීකරණය කළ හැකි වෙයි.

1. භාෂා කුසලතා - 1, 2, 3, 4, 5, 6, 13, 14, 15, 16, 19, 20, 22, 24,25, 26, 31, 35
2. ව්‍යාකරණ - 7, 8, 9, 10, 11, 12, 17, 18, 21, 23, 27, 28, 29, 30
3. භාෂා සාහිත්‍යය - 32
4. විශ්ලේෂණය හා අවබෝධය - 33, 34, 36, 37, 38, 39, 40

**භාෂා කුසලතා**

මෙම ප්‍රශ්න පත්‍රයෙහි අඩංගු බහුවරණ ප්‍රශ්න 40 අතුරෙන් ප්‍රශ්න 18ක්ම ඉදිරිපත් කර තිබුණේ භාෂා කුසලතා තේමාවෙනි. I පත්‍රයට හිමි ලකුණුවලින් 45%ක් මේ සඳහා වෙන් කෙරෙන සේ තේමා අතර බර තබා ඇත. බහුවරණ ප්‍රශ්න 40 අතුරෙන් පහසුතම ප්‍රශ්නය අංක 2 වන අතර එය භාෂා කුසලතා තේමාවට අයත් වේ. එහි පහසුතාව 91%කි.

මෙම තේමාවට අයත් අංක 01, 02, 25 යන ප්‍රශ්නවල පහසුතා පිළිවෙළින් 80%, 91%, 82% වේ. ඒ අනුව වඩාත් පහසු ප්‍රශ්න තුනක් ඇතුළත් වී ඇත්තේ භාෂා කුසලතා තේමාවෙනි. ඒ සෑම ප්‍රශ්නයකම පහසුතාව 80% ඉක්මවා ඇත.

මෙම තේමාවට අයත් ප්‍රශ්න අතුරෙන් දුෂ්කර ප්‍රශ්න බවට පත්ව ඇත්තේ අංක 13, 14, 20, 30, 31 වේ. ඒවායේ පහසුතා පිළිවෙළින් 21%, 30%, 19%, 31%, 28% වේ.

භාෂා කුසලතා තේමාව යටතේ ඇති ප්‍රශ්න අතුරෙන් අංක 20 ප්‍රශ්නය සඳහා අයදුම්කරුවන්ගේ පිළිතුරු වඩාත් අසාර්ථක වී ඇත. එම ප්‍රශ්නය සඳහා නිවැරදි පිළිතුර අයත් තෙවන වරණය තෝරා ඇත්තේ අයදුම්කරුවන් 19%ක් පමණි. අයදුම්කරුවන් 23%ක් දෙවැනි වරණය ද, 40%ක් පළමුවන වරණය ද, 17%ක් සිවුවැනි වරණය ද පිළිතුරු ලෙස තෝරා ඇත.

මෙහි අංක 20 ප්‍රශ්නය යටතේ විරුද්ධාර්ථවත් පද නොවන වරණය තෝරා ගැනීම අපේක්ෂිත වුවද දී ඇති පදවල අර්ථ පිළිබඳ ව නිවැරදි අවබෝධයක් සිසුන් තුළ නොමැති බව පෙනී යයි. සංවෘත හා ආවෘත යන පද එකිනෙකට විරුද්ධාර්ථ පද ලෙස තෝරා ගැනීමට හේතු වී ඇත්තේ "ආවෘත" යන පදයේ අර්ථය සංවෘත යන පදයට සමානාර්ථයක් ලෙස සිසුන් තුළ වැරදි අවබෝධයක් තිබීම විය හැකිය.

අනතුරුව අඩු පහසුතා මට්ටමක් පෙන්නුම් කරන්නේ අංක 13 ප්‍රශ්නයයි. ඒ සඳහා නිවැරදි පිළිතුර අයත් වන්නේ සිවුවන වන වරණයට වන නමුදු නිවැරදි පිළිතුර සපයා ඇත්තේ අයදුම්කරුවන්ගෙන් 21%ක් පමණි. අයදුම්කරුවන්ගෙන් 43%ක්ම පළමුවන වරණයට නිවැරදි පිළිතුර සේ සලකා ඇත. මෙම ප්‍රශ්නය සඳහා නිවැරදි පිළිතුර තේරීමට නොහැකි වී ඇත්තේ නියමිත පෙළපොත් පරිශීලනය නොකිරීම මෙන්ම බාහිර පොත පත පරිශීලනයෙන් ඈත්වීම ද නිසා විය යුතුය. භාෂාවක් අධ්‍යයනය කිරීමේදී නිවැරදි ව භාෂාව භාවිත කරමින් ලියන ලද පොත් පත් සඟරා ආදී ලේඛන සැලකිල්ලෙන් පරිහරණය කරමින් තම වාක් කෝෂය පුළුල් කර ගැනීමට සිසුන් යොමු විය යුතුය.

මෙම ප්‍රශ්න 18හිම පහසුතා සලකා මධ්‍යක පහසුතාව (Average Facility) ගණනය කළ විට භාෂා කුසලතා තේමාවේ සමස්ත පහසුතාව 50%කි.

**ව්‍යාකරණ**

සිංහල භාෂාව හා සාහිත්‍යය I පත්‍රයෙහි ව්‍යාකරණ තේමාව යටතේ බහුවරණ ප්‍රශ්න 14ක් අඩංගු වූ අතර, මෙම ප්‍රශ්න පත්‍රයට හිමි ලකුණුවලින් 35%ක් එම තේමාවට වෙන් වී තිබුණි.

ව්‍යාකරණ තේමාවට අයත් ප්‍රශ්න 14 අතුරෙන් වැඩිම පහසුතාව ඇත්තේ 23 වැනි ප්‍රශ්නයටයි. එහි පහසුතාව 84%කි. මෙම තේමාව යටතේ ඇති පහසු ප්‍රශ්න ලෙස සැලකිය හැකි අංක 17, 27, 10 ප්‍රශ්නවල පහසුතා පිළිවෙළින් 63%, 57%, 55% වේ.

ව්‍යාකරණ තේමාව යටතේ අයදුම්කරුවන්ට දුෂ්කරම ප්‍රශ්නය වී ඇත්තේ 28 වන ප්‍රශ්නයයි. එහි පහසුතාව 27%ක් පමණි. මෙම ප්‍රශ්නයෙහි නිවැරදි පිළිතුර අයත් වන්නේ සිවුවන වරණයට වුවත් එය තෝරා ඇත්තේ අයදුම්කරුවන්ගෙන් 27%ක් පමණක් වන අතර, අයදුම්කරුවන්ගෙන් 29%ක් පළමුවන වරණයද, 29%ක් තෙවන වරණයද, 15%ක් දෙවන වරණය ද තෝරා ඇත.

සරල වියරණ රීති පිළිබඳව අයදුම්කරුවන් තුළ ඇති අනවබෝධය මෙහිදී කැපී පෙනේ. එමෙන්ම උක්තාඛ්‍යාත පද සම්බන්ධය පිළිබඳ ව නිශ්චිත අවබෝධයක් නොතිබීම මෙම ප්‍රශ්නයට නිවැරදි පිළිතුර තේරීමට නො හැකිවීම කෙරෙහි වැඩි බලපෑමක් කර ඇති බව පැහැදිලි ය.

7 වන ප්‍රශ්නය අකාරාදි පිළිවෙළ නිවැරදි ව යෙදී ඇති ආකාරය තේරීමේ ප්‍රශ්නයක් වන අතර නිවැරදි පිළිතුර වන තෙවැන්න තෝරා ඇත්තේ අයැදුම්කරුවන්ගෙන් 29%ක් පමණි. අක්ෂරමාලාව පිළිබඳ ව ප්‍රමාණවත් අවබෝධයක් ඇති කිරීමට පන්ති කාමරය තුළ වැඩි අවධානයක් යොමු කළ යුතුය.

එමෙන්ම අංක 09, 30 ප්‍රශ්න ද අයදුම්කරුවන්ට දුෂ්කර වී ඇති බව සැලකිය හැකි ය. ඒවායේ පහසුතා පිළිවෙළින් 35% හා 31% වේ. 08 වන ප්‍රශ්නය අක්ෂර වින්‍යාසය යටතේ සකස් වී ඇති අතර සෑම පදයකම අක්ෂර වින්‍යාසය නිවැරදි ව යෙදී ඇති පද පේළිය විමසා තිබුණද සියලුම පිළිතුරුවල අක්ෂර වින්‍යාසය වැරදි වචන පමණක් යොදා ඇති බැවින් නිවැරදි පිළිතුර තෝරා ගැනීමේදී අයදුම්කරුවන් අපහසුතාවකට ලක් වී ඇති බව පෙනේ. එබැවින් අයදුම්කරුවන්ගේ පිළිතුරු පිළිවෙළින් 15%, 39%, 16%, 31% ලෙස අංක 01-04 දක්වා වරණ අතර විසිරී පවතී.

30 ප්‍රශ්නය සකස් වී ඇත්තේ කටවහරින් දී ඇති වාක්‍යයක් ලිඛිත වහරට හැරවීමේදී නිවැරදි වාක්‍යය තේරීමටය. එම ප්‍රශ්නය සඳහා නිවැරදි පිළිතුර වූ පළමුවන වරණය අයදුම්කරුවන්ගෙන් 31%ක් තෝරා ගෙන ඇති අතර, දෙවන වරණය 17%ක් ද තුන්වන වරණය 32%ක් ද හතර වන වරණය 20%ක් ද තෝරා ගෙන ඇත.

අංක 9, 28, 30 වැරදි වරණය තෝරාගත් අයදුම්කරුවන් ප්‍රමාණය මෙහිදී පිළිවෙළින් 64%, 73%, 69%ක් වේ. වෙනත් වරණ තෝරා ගැනීමෙන් අනාවරණය වන්නේ අයදුම්කරුවන්ගේ අනවබෝධයයි.

මේ නිසා අයදුම්කරුවන් දක්වා ඇති ප්‍රතිචාර පිළිබඳ ව අවධානය යොමු කිරීමේදී සරල වියරණ විදි පිළිබඳව ද අයදුම්කරුන්ගේ දැනුම ප්‍රමාණවත් නොවන බව අනාවරණ වන නිසා ඔවුන්ට ඒ පිළිබඳ අවබෝධයක් ලබා දීම වැදගත් බව තහවුරු වෙයි.

**භාෂා සාහිත්‍යය**

සිංහල භාෂාව හා සාහිත්‍යය I පත්‍රයේ භාෂා සාහිත්‍යය තේමාව ඇසුරෙන් සකස් වී ඇත්තේ 32 වන ප්‍රශ්නය පමණි. රූපක මූලික කරගත් ප්‍රශ්නයක් වූ එහි පහසුතාව 64%කි. ඉතිරි අයදුම්කරුවන් 36%කගේ ප්‍රතිචාර අනෙකුත් වරණ තුන අතර විසිරී ඇති බව පෙනේ. මෙම ප්‍රශ්න පත්‍රයට හිමි ලකුණුවලින් 2.5% ක් මෙම තේමාවට වෙන් වී තිබුණි.

අයදුම්කරුවන්ගෙන් 64%ක් මෙම ප්‍රශ්නයට නිවැරදි ව පිළිතුරු සැපයීමෙන් අනාවරණය වන්නේ අයදුම්කරුවන්ගෙන් අඩකට වැඩි ප්‍රමාණයක් නිවැරදි පිළිතුර තෝරා ගැනීමට සමත්ව ඇති බවය.

**විශ්ලේෂණය හා අවබෝධය**

සිංහල භාෂාව හා සාහිත්‍යය I පත්‍රයෙහි විශ්ලේෂණය හා අවබෝධය තේමාව යටතේ අංක 33, 34, 35, 36, 37, 38, 39, 40 යන ප්‍රශ්න 7 අඩංගු වී තිබුණි. I පත්‍රයට හිමි ලකුණුවලින් මෙම තේමාව සඳහා 17.5%ක බර තැබීමක් සිදුකර ඇත. මෙම තේමාවට අයත් ප්‍රශ්න අතුරෙන් වැඩිම පහසුතාව 36 වන ප්‍රශ්නයට හිමිවී ඇති අතර එහි පහසුතාව 87%කි. මෙම තේමාව යටතේ ඇති දුෂ්කරම ප්‍රශ්නය ලෙස අංක 40 සැලකිය හැකිය. එම ප්‍රශ්නයේ පහසුතා 10%කි. මෙම ප්‍රශ්නයෙහි නිවැරදි පිළිතුර වන තෙවන වරණය තෝරාගත් අයදුම්කරුවන් ප්‍රමාණය 10%කි. 90%ක ප්‍රමාණයක් වෙනත් වරණ තෝරා ඇත.

38 වන ප්‍රශ්නයට නිවැරදි පිළිතුර පළමුවන වරණයෙහි ඇතුළත් වුවද අයදුම්කරුවන්ගෙන් 63%ක්ම නිවැරදි වරණය ලෙස තෝරා තිබුණේ තෙවැනි වරණයයි. එම වරණ දෙක යටතේ දී ඇති වාක්‍ය දෙකෙහිම අදහස් තරමක් දුරට සමාන බවක් පෙන්නුම් කරයි. මෙහි දී අයදුම්කරුවන්, දී ඇති පදාර්ථයෙහි අර්ථය නිවැරදි ව අවබෝධ කර ගැනීමට අපොහොසත් ව ඇති බව පෙනේ.

අංක 34, 37, 39 ප්‍රශ්නවලට ද නිවැරදි පිළිතුරු සැපයීමට අයදුම්කරුවන්ගෙන් වැඩි පිරිසක් අපොහොසත්ව ඇත. මෙහි දී පිළිවෙළින් 42%, 53%, 59% තරම් ප්‍රමාණයක අයදුම්කරුවන් වෙනත් වරණ තෝරා ගැනීමෙන් අනාවරණය වන්නේ අයදුම්කරුවන්ගේ අනවබෝධයයි. මෙම ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී පෙළ පොත අධ්‍යයනය කිරීමෙන් ලබන දැනුම හා අවබෝධය මහත් සේ ඵලදායි වන නමුත් එම අවබෝධය නොමැති වීම නිසා අයදුම්කරුවන්ගෙන් වැඩි ප්‍රමාණයක් වැරදි පිළිතුර අඩංගු වරණ තෝරා ගත් බව පෙනේ.

අංක 34, 37, 38, 39, 40 යන ප්‍රශ්නවල නිවැරදි පිළිතුරු අඩංගු වරණයට වඩා අන් වරණ තුන සඳහා පොදුවේ විසිරී ගිය තේරීමේ ක්‍රමයක් දැකිය හැකි වේ. 10 සහ 11 ශ්‍රේණිවල සිංහල භාෂාව සහ සාහිත්‍යය පෙළපොත් ආශ්‍රිතව මෙම ප්‍රශ්න සකස් කෙරුණ ද එම ග්‍රන්ථ මනාව පරිශීලනය නොකිරීම නිසා නිවැරදි පිළිතුර තෝරා ගැනීමට නො හැකි වී ඇති බව පෙනේ. එබැවින් විශ්ලේෂණය හා අවබෝධය යටතේ ඇති ප්‍රශ්නවලින් ඉහළ ලකුණු ලබාගැනීම සඳහා ඉහත සඳහන් අඩුපාඩු මග හරවා ගත යුතු වේ. මේ පිළිබඳව ගුරු-සිසු අවධානය යොමුවීම අත්‍යවශ්‍ය වේ.

| තේමාව | තේමාවට ඇතුළත් වී ඇති ප්‍රශ්න සංඛ්‍යාව | බර තැබීම | තේමාවේ පහසුතාව |
|---|---|---|---|
| 1) භාෂා කුසලතා | 18 | 45% | 50% |
| 2) ව්‍යාකරණ | 14 | 35% | 46% |
| 3) භාෂා සාහිත්‍යය | 01 | 2.5% | 64% |
| 4) විශ්ලේෂණය හා අවබෝධය | 07 | 17.5% | 46% |

සිංහල භාෂාව හා සාහිත්‍යය I පත්‍රයෙහි සමස්ත පහසුතාව 52%ක් වේ. එනම් මෙම පත්‍රයට පෙනී සිටි අයදුම්කරුවන් සමස්තයක් වශයෙන් ගත් කල, ඔවුන් උපයා ගෙන ඇත්තේ එම පත්‍රයට උපයා ගත හැකිව තිබූ උපරිම ලකුණුවලින් 52%ක් පමණි. එයින් ගම්‍ය වන්නේ සිංහල භාෂාව හා සාහිත්‍යය I පත්‍රයෙන් ඉහළ ලකුණු ලබාගැනීම අයදුම්කරුවන්ට පහසු වී නොමැති බවයි.

## 2.2 II ප්‍රශ්න පත්‍රය

### 2.2.1 II ප්‍රශ්න පත්‍රයේ ව්‍යූහය

මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න පහකින් සමන්විත වේ. එම ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.

1. ප්‍රශ්නය : භාෂා පරිචය ඇගයීම සඳහා සකස් කරන ලද කෙටි පිළිතුරු සැපයීමේ අනුප්‍රශ්න 10කින් සමන්විත වේ.
එක් අනුප්‍රශ්නයකට ලකුණු 02 බැගින් මුළු ලකුණු 20 කි.

2. ප්‍රශ්නය : නිර්දිෂ්ට ව්‍යූහගත තේමා හතරක් අතුරින් එකක් තෝරා ගෙන, දෙන ලද වචන සීමාවක් යටතේ රචනයක් ලිවිය යුතු වේ. තෝරා ගනු ලැබූ රචනා ව්‍යූහයට වඩාත් අදාළ වන සාරවත් කරුණු හඳුනා ගෙන නිර්මාණාත්මක ලෙස සංවිධානය කර ඉදිරිපත් කිරීමේ හැකියාව මැනීම අපේක්ෂා කෙරේ.
ලකුණු 25 කි.

3. ප්‍රශ්නය : දෙන ලද පාඨයක සාරාංශය, දෙන ලද වචන සීමාවක් තුළ ලිවිය යුතු වේ. භාෂාමය සංශ්ලේෂණ හා විශ්ලේෂණ හැකියාව මැන බැලීම අපේක්ෂා කෙරේ.
ලකුණු 10 කි.


4. ප්‍රශ්නය : දෙන ලද ඡේදයක් ඇසුරෙන් විමසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සැපයිය යුතු වේ. අවබෝධය මැනීම අපේක්ෂා කෙරේ.
ලකුණු 10 කි.

5. ප්‍රශ්නය : දී ඇති අවශ්‍යතාවලට ගැළපෙන සේ අදළ ඉල්ලීමක් අඩංගු ලිපියක් හෝ අදළ තොරතුරු අඩංගු අත් පත්‍රිකාවක් හෝ ලිවිය යුතු වේ. ප්‍රායෝගික ලේඛන කුසලතා මැනීම අපේක්ෂා කෙරේ.
ලකුණු 15 කි.

II පත්‍රය සඳහා මුළු ලකුණු = 80

2.2.2 **II ප්‍රශ්න පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු, ලකුණු දීමේ පටිපාටිය, පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන**

II පත්‍රයෙහි එක් එක් ප්‍රශ්නය සඳහා පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ අංක 2, 3 හා 4 ප්‍රස්තාර ඇසුරෙන් ඉදිරිපත් කර ඇත. එක් එක් ප්‍රශ්නයට අදාළ ප්‍රස්තාර ඒ ඒ ප්‍රශ්නයේ නිරීක්ෂණ හා නිගමන සමග දක්වා ඇත.




(RD/16/04/OL පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරෙන් සකස් කරන ලදි.)

සිංහල භාෂාව හා සාහිත්‍යය II පත්‍රයෙහි ඇති ප්‍රශ්න පහටම පිළිතුරු සැපයීම අනිවාර්ය වේ. එහෙත් අයදුම්කරුවන්ගෙන් වැඩි ම ප්‍රතිශතයක් පිළිතුරු සපයා තිබුණේ පළමුවන ප්‍රශ්නයට වන අතර අඩු ම ප්‍රතිශතයක් පිළිතුරු සපයා තිබුණේ 5 වන ප්‍රශ්නයට ය. එම ප්‍රතිශත පිළිවෙළින් 99% හා 93% (ප්‍රස්තාරය 2, පිටුව 9) වේ. අයදුම්කරුවන්ගෙන් වැඩි ම ප්‍රතිශතයක් පළමුවන ප්‍රශ්නයට පිළිතුරු සපයා තිබූ නමුත් වැඩි ම පහසුතාවක් ඇත්තේ 4 වන ප්‍රශ්නයට ය. දී ඇති ඡේදයක් පදනම් කරගෙන අසනු ලබන ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට සැලැස්වීම මගින් සිසුන්ගේ අවබෝධය පිළිබඳ හැකියාව මැනීම මෙම ප්‍රශ්නයේ අරමුණ වී ඇත. එහි පහසුතාව 88%ක් පමණ වීම මගින් නිගමනය කළ හැක්කේ එම ප්‍රශ්නයට වඩාත් පහසුවෙන් හා සතුටුදායක ලෙස පිළිතුරු සැපයීමේ හැකියාව අයදුම්කරුවන් සතු වූ බවයි.

එසේ ම මෙම පත්‍රයේ ප්‍රශ්න පහ අතුරෙන් 2 වන ප්‍රශ්නය සඳහා අයදුම්කරුවන්ගෙන් 98%කට ආසන්න ප්‍රතිශතයක් පිළිතුරු සපයා තිබූ නමුදු එම ප්‍රශ්නයෙහි පහසුතාව 58%කි. තිබූ රචනා ව්‍යූහ හතරෙන් එකක් ආශ්‍රයෙන් පමණක් රචනාවක් නිර්මාණය කිරීම සඳහා යොමු කෙරුණු මෙම ප්‍රශ්නය තුළ තම අභිමතය අනුව රචනා ව්‍යූහයක් තෝරා ගැනීමේ අවස්ථාවක් ද අයදුම්කරුවන්ට හිමිව තිබිණි. එසේම පූර්ව සූදානම මගින් වඩාත් සාර්ථක පිළිතුරක් නිර්මාණය කිරීමේ ඉඩ ප්‍රස්තා ද පැවතිණි. මෙම විෂයය යටතේ ප්‍රශ්න පත්‍ර තුනෙහි ම අඩංගු වන සියලු ම ප්‍රශ්න අතුරෙන් වැඩිම ලකුණු ප්‍රමාණයක් වෙන් කෙරෙන ප්‍රශ්නය ද මෙයයි. මෙවැනි වාසිදායක තත්ත්ව රැසක් ම තිබියදීත් අයදුම්කරුවන් මෙම ප්‍රශ්නය සඳහා සාපේක්ෂ වශයෙන් අඩුවෙන් ලකුණු ලබා තිබීම විශේෂ අවධානයට යොමු විය යුතු වේ.

01. ප්‍රශ්නය

අපේක්ෂණය : භාෂා පරිචය ඇගයීම
ව්‍යූහය : මෙම ප්‍රශ්නයට කෙටි පිළිතුරු අපේක්ෂිත අනුප්‍රශ්න දහයක් ඇතුළත් වේ.

**1.** (i) සිට (x) තෙක් ඇති **සියලු ම** අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර **නොලියන්නේ** නම්, එහි **අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.**

(i) පහත සඳහන් එක් එක් වචනවල අන්තර්ගත පිල්ලම් අනුපිළිවෙළින් ලියන්න.
**(අ)** තුරඟා **(ආ)** හිරු

(ii) පහත සඳහන් වාක්‍යයෙහි ඇතුළත් උපසර්ග **දෙකක්** ලියන්න.
විරූපී මිනිසකුගේ ජීවිතය ඇසුරෙන් තැනුණු අනුවේදනීය කතා පුවතක් පුවත්පතක දුටුවෙමි.

(iii) පහත සඳහන් **(අ)** සහ **(ආ)** යටතේ දැක්වෙන අදහස්වලට ගැළපෙන තනිපදය බැගින් ලියන්න.
**(අ)** එකිනෙකට සම්බන්ධ ව පවතින
**(ආ)** යම් ස්ථානයකට බලහත්කාරයෙන් කඩාවැදීම

(iv) පහත සඳහන් වාක්‍ය ඛණ්ඩවල **තදකළු** අකුරෙන් මුද්‍රිත පද අයත් වන ක්‍රියා වර්ගය නම් කරන්න.
**(අ)** පොඩි නැන්දා **ගිනාවේවි** වෙලට ගෙනා මී කිරි
**(ආ)** ලොවට සාමය **උදාවේවා**

(v) පහත සඳහන් වාක්‍යයේ වචන **දෙකක** අක්ෂර වින්‍යාසය සදොස් ය. එම වචන **දෙක** පමණක් නිදොස් කර ලියන්න.
"පොදු ජන සිතෙහි විද්‍යාව රෝපනය කිරීමේ ප්‍රශ්නය ගැන සැලකිල්ල යොමු වී තිබෙන මෙවැනි යුගයක මේ විශිෂ්ට ප්‍රයත්නයට ප්‍රසංශා කළ යුතු ය."

(vi) පහත දැක්වෙන **(අ)** සහ **(ආ)** යෙදුම්වල පළමුවැනි වචනය සමඟ දෙවැනි වචනයේ නොගැළපීමක් ඇත. වඩාත් ගැළපෙන සේ පළමුවැනි වචනය හෝ දෙවැනි වචනය හෝ සකස් කර ලියන්න.
**(අ)** මුහුදු බාදනය
**(ආ)** සොබා ධර්මය

(vii) පහත **(අ)** සහ **(ආ)** හි දැක්වෙන වාක්‍ය සදොස් ය. ඒවා නිදොස් කර නැවත ලියන්න.
**(අ)** නිලධාරි මණ්ඩලයෙන් එක් අයෙක් ඉල්ලා අස්වෙති.
**(ආ)** සමිතියේ සාමාජිකාවන් නොහොත් ආයතනයේ සේවිකාවෝ රැස්වීමට සහභාගි වෙති.

(viii) පහත දැක්වෙන පද සන්ධි කොට ලියන්න.
**(අ)** සන් + හස **(ආ)** ගිරි + අග

(ix) පහත සඳහන් පද්‍ය පාදයේ **තදකළු** අකුරෙන් මුද්‍රිත පදවල අර්ථ වෙන වෙන ම ලියන්න.
**දලඹ නිලඹ** ගැබ නැගි ගුම් අසාලා

(x) පහත දැක්වෙන යෙදුම් සඳහා වී ගොවිතැන ආශ්‍රිත භාෂා ව්‍යවහාරයෙහි යෙදෙන වචන ලියන්න.
**(අ)** කුරුල්ලන්ට කෑම පිණිස වෙන් කරන කුඹුරු කොටස
**(ආ)** කුඹුරක වට්ටේට පස් සහ මඩවලින් සකස් කරන වැටිය

(ලකුණු 20 යි.)

අපේක්ෂිත පිළිතුර

1. (i) (අ) පාපිල්ල/කෙටි පාපිල්ල, ඇලපිල්ල
(ආ) ඉස්පිල්ල/කෙටි ඉස්පිල්ල, පාපිල්ල/කෙටි පාපිල්ල

(ii) වි, අනු/ විරූපී, අනුවේදනීය/ වි (රූපී) අනු (වේදනීය)

(iii) (අ) ඒකාබද්ධ/අනුබද්ධ/අනුබන්ධ/අවියෝජනීය
(ආ) ආක්‍රමණය

(iv) (අ) මිශ්‍ර ක්‍රියා/ මුසු කිරිය
(ආ) ආශීර්වාද ක්‍රියා/ ප්‍රාර්ථනා ක්‍රියා

(v) රෝපණය, ප්‍රශංසා (වාක්‍යය ම ලියා තිබුණ ද නිවැරදි ය)

(vi) (අ) මුහුදු කෑම/ සමුද්‍ර බාදනය
(ආ) සොබා දහම/ ස්වභාව ධර්මය


(vii) (අ) නිලධාරි මණ්ඩලයෙන් එක් අයෙක් ඉල්ලා අස්වෙයි.
(ආ) සමිතියේ සාමාජිකාවෝ නොහොත් ආයතනයේ සේවිකාවෝ රැස්වීමට සහභාගි වෙති.

(viii) (අ) සන්නස
(ආ) ගිරග


(ix) වැහිවලාව/ වැහිවලාකුළ/ජලවාෂ්ප සහිත වලාකුළ
නිල් අහස/නිල් අඹර/නිල් වලාකුළු

(x) (අ) කුරුලූ පාළුව
(ආ) නියර/ වේල්ල/ මියර

1 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන




මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයීම අනිවාර්ය වුවත් ඊට පිළිතුරු සපයා ඇත්තේ අපේක්ෂකයින්ගෙන් 99% පිරිසකි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් හිමි වේ.
ඉන් ලකුණු 00 - 05 ප්‍රාන්තරයේ 17%ක් ද,
ලකුණු 06 - 10 ප්‍රාන්තරයේ 36%ක් ද,
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 35%ක් ද,
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 12%ක් ද,
ලකුණු ලබාගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 16ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් පිරිස 12% වන අතර 17% ලබාගෙන ඇත්තේ ලකුණු 5ක් හෝ ඊට අඩුවෙනි.




සිංහල භාෂාව හා සාහිත්‍යය II පත්‍රයෙහි පළමුවන ප්‍රශ්නය කොටස් 10ක් යටතේ අනුකොටස් 17කින් සමන්විත වූ අතර වැඩිම පහසුතාව ඇත්තේ II වන අනුකොටසට ය. එහි පහසුතාව 81%කි.

මෙම ප්‍රශ්නයෙන් මැනෙන්නේ අව්‍ය පද යටතේ ඉගැන්වෙන උපසර්ග පිළිබඳවයි. වාක්‍යයේ දී ඇති උපසර්ග සහිත පද තෝරා ගැනීමටත් ඒ අනුසාරයෙන් උපසර්ග උපුටා දැක්වීමටත් ශිෂ්‍යයන්ට පහසු වී ඇති නිසා ඊට ලැබුණු ප්‍රතිචාර ඉහළ මට්ටමක පැවති බව පෙනේ.

දෙවනුව වැඩි පහසුතාව වන 77% ලබා ගෙන ඇත්තේ පළමුවන ප්‍රශ්නයේ (අ) අනුකොටස ය. පිල්ලම් පිළිබඳව ප්‍රාථමික ශ්‍රේණිවල සිට ම අවධානය යොමු කෙරෙන බැවින් එම ප්‍රශ්නය පහසු වී ඇති බව පැහැදිලි වේ. එහෙත් එහිම (ආ) අනුකොටස යටතේ ද පිල්ලම් මැනෙන අතර "හිරු" යන පදයේ පිල්ලම් නම් කිරීමේදී "රු" අක්ෂරයේ පිල්ලම පාපිල්ල ලෙස නම් කිරීමට ඇතැම් අයදුම්කරුවන් අපොහොසත් වීම එම අනුකොටසට අඩු පහසුතාවක් පෙන්වීමට හේතුවක් ලෙස නිගමනය කළ හැක.

තෙවනුව වැඩි පහසුතාව වන 76% ලබාගත් (x) කොටස (ආ) අනුකොටස ගොවිතැන ආශ්‍රිත ව්‍යවහාරයේ පවතින යෙදුම් පිළිබඳ ව විමසන ප්‍රශ්නයකි. "කුඹුරක වටේට පස් හා මඩවලින් සකස් කරන වැටිය" යන්න සඳහා යෙදෙන වචනය "නියර" ලෙස පිළිතුරු සැපයීමට ශිෂ්‍යයන්ගෙන් වැඩි පිරිසක් සමත් වී ඇත්තේ එම වචනය පොදු ව්‍යවහාරයේ යෙදෙන්නක් බැවිනි.

(i) (අ) සහ (iv) (ආ), (v), (vi) (ආ), (viii) (අ) සහ (ආ) යන කොටස්වල/අනුකොටස්වල පහසුතා 50%-75% ප්‍රාන්තරය අතර පවතින අතර, මෙම අනුකොටස් 17 අතුරෙන් දුෂ්කරම ප්‍රශ්නය වී ඇත්තේ (iii) (ආ) අනුකොටසයි. එහි පහසුතාව 20%කි. එහිම (අ) අනුකොටසෙහි පහසුතාව ද 23%කි. ඒ අනුව තනි පද පිළිබඳ ව විමසා බැලෙන මෙම ප්‍රශ්නයේ අනුකොටස් දෙකට ම සාර්ථකව පිළිතුරු සැපයීමට අයදුම්කරුවන් අපොහොසත් වී ඇති බව පෙනේ. භාෂාත්මක යෙදුම් පිළිබඳව නිසි අවබෝධයක් නොමැති වීම මෙයට හේතුව ලෙස දැක්විය හැකි ය.

අනතුරුව වඩාත් දුෂ්කර වී ඇත්තේ (vi) (අ) අනුකොටස සහ (ix) (අ) අනුකොටස වේ. ඒවායේ පහසුතාව පිළිවෙළින් 23% හා 22%ක් වේ. එම ප්‍රශ්නවලට පාදක වූයේ තත්සම තත්භව වචන පිළිබඳ නිරවුල් අවබෝධය මැනීමත් පද්‍ය පාදයක අංකිත පදවල අර්ථ විමසීමත් ය. අයදුම්කරුවන් පෙළපොත් පරිශීලනයේ දක්වන දුර්වල බව මෙමගින් අනාවරණය වෙයි.

(iv) වැනි කොටසේ (අ) අනුකොටස (vii) කොටසේ (අ) සහ (ආ) අනුකොටස් ව්‍යාකරණ දැනුම විමසන ප්‍රශ්න වන අතර ඒ සඳහා ලබාගෙන ඇති පහසුතාව පිළිවෙළින් 47%, 46% සහ 30% වෙයි. (x) කොටසේ (අ) අනුකොටස ව්‍යාහාරික භාෂා දැනුම විමසන ප්‍රශ්නයක් වන අතර එහි පහසුතාව 43%කි.

ක්‍රියාවර්ග හා උක්ත අනුක්ත පද සම්බන්ධය වැනි සරල ව්‍යාකරණ පිළිබඳ දැනුම අයදුම්කරුවන් තුළ නොමැති බවත් ව්‍යවහාරික භාෂාවේ යෙදෙන විශේෂිත පද පිළිබඳ නිරවුල් අවබෝධයක් නොමැති බවත් මෙහිදී පැහැදිලි වේ. භාෂා පරිචය යටතේ ලේඛන කුසලතාව, භාෂණ අවබෝධය හා විශ්ලේෂණය කිරීම, භාෂා භාවිතය, ග්‍රන්ථ පරිහරණය හා වාක්‍ය අවබෝධය යන කරුණු මැනීම මෙයින් අපේක්ෂා කළ ද අයදුම්කරුවන් තුළ ව්‍යාකරණ පිළිබඳ මූලික දැනුම හීනවීමත් අවබෝධය පිළිබඳ දුර්වලතාත් දක්නට ලැබේ. මේ සඳහා ව්‍යාකරණ ග්‍රන්ථ පරිශීලනයටත් වියරණ දැනුම වැඩි දියුණු කර ගැනීමටත් පෙළපොත් හා අමතර ග්‍රන්ථ පරිශීලනයටත් අයදුම්කරුවන් උනන්දු කරවිය යුතුය.

## 02 ප්‍රශ්නය

අපේක්ෂණය : සංශ්ලේෂණ හැකියාව මැන බැලෙන්නකි. දෙන ලද ව්‍යුහගත ඡේද හතරෙන් එකක් යටතේ රචනාවක් ලිවීමත්, යෝග්‍ය මාතෘකාවක් යෙදීමත් අපේක්ෂා කෙරේ. මෙහිදී අපේක්ෂකයාගේ නිර්මාණ හා චින්තන ශක්තිය, ලේඛන කුසලතාව, නිරවුල් භාෂා භාවිතය, සංශ්ලේෂණ හා විශ්ලේෂණ හැකියාව මැන බැලීම ආදි අරමුණු කෙරෙහි අවධානය යොමු වෙයි. මාර්ගෝපදේශිත රචනා මූලධර්මය මෙහිදී අනුගමනය කර ඇත.

**2.** පහත දැක්වෙන **අ. ආ. ඉ. ඊ** යන විස්තර අතුරෙන් **එකක්** තෝරාගෙන **වචන 250කට නොඅඩු** වන සේ රචනයක් ලියන්න. ඒ සඳහා **යෝග්‍ය මාතෘකාවක්** ද යොදන්න.

**(අ)** අප දැනුමෙන් පරිපූර්ණත්වයට පත් කරන්නට සාහිත්‍ය පොතපත උපකාරී වෙයි. එහෙත් තාක්ෂණික ලෝකයේ අතරමංව සිටින වර්තමාන පරම්පරාව ක්‍රමයෙන් සාහිත්‍ය පොතපත පරිශීලනයෙන් ඈත් වෙමින් සිටිති. දිනෙන් දින සිය ගණනින් පොතපත පළ වුව ද ඒවා කියවන පිරිස සීමිත ය. මේ තත්ත්වය රටේ අනාගතය කෙරෙහි ඉතා අයහපත් ලෙස බලපායි. හිස් වූ මොළ ඇති මිනිසුන්ගෙන් පිරි රටක අනාගතය කෙබඳු වෙයි ද? ගුණධර්ම පිරි සමාජයක් කෙසේ අපේක්ෂා කළ හැකි දැ'යි යන්න අවිනිශ්චිත ය.

**(ආ)** රටක අනාගතය රඳා පවතින්නේ ළමා පරපුර මත ය. අනාගතයෙහි රට බබළවන්නේ ඔවුන් ය. එහෙත් වර්තමානයේ ළමා පරපුර අභාග්‍ය සම්පන්න ඉරණමකට මුහුණ දෙමින් සිටිති. දරුවන්ට සිදු වන විවිධ හිංසා, පීඩා, පැහැර ගැනීම්, අපයෝජන, මෙහෙකාර සේවයේ යෙදවීම්, අතරමං කර දැමීම් වැනි විවිධාකාර දේ ගැන නිරන්තරයෙන් අසන්නට ලැබේ. පිපෙන්නට වෙර දරන පුංචි මල් කැකුළු බඳු දරු පරපුර රැකගැනීම අප සියලු දෙනාගේ ම වගකීමකි. හෙට දවසේ වැඩිහිටියන් බවට පත්වන ඔවුන් ගුණධර්ම සපිරි සමාජයකට දායාද කිරීම අප සැමගේ ම යුතුකමකි.

**(ඉ)** ශ්‍රී ලංකාව ඉපැරණි ඉතිහාසයකට උරුමකම් කියන රටකි. අපේ පැරණි සංස්කෘතික දායාද සහ උරුම ඊට සාක්ෂ්‍ය සපයයි. අපේ අනන්‍යතාව සුරක්ෂිත වී ඇත්තේ එම පැරණි උරුමයන් මත ය. අනුරාධපුර, පොළො[illegible] පැරණි රාජධානිවල ඇති නටබුන්වලින් අපේ පැරන්නන් සතුව තිබූ විද්‍යාත්මක හා තාක්ෂණික ඥානය පිළිබිඹු වේ. පැරණි සංස්කෘතික හරපද්ධතිවලින් අතීත ජනතාවගේ හැදියාව හා සදාචාරය පිළිබිඹු වේ. එහෙත් ශ්‍රී ලංකාව බාහිර ලෝකයට අදූරදර්ශී ලෙස නිරාවරණය වීමත් සමඟ අපේ පැරණි උරුමය හා සංස්කෘතිය ක්‍රමයෙන් විනාශ වෙමින් පවතී.

**(ඊ)** **ජලය නොමැති තැනක මිනිසකුට එක් දිනක් හෝ ජීවත් වීම අසීරු ය. ජලය එතරම් ම මිනිස් ජීවිතය හා බැඳී පවතී. මිනිසා විවිධ කාර්යයන් සඳහා ජලය යොදා ගන්නා අතර බීමට ගැනීම එයින් ප්‍රධාන වේ. ලෝකයේ බීමට සුදුසු ජලය ඇත්තේ ස්වල්පයකි. එහෙත් පරිසර දූෂණය, කෘමිනාශක භාවිතය ආදිය නිසා මේ ස්වල්ප වූ ජල ප්‍රමාණය ද තවත් අඩුවෙමින් හා දූෂණය වෙමින් පවතී. දූෂිත ජලය පානය කිරීම නිසා වැළඳෙන වකුගඩු රෝග, පිළිකා ඇතුළු විවිධ මාරාන්තික රෝග ගැන නිතර අසන්නට ලැබේ. රටක පැවැත්මට නිරෝගී ජනතාවක් සිටීම අත්‍යවශ්‍ය ය. එබැවින් ජලය සුරැකීම පිළිබඳ ව පියවර ගත යුතු කාලය එළඹ ඇත.**

(ලකුණු 25 යි)

### අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

එක් එක් විස්තරයට අදාළ වන්නේ පහත සඳහන් ප්‍රධාන අදහස් ය.

(අ)
- ගුණධර්ම පිරි සමාජයක් උදෙසා සාහිත්‍යයේ උපයෝගිතාව
- ගුණධර්ම පිරි සමාජයක් සඳහා සාහිත්‍යයේ කාර්යභාරය
- දැනුම වර්ධනය සඳහා පොතපත පරිශීලනය

(ආ)
- දරු පරපුරේ අනාගතය සුරැකීම
- දරු පරපුර රැක ගැනීමේ අවශ්‍යතාව
- සුරක්ෂිත ළමා ලෝකයක් බිහි කිරීම

(ඉ)
- අපේ පැරණි උරුමය රැක ගැනීම
- අපේ සංස්කෘතික දයාද රැක ගැනීම
- අපේ උරුමය හා සංස්කෘතිය රැක ගැනීම

(ඊ)
- ජල සම්පත සුරැකීම
- නිරෝගී දිවියක් සඳහා ජල සම්පත ආරක්ෂා කර ගැනීම
- මිනිස් දිවිය සුරකින ජල සම්පත

ලකුණු විග්‍රහය - මුළු ලකුණු 25 යි රචනය හොඳින් කියවා ලකුණු දෙන්න.

1. සාරවත් භාවය, මාතෘකාව ද ඇතුළු ව - ලකුණු 08 යි
2. සංවිධානය, නිර්මාණාත්මක භාවය හා ස්වීයත්වය - ලකුණු 12 යි
3. ශිල්පීය දක්ෂතා සහ ඡේද බෙදා ලිවීම - ලකුණු 05 යි

01. සාරවත්භාවය - ලකුණු 07 යි
විස්තරයට අදාළ වන පරිදි මාතෘකාවක් යොදා තිබීම - ලකුණු 01 යි

තේමාවට අදාළ බව, ඉදිරිපත් කොට ඇති ව්‍යුහයට සමීප බව, සරුබව හා සමබව, වචන ගණන 250ට සමීපව පැවැතීම යන කරුණු සාරවත්භාවය යටතේ සැලකිල්ලට ගත යුතු වේ.

02. සංවිධානය, නිර්මාණාත්මකභාවය හා ස්වීයත්වය - ලකුණු 12 යි

මෙහිදී උසස් ප්‍රකාශන ශක්තිය, සංවිධානය, ස්වීයත්වය, නිර්මාණාත්මක ප්‍රකාශන, ව්‍යක්ත ලේඛන ව්‍යවහාරය ආදී අංශ ගැන සලකා බැලිය යුතු ය.

03. ශිල්පීය දක්ෂතා සහ ඡේද බෙදා ලිවීම - ලකුණු 05 යි

වියරණ, අත් අකුරු, විරාම ලක්ෂණ භාවිතය, ඡේද අදාළ පරිදි වෙන් කොට තිබීම, පද වෙන් කොට ලිවීම යන අංශ ගැන සලකා බලා ලකුණු තීරණය කළ යුතු වේ.

සැලකිය යුතුයි :


01. රචනයේ වචන ගණන දළ වශයෙන් 200ට වඩා අඩු වන කල්හි ඉහත දැක්වූ 1, 2, 3 යන කොටස්වලට අනුපාතික ව ලකුණක් තීරණය කෙරේ.
02. වැදගත් අදහස් හා සිත් ගන්නා ප්‍රකාශන ඇති තැන්වල (√) යොදන්න. වැරදි තැන්වල (x ) ලකුණු යොදන්න.
03. උක්තඛ්‍යාත සම්බන්ධ වැරදි තැන් යටින් ඉරක් අඳින්න. අක්ෂර වින්‍යාසය වැරදි වචන වටා රවුමක් අඳින්න.

04. 1, 2, 3 යන කොටස් සඳහා දෙන ලද ලකුණු උත්තරය අග හරස් අතට ලියා එකතු කර මුළු ලකුණු ලබාගන්න.

නිදසුන් $\frac{6}{8}$ $\frac{9}{12}$ $\frac{3}{5}$ $\frac{18}{25}$


සංලක්‍ෂ්‍යය : වාක්‍ය රචනා ඇගයීමට පෙර අදාළ ව්‍යූහය කියවා දළ සැලැස්මක් සකස් කරගන්න. ව්‍යූහයට කිසිසේත් අදාළ නොවන සේ ලියා ඇති රචනා ඇගයීමේදී සාරවත්භාවය සඳහා පිරිනැමිය යුත්තේ ඉතා අඩු ලකුණකි.

**2 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්‍ෂණ හා නිගමන**




මෙම ප්‍රශ්නයට පිළිතුරු සපයා ඇත්තේ අයදුම්කරුවන්ගෙන් 99%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 25ක් හිමි වේ.

ඉන් ලකුණු 00 - 06 ප්‍රාන්තරයේ 6%ක් ද,
ලකුණු 07 - 12 ප්‍රාන්තරයේ 19%ක් ද,
ලකුණු 13 - 18 ප්‍රාන්තරයේ 54%ක් ද,
ලකුණු 19 - 25 ප්‍රාන්තරයේ 21%ක් ද,
ලෙසින් ලකුණු ලබාගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 12ට අඩුවෙන් ලකුණු ලබාගත් අයදුම්කරුවන් ප්‍රමාණය 25%කි. ලකුණු 19-25 අතර ලකුණු ලබාගත් ප්‍රමාණය 21%කි. සමස්තයක් වශයෙන් ගත් කල රචනා ප්‍රශ්නයට ලකුණු ලබා ගැනීම දුර්වල මට්ටමක පැවතුණි.




මෙම ප්‍රශ්නයෙහි (අ), (ආ), (ඉ) සහ (ඊ) යටතේ පිළිවෙළින් "සුචරිතයෙන් පිරි සමාජයක් උදෙසා සාහිත්‍යය උපයෝගිතාව", "සුරක්‍ෂිත ළමා ලෝකයක් බිහිකිරීම" "සංස්කෘතික දායාද රැක ගැනීම" "ජල සම්පත සුරැකීම" යන මාතෘකා තේමා කරගනිමින් මාර්ගෝපදේශිත රචනා සඳහා විස්තරාත්මකව ව්‍යූහගත ඡේද 4ක් ඉදිරිපත් කර තිබුණි.

එක් එක් රචනා මාතෘකා අනුව " සාහිත්‍යයේ උපයෝගිතාව" තේමා කරගත් රචනයේ පහසුතාව 56%ක් ද, "සුරක්‍ෂිත ළමා ලෝකයක් බිහිකිරීම" තේමාව කරගත් රචනයේ පහසුතාව 61%ක් ද "සංස්කෘතික දායාද රැකගැනීම" තේමා කරගත් රචනයේ පහසුතාව 58%ක් ද විය.

සමස්තයක් ලෙස ගත් කල ප්‍රශ්නයෙහි මධ්‍යක පහසුතාව 58%ක් වන බැවින් රචනා ලිවීමේ නිපුණතාව අයදුම්කරුවන් තුළ තව තවත් වර්ධනය කළ යුතු බව පැහැදිලිය. ස්වකීය අදහස් නිදහස් ව හා නිර්මාණාත්මක ව ජනනය කරවීමටත් ඒවා විධිමත් ව, සංවිධානාත්මක ව නිරවුල් ව හා ව්‍යාකරණානුකූල ව ඉදිරිපත් කිරීමටත් සිසුන් යොමු කළ යුතුය.

රචනා මාතෘකාව හඳුනා ගැනීමට උපයෝගී කර ගැනීම සඳහා දී ඇති ඡේදයෙහි කරුණු ඉදිරිපත් කර ඇති රටාව සැලකිල්ලට ගැනීමෙන් රචනා සැකිල්ල යටතේ අයදුම්කරුවන්ගේ කරුණු සංවිධානය කර ගැනීමට පහසු වේ. වචන 250කට නො අඩු යන සීමාව 250-300 අතර ලෙස දැක්වීමෙන් අයදුම්කරුවන්ගේ නිදහස් ව ලිවීමේ හැකියාවට අවකාශයක් ලැබේ. අතිරේක වශයෙන් සම්භාව්‍ය ගද්‍ය පද්‍ය පොත පත කියවීම ද විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය පරිශීලනය කිරීම ද විශේෂයෙන්ම අන්තර්ජාලය ඇසුරෙන් නව ලෝකය පිළිබඳ ව රැස්කර ගත හැකි කරුණු ද සාර්ථක රචනා නිර්මාණය කිරීම සඳහා මහඟු අත්වැලක් කරගත හැකිය.

දී ඇති රචනා ව්‍යුහ අතරින් "ඉ" යටතේ ගෘහිත රචනා මාතෘකාව සඳහා අයදුම්කරුවන්ට මගපෙන්වීමක් ලෙස එම ව්‍යුහය පාදක කරගෙන විශ්ලේෂණාත්මකව සැකිල්ලක් සාදා ගෙන, ඒ ඒ යටතේ කරුණු සංශ්ලේෂණය කර ගනිමින් ඉදිරිපත් කිරීම තුළින් වචන 250 සීමාවට පහසුවෙන් ළඟා වීමට හැකිවන ආකාරයට පහත ආදර්ශනය උපයෝගී කරගත හැකිය.

2. (ඉ) ***ජල සම්පත සුරකිමු***

*ජලය යනු මූලිකම මිනිස් අවශ්‍යතාවලින් එකකි. ජලයේ අවශ්‍යතාව ප්‍රබලව පෙන්නුම් කරන උදාහරණ කොතෙකුත් අප ඉතිහාසයේ ඇත. ආර්යයන් ශ්‍රී ලංකාවට සංක්‍රමණය වී සිය ජනපද පිහිටුවා ගෙන ඇත්තේ ගංගා ආදිය කේන්ද්‍ර කොට ගෙනය. ඒ අනුව ජලය මිනිස් ජීවිත හා බද්ධ වී ඇති ආකාරය අවබෝධ කර ගැනීමට වෙනත් අටුවාටීකා අනවශ්‍යය. මිනිසාට පමණක් නොව පණ නළ ඇති සියලුම ගහකොළට සතාසීපාවන්ට ජලය මහඟු වස්තුවකි. නිල් ග්‍රහයා යන නම් ලද පෘථිවිය ජෛව විවිධත්වයකින් බහුල වීමටත්, සෞරග්‍රහ මණ්ඩලයේ අනෙකුත් ග්‍රහලෝක ජීවයෙන් තොර හුදෙකලා ලෝකවීමටත් ප්‍රධානම සාධකයක් වී ඇත්තේ ජලයයි.*

*අප උදෑසන අවදි වූ තැන් පටන් නින්දට යන තෙක් කොපමණ නම් අවස්ථාවල දී ජලය භාවිතයට ගන්නට ඇතිද? බීමට, ආහාර සැකසීමට, නෑමට, පිරිසිදු කිරීම් කටයුතු හා වගා කටයුතු ආදී අනේ-කවිධ අවස්ථාවන් සඳහා ජලය යොදා ගනී. එපමණක්ද නොව ජලයට ඉතා වටිනා හා වැදගත් ස්ථාන කොතෙකුත් නම් අය සමාජ සංස්කෘතියෙන් ලබා දී තිබේද? අතීතයේ සිටම උපතේ සිට මරණය දක්වා ජීවිතයේ වැදගත් සන්ධිස්ථානවල දී මූලිකත්වය ලබා දීමෙන් අපේ මුතුන් මිත්තෝ ජලයට ඇති ගෞරවය හා භක්තිය මනාව පෙන්වා දුන්හ.*

*පෘථිවිය ක්ෂිරපථයේ නිල් ග්‍රහයා යන විරුදාවලිය ලැබීමට මූලික වන්නේ මෙහි ඇති ජල ප්‍රභවයන්ය. පෘථිවියෙන් වැඩි කොටසක් ජලයෙන් වැසී ඇති මුත් අවාසනාවට ඉන් ප්‍රයෝජනයට ගත හැකි ජල ප්‍රමාණය ඉතා සීමිතය. වැඩි ජල ප්‍රමාණයක් කරදිය හා ධ්‍රැවීය අයිස් ලෙස පවතී. එනමුදු භාවිතයට ගත හැකි අල්ප වූ ජල ප්‍රමාණය සුරැකීම වෙනුවෙන් අප පෙනී සිටිනවාද යන්න නම් ප්‍රශ්නාර්ථයකි.*

*"සොබාදහම නැමැති දැල මිනිසා විසින් වියන ලද්දක් නොවේ. ඔහු එහි නූල් පොටක් පමණි. එම දැලට යම් හානියක් කරතොත් ඒ තමාට කර ගන්නා උපද්‍රවයකි."*

*රතු ඉන්දියානු ශ්‍රේෂ්ඨ නායක සියැටල්ගේ මෙම ප්‍රකාශය සොබාදහමේම කොටසක් වන අප සොබාදමට වින කිරීම, අප විසින් අපටම විනාශයට මංපෙත් විවර කර ගැනීමක් බව පැහැදිලි කරයි. සොබාදම් මාතාවගේ අමිල දායාදයක් වන ජල සම්පත වර්තමානය වන විට ඇතැම් මිනිස්සු හිත්පිත් නැති ලෙස වනසති. බුද්ධියෙන් උසස් යැයි කියා ගන්නා මිනිස්සු ම ජලය දූෂණය කරති. සොබාදමට හානි පමුණුවන කෘමිනාශක, වල්නාශක ස්වභාවික ජල ප්‍රභවයන්ට එක් කරති. ඉවතලන කැලිකසළ ගඟකට හෝ ඇළකට විසිකර දැත් පිරිසිදු කර ගනිති. නීතිවිරෝධී ලෙස ගංගා භාරා වැලි ඉවත් කරමින් බීමට ඇති ජලයට ක්‍රමයෙන් කරදිය එක් කිරීමට වෙර දරති. කර්මාන්ත ශාලාවලින් පිටවන කාර්මික අපද්‍රව්‍ය කිසිදු පැකිලීමකින් තොරව ජල ප්‍රභවයකට මුදා හරිති. අදූරදර්ශී තවත් සමහරුන් භාවිත කළ කෘමිනාශක බෝතය ඇළකට විසිකර දමන්නේ නුදුරු දිනෙක තමාටම මරු කැඳවන්නේ එයම බව අමතක කරමිනි. ඇතැම්හු තුරුලතා කපා දමා මහා පරිමාණ වන සංහාරයන් කරති. මෙනිසා ම ඇතැම් වැව්වල ජල පෝෂක ප්‍රදේශ විනාශ වී යෑම නිසා වැව් සිඳී යාම හේතුවෙන් ගම්මානවල වැසියෝ දැඩි දුෂ්කරතාවලට මුහුණ දෙති. බීමට ජල බිඳක් සොයා ගැනීමට ගව් ගණන් දුර ඇවිද යාමට ඔවුන්ට සිදු වේ.*

*දූෂිත ජල පරිභෝජනය නිසාම මේ වන විටත් විවිධාකාර රෝග මිනිස් ජීවිත රැසක බිලි ගෙන හමාරය. කොළරාව, පාචනය, වකුගඩු රෝග හා පිළිකා ආදී රෝග දූෂිත ජලය ආශ්‍රිත කර ගනිමින් පැතිරේ. ඇතැම් ගම්මානවල අසරණ ජනතාව වැව් හාරා ඒවායින් මතු වන බොර ජල ස්වල්පය වුවද මහමෙරක් තරම් වටිනාකමකින් රැස් කර ගනිති. ඔවුනට මුතු මැණික්වල වටිනාකමටත් එහා ගිය වටිනාකමක් පිරිසිදු ජල බිඳුවක් කෙරෙහි ඇත. වර්තමානයේදී මෙම කරදර විපත් සීමිත මිනිසුන් ප්‍රමාණයකට පමණක් ඇති වුවද අනාගතයේ දී අප සැමටම මීට මුහුණ දීමට සිදු වනු ඒකාන්තය.*

*අද ලැබෙන වාසිය තකා අනාගතය අඳුරු කර ගැනීමට අප මංමාවත් කපා ගත යුතු නොවේ. දුරදිග සිතා බලා ක්‍රියාකිරීමට දැන් කාලය එළඹ ඇත. මහගු සම්පතක් වන ජලය පණ මෙන් සුරැකීම අප වගකීමක් කොට සලකමු. එය අපගේ මෙන්ම අප අනාගත පරපුරේ ද නීරෝගී පැවැත්මට පිටිවහලක් වනු ඇත. ජල සුරැකීම වෙනුවෙන් නීති සම්පාදනය කොට, දඬුවමට බියෙන් ජල දූෂණයෙන් වැළකීම මනුසත්කමට ද නිගරුවක් සේ සලකා, සැබෑ මිනිසුන් ලෙසින් හදවතින් ම කැප වී ජල සම්පත සුරැකීමට එකාවන්ව නැගී සිටිමු.*

## 03 ප්‍රශ්නය

අපේක්ෂණය :

දෙන ලද ඡේදයක් සංක්ෂේප කොට ලියා දැක්වීම මෙහිදී අපේක්ෂා කෙරේ. අයදුම්කරුවන්ගේ සංශ්ලේෂණ හා විශ්ලේෂණ හැකියා මෙන්ම භාෂා භාවිතය පිළිබඳ දැනුම ද මෙහිදී පරීක්ෂා කෙරේ. විස්තර වර්ණනා බැහැර කරමින් එහි හරය වටහා ගෙන ඒ ඇසුරින් සමස්ත අර්ථය තම වචනයෙන් ඉදිරිපත් කිරීමේ හැකියාව මෙහිදී ඇගයේ.

අයදුම්කරුවන් තුළ සාරාංශකරණය පිළිබඳ මනා පළපුරුද්දක් තිබිය යුතුය. ඒ සඳහා නිරන්තර අභ්‍යාසවල යෙදීම අනිවාර්ය වේ. මේ සඳහා අපේක්ෂිත සාරාංශය පිළිබඳ පැහැදිලි අදහසක් ලබාදී තිබේ.

**3.** පහත සඳහන් ඡේදය වචන **50 - 60** අතර වන සේ **සාරාංශ කොට ලියන්න**. ඔබේ සාරාංශයේ වචන සංඛ්‍යාව උත්තරය අග ලියන්න.

පෙරදිග සංස්කෘතියේ හරය දැක පෙරදිග භාෂා, දර්ශන, ජීවන ක්‍රමය, කලා ශිල්ප, අපරදිගවාසීන්ට හඳුන්වා දුන් ශාස්ත්‍රඥයෝ කීපදෙනෙක් වෙති. ඔවුන් තුළ පැවැති නිර්මාණ ශක්තියත්, මානව දයාවත්, අපූර්ව ඥාන සම්භාරයත් නිසා පෙරදිග සංස්කෘතික දායාද අපරදිග තවමත් බැබළෙමින් පවතී. ශ්‍රීමත් විලියම් ජෝන්ස් සංස්කෘත භාෂාව අපරදිගට හඳුන්වා දුන්නේ ය. ස්වාමි රාමක්‍රිෂ්ණ හා ස්වාමි විවේකානන්ද පෙරදිග දර්ශනයන්හි හරය බටහිර ලෝකයට ප්‍රකාශ කළහ. රබීන්ද්‍රනාත් තාගෝර් පෙරදිග සංගීතය හා සිතුවම් කලාව බටහිරට හඳුන්වා දුන් දූතයා විය. අනගාරික ධර්මපාලතුමා නිව්යෝර්ක් නුවර ලෝක ආගම් සමුළුවේ දී කළ ප්‍රකාශය, බෞද්ධ දර්ශනය අපරදිග පැතිරවීමේ පෙරවදනක් විය. ආනන්ද කුමාරස්වාමි පෙරදිග සංස්කෘතියෙහි හා කලාශිල්පවල උදාරත්වය ලොව හමුවේ අභිමානවත් ලෙස ඉදිරිපත් කරන්නට උත්සුක විය. අපේ සංස්කෘතියෙහි හරය දැක එය ලොවට දායාද කරනු වස් මධ්‍යකාලීන සිංහල කලා නමැති විශිෂ්ට ග්‍රන්ථය ඇතුළු අනර්ඝ ග්‍රන්ථ සම්භාරයක් ලියූ ආනන්ද කුමාරස්වාමි සූරීන් ඉමහත් කෘතවේදිත්වයකින් සැමරිය යුතු ශ්‍රේෂ්ඨ ලංකා පුත්‍රයෙකි. නුවර සමයේ පැවැති පෞරාණික ගොඩනැගිලි ආරක්ෂා කර ගැනීමේ වැදගත්කම අවධාරණය කළ කුමාරස්වාමි ඒ සම්බන්ධ ව ප්‍රසිද්ධ පුවත්පතකට ලිපියක් ලියමින් දේශීය ගෘහනිර්මාණ ශිල්පයේ අනන්‍යතාව තත්ත්වඥයන්ගේ අවධානයට හසු කළේ ය. මෙබඳු ගොඩනැගිලි පිළිබඳ ව කිසිවකුගේත් නෙත්සිත් යොමු නොවුණු වකවානුවක මේ සිදුවීම විශේෂයෙන් සැලකිය යුතු කරුණකි.

(ලකුණු 10 යි)

### අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

| | | |
|---|---|---|
| ලකුණු විග්‍රහය | - | මුළු ලකුණු 10 යි. |
| අන්තර්ගතය | - | ප්‍රධාන අදහස් සඳහා ලකුණු 06 යි. |
| වචන ගණන | - | ලකුණු 02 යි. (වචන 50 - 60 අතර තිබීම සෑහේ.) |
| ශිල්පීය දක්ෂතා | - | ලකුණු 02 යි. (වියරණ, අත් අකුරු, විරාම ලක්ෂණ ආදිය) |


අපේක්ෂිත ප්‍රධාන අදහස් :

- පෙරදිග සංස්කෘතියේ හරය අපරදිගට හඳුන්වා දුන් විද්වත්තු කිහිපදෙනෙකි
- ඔවුන්ගේ නිර්මාණ ශක්තිය, මානව දයාව හා දැනුම් සම්භාරය තවමත් බැබළෙමින් පවතී
- සංස්කෘත භාෂාව, සංගීතය, කාලාව, බෞද්ධ දර්ශනය හා සංස්කෘතිය එවැනි අංශ කිහිපයකි.
- මෙරට සංස්කෘතිය ලෝකයට හඳුන්වා දුන් ආනන්ද කුමාරස්වාමි සුවිශේෂ විද්වතෙකි.

- ඔහු විසින් රචිත ''මධ්‍යකාලින සිංහල කලා'' විශිෂ්ට සාහිත්‍ය කෘතියකි
- ඔහුගේ ලේඛන දේශීය ගෘහ නිර්මාණ ශිල්පයේ අනන්‍යතාව විදහා දැක්වීමට සමත් විය

වචන ගණන 65 ඉක්මවන කල්හි සැලකිය යුත්තේ මුල් වචන 60 තුළ ඇති ප්‍රධාන අදහස් පමණි. වචන ගණන 45 ට අඩුවන කල්හි එහි ඇතුළත් අදහස් ගණනය කොට ඊට සුදුසු අනුපාතික ලකුණක් පිරිනමන්න. උත්තරය ඡේදයක් සේ ලියා තිබිය යුතුය. කොටුවක් තුළ පද බෙදා තිබුණ ද පිළිගන්න. එක යට එක අසම්බන්ධිත වාක්‍ය වශයෙන් ලියා ඇත්නම් අන්තර්ගතයට දිය හැකි උපරිම ලකුණු ගණන 02 කි. වචන ගණනයේ දී ලිහිල් පිළිවෙතක් අනුගමනය කරන්න. වචන ගණන දළ වශයෙන් 65 ට වැඩිවන කල්හි හෝ 45 ට අඩුවන කල්හි වචන ගණන සඳහා ලකුණු 01 හෝ 02 හෝ පිරිනමන්න.

### 3 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන




මෙම ප්‍රශ්නයට පිළිතුරු සපයා ඇති අයදුම්කරුවන්ගේ ප්‍රතිශතය 96%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 10ක් හිමිවේ.
ඉන් ලකුණු 00 - 02 ප්‍රාන්තරයේ 4%ක් ද,
ලකුණු 03 - 05 ප්‍රාන්තරයේ 24%ක් ද,
ලකුණු 06 - 07 ප්‍රාන්තරයේ 49%ක් ද,
ලකුණු 08 - 10 ප්‍රාන්තරයේ 23%ක් ද,
ලකුණු ලබාගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා හිමි ලකුණු 10න් හරි අඩකට වැඩියෙන් එනම් ලකුණු 6ක් හෝ වැඩි ප්‍රමාණයක් හිමිකරගෙන ඇති අයදුම්කරුවන්ගේ ප්‍රතිශතය 72%කි. ලකුණු 5ක් හෝ ඊට අඩුවෙන් ලබාගෙන ඇත්තේ අයදුම්කරුවන්ගෙන් 28%ක් පමණි.

අනිවාර්ය ප්‍රශ්නයක් වූ සාරාංශකරණය සඳහා ඉදිරිපත් වන ශිෂ්‍ය ප්‍රමාණය ඉහළ මට්ටමක පවතින අතර ඔවුන්ගෙන් 72%ක බහුතරයක් ප්‍රදානය කෙරෙන ලකුණුවලින් අඩකට වැඩියෙන් ලබා ගැනීමට සමත් වී ඇත. ඒ අනුව ප්‍රශ්නයේ සමස්ත පහසුතාව 61% තෙක් වර්ධනය වී ඇත.

අයදුම්කරුවන් තුළ සාරාංශකරණය පිළිබඳ මනා පුහුණුවක් තිබිය යුතුය. ඒ සඳහා නිරන්තර අභ්‍යාසවල යෙදීම අනිවාර්ය වේ. අපේක්ෂිත සාරාංශකරණය සඳහා ආකෘතියක් පහත දැක්වේ.

**සාරාංශකරණය**

පෙර දිග සංස්කෘතියේ හරය අපරදිගට හඳුන්වා දුන් ශාස්ත්‍රඥයෝ කිහිප දෙනෙක් වෙති. ඔවුන්ගේ නිර්මාණ ශක්තිය මානව දයාව හා දැනුම් සම්භාරය තවමත් බැබළෙමින් පවතී. සංස්කෘත භාෂාව, දර්ශනය, සංගීතය, සිතුවම් කලාව, බෞද්ධ දර්ශනය, සංස්කෘතිය එවැනි අංග කීපයකි. මෙරට සංස්කෘතිය ලෝකයට හඳුන්වා දුන් ආනන්ද කුමාරස්වාමි සුවිශේෂ විද්වතෙකි. ඔහු ලියූ අනර්ඝ ග්‍රන්ථ සමූහය අතුරෙන් "මධ්‍ය කාලීන සිංහල කලා" විශිෂ්ට සාහිත්‍ය කෘතියකි. දේශීය ගෘහ නිර්මාණ ශිල්පයේ අනන්‍යතාව විදහා දැක්වීමට ද ඔහු සමත් විය. (වචන 54)

04 ප්‍රශ්නය

අපේක්ෂණය : අපේක්ෂකයින්ගේ භාෂා ඥානය හා අවබෝධය පරීක්ෂා කෙරෙන්නකි. මේ සඳහා නිර්දිෂ්ට ඡේදයක් ආශ්‍රයෙන් ප්‍රශ්න 5ක් ඉදිරිපත් කෙරේ. මේ ප්‍රශ්න මනාව අවබෝධ කරගෙන නිශ්චිත ව නිවැරදි පිළිතුරු ලිවීම අපේක්ෂා කෙරේ.

**4.** පහත දැක්වෙන ඡේදය කියවා අසා ඇති **ප්‍රශ්නවලට උත්තර** සපයන්න.

සාගරය ගවේෂණය කිරීමේ දී මිනිසා මුහුණ දෙන බාධක කිහිපයකි. එයින් බලවත් ම බාධකය නම් සාගර ජලකඳ මගින් ඇති කරනු ලබන පීඩනය හෙවත් තෙරපුමයි. කිමිදුම්කරුවකුට ආරක්ෂා සහිත ව කිමිදෙන්නට හැකි වනුයේ අඩි 200–300 දක්වා ගැඹුරක පමණි. ඉන් ඔබ්බෙහි ඇති පීඩනය මිනිස් සිරුරට ඔරොත්තු නොදෙන්නකි. හිරු එළිය අඩුවීම, සාගර පතුලේ දී මිනිසාට මුහුණ පෑමට සිදු වන තවත් බාධකයකි. අඩි දසදහසකට වඩා ගැඹුරකට විහිදෙන මුහුදු ආගාධවලට හිරු එළිය නොලැබෙන තරම් ය. එබැවින් සියලු පරීක්ෂණ යාත්‍රාවලට මේ අන්ධකාරය විනිවිද යැමට තරම් ප්‍රබල ආලෝකධාරා රැගෙන යැමට සිදු වේ. 1955 දී න්‍යෂ්ටික බලයෙන් ක්‍රියාකරන ප්‍රථම සබ්මැරීනය වූ නෝටිලස් නිපදවන ලදී. මෙතෙක් කිසිවකුට ළඟා විය නොහැකි ව තිබූ උත්තරධ්‍රැවයේ හිම තට්ටුව යටින් ගොස් අනෙක් පසින් මතුවීමට නෝටිලස් සබ්මැරීනය මිනිසාට උපකාරී විය. එතෙකුදු වුවත් ශාන්තිකර සාගරයේ පිහිටි මැරියානා ආගාධය දක්වා මෙතෙක් ගමන් කර ඇත්තේ මිනිසුන් දෙදෙනකු පමණි. ඔවුහු ඒ සඳහා 'බැකිස්කාෆ්' නම් කුඩා විද්‍යාත්මක සබ්මැරීනයක් යොදාගත්හ.

(i) සාගර ගවේෂණයේ දී මිනිසා මුහුණ දෙන ප්‍රධානතම බාධකය කුමක් ද?
(ii) මිනිසකුට මුහුදේ අඩි 200–300කට වඩා ගැඹුරට කිමිදෙන්නට නොහැකි ඇයි?
(iii) මුහුදු පතුලට හිරු එළිය නොලැබීමේ බාධකය පරීක්ෂණ යාත්‍රා ජයගත්තේ කෙසේ ද?
(iv) නෝටිලස් සබ්මැරීනය උපකාරයෙන් මිනිසා කළේ කුමක් ද?
(v) ඉහත ඡේදයෙන් සාකච්ඡා කර ඇත්තේ කවර මාතෘකාවක් ගැන ද?

(ලකුණු 10 යි)

අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

(i) සාගර ජලකඳ මගින් ඇති කරන පීඩනය (තෙරපුම)

(ii) පීඩනය මිනිස් සිරුරට ඔරොත්තු නොදෙන නිසා/ පීඩනය මිනිස් සිරුරට ඔරොත්තු නො"ම/ හිරු එළිය අඩු වීම (එක් උත්තරයක් තිබීම සෑහේ)


(iii) අන්ධකාරය විනිවිද යැමට තරම් ප්‍රබල ආලෝක ධාරා රැගෙන යෑම/ ප්‍රබල ආලෝක ධාරා රැගෙන යෑම

(iv) උත්තර ධ්‍රැවයේ හිම තට්ටු යටින් ගොස් අනෙක් පසින් මතු වීම


(v) සාගර ගවේෂණය/ සාගර ගවේෂණයේ " මතු වන බාධා/ සාගර ගවේෂණයේ " මතු වන බාධා ජය ගැනීම/ ආගාධ සාගර ගවේෂණය/ මුහුදු ආගාධය ජය ගැනීම/ මුහුදු පතුලට කිමිදීම

4 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන

ප්‍රශ්නය සඳහා ලකුණු ලබා ඇති ආකාරය




4 ප්‍රශ්නය තෝරාගෙන ඇති පිරිස 95%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 10ක් හිමි වේ.
ඉන් ලකුණු 00 - 02 ප්‍රාන්තරයේ 2%ක් ද,
ලකුණු 03 - 05 ප්‍රාන්තරයේ 5%ක් ද,
ලකුණු 06 - 07 ප්‍රාන්තරයේ 14%ක් ද,
ලකුණු 08 - 10 ප්‍රාන්තරයේ 79%ක් ද,
ලකුණු ලබාගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 06ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් පිරිස 93%ක් වන අතර, 07%ක් ලබාගෙන ඇත්තේ ලකුණු 05ක් හෝ ඊට අඩුවෙනි.




මෙම ප්‍රශ්නයට අයත් කොටස් 5 අතුරෙන් පිළිතුරු සැපයීම වඩාත් සාර්ථක වී ඇත්තේ (i) කොටස සඳහාය. එහි පහසුතාව 97% කි. (ii), (iii), (iv), (v) කොටස්වල පහසුතාව පිළිවෙළින් 95%, 74%, 93% සහ 78%කි. (iii) සහ (v) කොටස්වල පහසුතාව අඩු මට්ටමක පවතින අතර (i), (ii), (iv) කොටස්වල පහසුතාව ප්‍රශස්ත මට්ටමක පවතී.

ඉදිරිපත් කර ඇති ඡේදය ඇසුරෙන් අපේක්ෂිත අයදුම්කරුවන්ගේ අවබෝධය මැනීම තවදුරටත් සංවර්ධනය කිරීම සඳහා බාහිර පොත පත, මුද්‍රිත සඟරා ආදිය, පරිශීලනය සඳහා ඔවුන් යොමු කරලීම මෙන් ම පන්ති කාමරය තුළ අර්ථාවබෝධ අභ්‍යාස හුරු කිරීම ද කළ යුතුය.

දෙන ලද පාඨය කියවා අසන ලද ප්‍රශ්නයට නිශ්චිත පිළිතුරු තෝරා ගැනීමේ හැකියාව ඇතැම් අපේක්ෂකයන්ට නොතිබුණු බව පැහැදිලි වන බැවින් අදාළ පිළිතුරු ඍජුව තෝරා ගෙන නිශ්චිතව ඉදිරිපත් කිරීමට අයදුම්කරුවන් යොමු කළ යුතුව ඇත.

මේ ප්‍රශ්නයට පිළිතුරු සැපයීම වඩාත් සාර්ථක මට්ටමක පැවති බව පෙනේ. අවබෝධය පිළිබඳ ව විමසා තිබූ ප්‍රශ්න පහේ පහසුතා 70% ඉක්මවා තිබිණි. ඒ අනුව මෙම ප්‍රශ්නයෙහි සමස්ත පහසුතාව 84%ක පමණ ඉහළ අගයක් ගන්නා අතර II පත්‍රයෙහි ප්‍රශ්න පහ අතුරෙන් පහසුතාව වැඩිම ප්‍රශ්නය බවට මෙම ප්‍රශ්නය පත්ව ඇත.

මේ තත්ත්වය තවදුරටත් සංවර්ධනය කිරීම සඳහා බාහිර පොත් පත් පරිශීලනයට සිසුන් උනන්දු කරවීම ගුරුභවතුන්ගේ කාර්යයකි. එහිලා දුරවබෝධ වචනවල අර්ථාවබෝධයට ද සිසුන් යොමු කළ යුතු වෙයි.

05 ප්‍රශ්නය

අපේක්ෂණය : මෙහි එක් ප්‍රශ්නයක් වන්නේ රාජකාරි ලිපියක් ලිවීමයි. එහිම අනෙක් ප්‍රශ්නය වනුයේ පුවත්පත් වාර්තාවක් සකස් කිරීමයි. මෙබඳු ප්‍රශ්න මගින් නූතන සමාජයෙහි විවිධ ප්‍රායෝගික ලේඛන පිළිබඳ අධ්‍යයනය හා ඒවා සිත් ගන්නා පරිදි නිර්මාණාත්මකව ලියා දැක්වීමත් පිළිබඳ අපේක්ෂකයින්ගේ කුසලතාව විමර්ශනය කෙරේ.

**5.** සිරිපුර ග්‍රාමෝදය සමිතිය මගින් ප්‍රදේශයේ තරුණ නාට්‍යකරුවන් සඳහා වැඩමුළුවක් සංවිධානය කර ඇත. වැඩමුළුව පැවැත්වෙන දිනය 2016 ජනවාරි මස 20 වන අතර වේලාව පෙ.ව. 9.00 සිට ප.ව. 7.00 දක්වා වේ. ප්‍රධාන අමුත්තා වශයෙන් ප්‍රවීණ නාට්‍යවේදී නයන කලාපති මහතා සහභාගි වීමට නියමිත ය. වැඩමුළුව අවසානයේ කෙටි නාට්‍ය තුනක් ද වේදිකාගත වේ. වැඩමුළුව පැවැත්වෙන ස්ථානය වශයෙන් තෝරාගෙන ඇත්තේ සිරිපුර යොවුන් රඟහලයි.

පූර්වෝක්ත වැඩමුළුව සඳහා සිරිපුර යොවුන් රඟහල ලබා දෙන මෙන් ඉල්ලා ප්‍රාදේශීය ලේකම්තුමා වෙත යැවෙන රාජකාරි ලිපිය ලියන්න. ග්‍රාමෝදය සමිතියේ ලේකම් කවිඳු උඩවත්ත ඔබ යැ'යි සිතන්න.

(මේ සඳහා වචන **100**ක් පමණ ප්‍රමාණවත් ය.)

**නැතහොත්**

සිරිපුර එක්සත් සුබසාධක සංගමයට ආධාර ලබා ගැනීම පිණිස 2016 ජනවාරි මස 16 වැනි දින සිරිපුර යොවුන් රඟහලේ දී පියල් දමයන්තගේ 'මහසයුර කැළඹෙයි' නාට්‍යය පෙන්වීමට සැලසුම් කර ඇත. පෙ. ව. 10.30 හා ප. ව. 2.30 වශයෙන් දර්ශන වාර දෙකක් පැවැත්වෙන අතර 10.30 දර්ශනය පාසල් දරුවන්ට වෙන් කර ඇත.

ප. ව. 2.30 දර්ශනය නැරඹීමට ආරාධනා කරමින් සිරිපුර ප්‍රදේශීය ලේකම්තුමා වෙත යැවෙන ආරාධනා පත්‍රය සකස් කරන්න. සංගමයේ ලේකම් සඳරු වැලිවත්ත ඔබ යැ'යි සිතන්න.

(මේ සඳහා වචන **100**ක් පමණ ප්‍රමාණවත් ය.) (ලකුණු 15 යි)

**අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය**

රාජකාරි ලිපිය

01. ආකෘතිය සඳහා ලකුණු 05 යි
02. අන්ත ගතය සඳහා ලකුණු 07 යි
03. ශිල්පීය දක්ෂතා සඳහා ලකුණු 03 යි

01. ආකෘතිය සඳහා ලකුණු 05 යි

| | |
|---|---|
| යවන්නාගේ නම, ලිපිනය, ක්ෂනය | ලකුණු 01 |
| ලබන්නාගේ ලිපිනය | ලකුණු 01 |
| ආමන්ත්‍රණය | ලකුණු 01 |
| මාතෘකාව | ලකුණු 01 |
| තනතුර හා අත්සන | ලකුණු 01 |

02. අන්ත ගතය සඳහා ලකුණු 07 යි

අන්ත ගත විය යුතු ප්‍රධාන කරුණු

| | | |
|---|---|---|
| 1 | වැඩමුළුවක් සංවිධානය කිරීම | ලකුණු 01 |
| 2 | වැඩමුළුවක් පැවැත්වෙන දිනය | ලකුණු 01 |
| 3 | ස්ථානය | ලකුණු 01 |
| 4 | වේලාව | ලකුණු 01 |
| 5 | ප්‍රධාන ආරාධිත අමුත්තා | ලකුණු 01 |
| 6 | කෙටි නාට්‍ය තුනක් පැවැත්වෙන බව | ලකුණු 01 |
| 7 | රඟහල ලබා දෙන ලෙස ඉල්ලීමක් කිරීම | ලකුණු 01 |

(එක් කරුණකට ලකුණු 01 බැගින් ලකුණු 07 යි)

03. ශිල්පීය දක්ෂතා සඳහා ලකුණු 03යි

නිවැරදි අක්ෂර වින්‍යාසය, උක්ත ආඛ්‍යාත පද සම්බන්ධය, පැහැදිලි අත්අකුරු, නිවැරදි පද බෙදීම, වියරණ, විරාම ලක්ෂණ, ඡේද වෙන් කිරීම සමස්තයක් ලෙස සලකා ලකුණු පිරිනමන්න.

* නියමිත වචන ගණන අඩු වන කල්හි හෝ ප්‍රමාණවත් කරුණු හෝ අදාළ කරුණු අන්ත ගත නොවන අඩුපාඩු සහිත උත්තර ඇති කල්හි අනුපාතික ලකුණක් දෙන්න.
* නියමිත ආකෘතිය අනුගමනය කර නොමැති කල්හි අන්ත ගතය සඳහා දිය හැකි උපරිමය ලකුණු 03 කි.

ආරාධනා පත්‍රය - ලකුණු 15යි

1, 2, 3 යන අංශ සඳහා ලකුණු වෙන් වෙන්ව දී ලකුණු එකතුව ලබාගන්න.

01. ආකෘතිය සඳහා ලකුණු 05යි
02. අන්ත ගතය සඳහා ලකුණු 07යි
03. ශිල්පීය දක්ෂතා සඳහා ලකුණු 03යි

01. ආකෘතිය සඳහා ලකුණු 05 යි

- කෙටි මාතෘකාව ලකුණු 01
- ආරාධනය කරන්නේ කවු ද? ලකුණු 01
- පළ කරන ක්‍ෂනය ලකුණු 01
- නිර්මාණශීලිභාවය ලකුණු 02

02. අන්තර්ගතය සඳහා ලකුණු 07 යි


| | | |
|---|---|---|
| 1. | එක්සත් සුහසාධක සංගමයට ආධාර පිණිස | ලකුණු 01 |
| 2. | නාට්‍යකරුගේ හා නාට්‍යයේ නම | ලකුණු 01 |
| 3. | දිනය | ලකුණු 01 |
| 4. | ස්ථානය | ලකුණු 01 |
| 5. | දර්ශන වාර දෙකක් තිබෙන බව | ලකුණු 01 |
| 6. | පාසල් දර්ශන වේලාව | ලකුණු 01 |
| 7. | ප්‍රාදේශීය ලේකම්තුමාට ආරාධනා කිරීම | ලකුණු 01 |

03. ශිල්පීය දක්ෂතා සඳහා ලකුණු 03යි

නිවැරදි අක්ෂර වින්‍යාසය, උක්ත ආඛ්‍යාත පද සම්බන්ධය, පැහැදිලි අත්අකුරු, නිවැරදි පද බෙදීම, වියරණ, විරාම ලක්ෂණ, ඡේද වෙන්කිරීම සමස්තයක් ලෙස සලකා ලකුණු පිරිනමන්න.

- නියමිත වචන ගණන අඩු වන කල්හි හෝ ප්‍රමාණවත් කරුණු හෝ අදාළ කරුණු අන්ත ගත නොවන අඩුපාඩු සහිත උත්තර ඇති කල්හි අනුපාතික ලකුණුක් දෙන්න.
- නියමිත ආකෘතිය අනුගමනය කර නොමැති කල්හි අන්තර්ගතය සඳහා දිය හැකි උපරිමය ලකුණු 03 කි.


## 5 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන




5 ප්‍රශ්නය තෝරාගෙන ඇති අපේක්ෂකයින් සංඛ්‍යාව 93% කි. ලකුණු 15ක් හිමිවන මෙම ප්‍රශ්නය සඳහා

ඉන් ලකුණු 00 - 03 ප්‍රාන්තරයේ 3%ක් ද,
ලකුණු 04 - 07 ප්‍රාන්තරයේ 13%ක් ද,
ලකුණු 08 - 11 ප්‍රාන්තරයේ 34%ක් ද,
ලකුණු 12 - 15 ප්‍රාන්තරයේ 50%ක් ද,
ලකුණු ලබාගෙන ඇත.

මෙම ප්‍රශ්නය යටතේ (අ) සහ (ආ) ලෙස ප්‍රශ්න දෙකක් ඇතුළත් ය. අපේක්ෂකයාට පහසු ප්‍රශ්නය තෝරා ගෙන පිළිතුරු ලිවීමේ අවස්ථාව ලබා දී ඇත.




5 ප්‍රශ්නයේ (අ) කොටස සඳහා අපේක්ෂකයින්ගේ පහසුතාව 74%ක්ද, (ආ) කොටසෙහි පහසුතාව 55%ක්ද වේ. මේ අනුව මෙම ප්‍රශ්නයේ (අ) කොටස පහසුතාව වැඩි කොටස ලෙස දැක්විය හැකිය.

ප්‍රායෝගික ලේඛන යටතේ සැකසුණු රාජකාරි ලිපියේ ආකෘතිය සඳහා ලකුණු 05ක්ද, අන්තර්ගතය සඳහා ලකුණු 07ක් ද, ශිල්පීය දක්ෂතා සඳහා ලකුණු 03ක්ද වෙන් කර ඇත.

ආරාධනා පත්‍රයෙහි ආකෘතියට ලකුණු 5ක් ද, අන්තර්ගතයට ලකුණු 7ක් ද, ශිල්පීය දක්ෂතා සඳහා ලකුණු 3ක් ද වෙන් කර ඇත.

මෙහිදී අන්තර්ගතයට වෙන් කර ඇති ප්‍රධාන කරුණු හඳුනා ගැනීමට සිසුන් හුරුකළ යුතු ය. එසේ වූ කල්හි අන්තර්ගතයට වෙන් කර ඇති මුළු ලකුණු අපේක්ෂකයන්ට හිමි කර ගැනීමට පහසු වේ.

මෙම ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීම සතුටුදායකය. නියමිත ප්‍රායෝගික ලේඛන ආකෘතියකට අනුව ලිවීම හුරුකළ යුතු ය. පහසුතා මට්ටම ඉහළ මෙබඳු ප්‍රශ්න සඳහා සතුටු දායක පිළිතුරු ලිවීමට නිරවුල් අවබෝධයක් ලබාගැනීම පිණිස ආදර්ශ ලිපියක ආකෘතියක් පහත දක්වා ඇත.

විවිධ ආරාධනා පත්‍රවල ආකෘති පිළිබඳ ව අපේක්ෂකයන් දැනුවත් කොට ඒ පිළිබඳ ව අභ්‍යාසවල යෙදවීම සුදුසු ය.

ආදර්ශ ලිපියේ ආකෘතිය

ලියන්නාගේ නම/තනතුර
ලියන්නාගේ ලිපිනය
දිනය :

ලබන්නා
ලිපිනය
ආමන්ත්‍රණය

ලිපි ශීර්ෂය

* ලිපිය ලිවීමේ අරමුණ
* සම්බන්ධතාව
* අදාළත්වය/විස්තරය
* වර්තමාන ස්වභාවය/තත්ත්වය
* ඉල්ලීම/අවධානය

යොමුව
අත්සන
(නම)

## 2.3 III ප්‍රශ්න පත්‍රය

### 2.3.1 III ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය

**කාලය පැය 02 යි. මුළු ලකුණු** 80 කි.

සිංහල භාෂාව හා සාහිත්‍යය III ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න 7කින් සමන්විතය.
මෙහි 1, 2, 3, 4 ප්‍රශ්න අනිවාර්ය වේ.

නිර්දිෂ්ට ග්‍රන්ථ පිළිබඳව අපේක්ෂකයින්ගේ අවබෝධය විචාරාත්මක හා තර්කානුකූල දැනුම, භාෂා ඥානය, සාහිත්‍යාවබෝධය හා රසවින්දන හැකියාව පරීක්ෂා කෙරෙන පළමු ප්‍රශ්නය සඳහා අනුකොටස් දහයක් ඇතුළත් වේ. එක් අනු ප්‍රශ්නයක එක් කොටසකට ලකුණු 1 බැගින් මුළු ලකුණු 20කි.

නිර්දිෂ්ට සාහිත්‍ය ග්‍රන්ථ පරිශීලනය පිළිබඳ පරිචය ඇගයීම කෙරෙයි.

දෙවන ප්‍රශ්නය යොමු වන්නේ නිර්දිෂ්ට ග්‍රන්ථවල යෙදූ භාෂාවේ අර්ථාවබෝධය පිළිබඳ අපේක්ෂකයින් සතු දැනුම පරීක්ෂා කිරීමටයි. මෙහිදී නිර්දිෂ්ට පාඨ හතරක් ලබාදෙන අතර ඒ පාඨ හතරෙහි තද කළු වචන අට සඳහා වචන වල අරුත් ලියා අනතුරුව සමස්ත පාඨවල අර්ථය තම බසින් ලියා දැක්වීම කළ යුතුය. මේ සඳහා එක් කොටසකට ලකුණු 5 බැගින් ලකුණු විස්සකි.


3-4 ප්‍රශ්න නිර්දිෂ්ට ග්‍රන්ථ පිළිබඳ අපේක්ෂකයින්ගේ විශ්ලේෂණාත්මක දැනුම පරීක්ෂා කිරීම අපේක්ෂාවයි. මෙහිදී "නැතහොත්" යන්නෙන් දරුවාට විකල්ප ප්‍රශ්නයක් තෝරා ගැනීමට හැකියාව ඇත.

3, 4 ප්‍රශ්න දෙකේම මේ ලෙසින් විකල්ප ප්‍රශ්න තෝරා ගත හැකිය මේ සඳහා එක් ප්‍රශ්නයකට ලකුණු 15 බැගින් ලබාදේ.

5, 6, 7 ප්‍රශ්නවලින් අපේක්ෂකයින්ගේ පිළිතුරු සැපයිය යුත්තේ එකකට පමණි. මෙම අභිමතාර්ථය වනුයේ නිර්දිෂ්ට ග්‍රන්ථ ආශ්‍රිතව අපේක්ෂකයින් තුළ පවත්නා විශ්ලේෂණාත්මක, විචාරාත්මක, තර්කානුකූල දැනුම හා රසඥතාව මැන බැලීමයි. මේ සඳහා ලකුණු 10ක් වෙන් කර ඇත.

**2.3.2 III ප්‍රශ්න පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු, ලකුණු දීමේ පටිපාටිය, පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන**

III පත්‍රය සඳහා පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, ප්‍රස්තාර 5, 6 හා 7 ඇසුරෙන් සකස් කර ඇත. එක් එක් ප්‍රශ්නයට අදාළ ප්‍රස්තාර, ඒ ඒ ප්‍රශ්නයේ නිරීක්ෂණ හා නිගමන සමග දක්වා ඇත.




(RD/16/04/OL පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරෙන් සකස් කරන ලදි.)

දෙවන ප්‍රශ්නය යොමු වන්නේ නිර්දිෂ්ට ග්‍රන්ථවල යොදා ඇති භාෂාවේ අර්ථාවබෝධය පිළිබඳ අයදුම්කරුවන් සතු දැනුම පරීක්ෂා කිරීමට ය. මෙහිදී නිර්දිෂ්ට පාඨ හතරක් ලබාදෙන අතර ඒ පාඨ හතරෙහි ඇතුළත් තද කළු අකුරින් සඳහන් වචන අට සඳහා අරුත් ලියා අනතුරුව සමස්ත පාඨවල අර්ථය සරල බසින් ලියා දැක්වීම කළ යුතු ය. මේ සඳහා එක් කොටසකට ලකුණු 5 බැගින් ලකුණු විස්සකි.

3-4 ප්‍රශ්න නිර්දිෂ්ට ග්‍රන්ථ පිළිබඳ අපේක්ෂකයින්ගේ විශ්ලේෂණාත්මක දැනුම ඇගයීම මූලික අපේක්ෂාවයි. මෙහිදී "නැතහොත්" යන්නෙන් අයදුම්කරුවන්ට විකල්ප ප්‍රශ්නයක් තෝරා ගැනීමට ද හැකියාව ඇත.

3, 4 ප්‍රශ්න දෙකේම මේ ලෙසින් විකල්ප ප්‍රශ්න තෝරා ගත හැකිය මේ සඳහා එක් ප්‍රශ්නයකට ලකුණු 15 බැගින් හිමි වේ.

සිංහල භාෂාව හා සාහිත්‍යය III පත්‍රයේ 2, 3, 4 ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීම අනිවාර්ය වූ අතර එහි 2 වන ප්‍රශ්නය සඳහා පහසුතාව 46%කි.

3 වන ප්‍රශ්නය කොටස් 2කින් සමන්විත වූ අතර වැඩිම පහසුතාව 63%ක් ලබාගෙන ඇත්තේ 3 වන ප්‍රශ්නයේ II කොටසට වේ. එහි I කොටසට පහසුතාව 52%කි.

4 වන ප්‍රශ්නය ද කොටස් දෙකකින් යුක්ත වන අතර I කොටසේ පහසුතාව 54%ක් වන විට II කොටසේ පහසුතාව 44%කි. එය 3, 4 ප්‍රශ්නවල අඩුම පහසුතාව වේ.

5, 6, 7 ප්‍රශ්නවලින් අපේක්ෂකයින්ගේ පිළිතුරු සැපයිය යුත්තේ එක් ප්‍රශ්නයකට පමණි. මෙහි අභිමතාර්ථය වනුයේ නිර්දිෂ්ට ග්‍රන්ථ ආශ්‍රිතව අපේක්ෂකයින් තුළ පවත්නා විශ්ලේෂණාත්මක, විචාරාත්මක, තර්කානුකූල දැනුම හා රසඥතාව මැන බැලීමයි. මේ සඳහා ලකුණු 10ක් වෙන් කර ඇත. මෙකී ප්‍රශ්න අපේක්ෂක තෝරා ගැනීම මත සැකසුණකි. මෙහිදී වැඩිම පහසුතාව 65% ලබාගෙන ඇත්තේ 5 වන ප්‍රශ්නයට වේ. දුෂ්කරම පහසුතාව 43%ක් වූ අතර එය 6 වන ප්‍රශ්නය සඳහා ලබා ගෙන තිබුණි.

01. ප්‍රශ්නය

අපේක්ෂණය : නිර්දිෂ්ට ග්‍රන්ථ පරිශීලනය පිළිබඳ පරිචය ඇගයීම

ව්‍යුහය හා ලකුණු විග්‍රහය : මුළු ලකුණු 20යි.
මෙම ප්‍රශ්නයට කෙටි පිළිතුරු අපේක්ෂිත අනුකොටස් දෙක බැගින් යුත් කෙටි ප්‍රශ්න දහයක් ඇතුළත් වේ. එක් අනුකොටසකට ලකුණු 01 බැගින් මුළු ලකුණු 20 කි.

**1.** (i) සිට (x) තෙක් ඇති **සියලු ම** අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර **නොලියන්නේ නම්, එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න**.

(i) (අ) රාහුල් ජුගේ චරිතය ඇතුළත් කෙටිකතාවේ මුල් රචකයා නම් කරන්න.
(ආ) රාහුල් ජුගේ චරිතයෙන් ඉස්මතු කෙරෙන යහපත් ගුණාංගය කුමක් ද?

(ii) "එහෙම වුණත් මා නොදන්න දෙයක් තියෙනවා අහන්න
දන්න කෙනෙක් හොයා බලා මට මේ ගැන කියා දෙන්න."
(අ) මේ ප්‍රකාශය කරන්නේ කවරෙක් ද?
(ආ) ඔහු පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්නය ඉදිරිපත් කෙරෙන කවි **දෙපදය** ලියන්න.

(iii) "මාලු ටික කපුටන් ගෙනියපුවහම අපේ බඩේ වැලි"
(අ) මේ ප්‍රකාශය ඇතුළත් කතාවේ කතුවරයා නම් කරන්න.
(ආ) මෙහි 'බඩේ වැලි' යන යෙදුමෙන් ප්‍රකාශ කෙරෙන අර්ථය දක්වන්න.

(iv) (අ) ඇන්ටන් චෙකොෆ්ගේ කෘතියක පරිවර්තනයක් සිංහල සාහිත්‍ය සංග්‍රහය පෙළ පොතේ ඇතුළත් වේ. එහි නම කුමක් ද?
(ආ) එහි පරිවර්තකයා නම් කරන්න.

(v) (අ) "කිසාගෝතමියක නොවේ" පැදි පෙළෙහි, මවගේ ළමැදෙහි ගුළි වී සිටියේ කෙබඳු බිළිඳෙක් ද?
(ආ) පද්‍ය නිර්මාණයට අමතරව දයාසේන ගුණසිංහ සිය ප්‍රතිභාව විදහා දැක්වූ තවත් සාහිත්‍යාංගයක් නම් කරන්න.

(vi) පහත දැක්වෙන සාහිත්‍ය කෘති රචනා කෙරුණු රාජධානි යුග නම් කරන්න.
(අ) සද්ධර්මරත්නාවලිය
(ආ) යසෝදරාවත

(vii) ".... මපුතණුවන්ට සමාධියක් කරන්න."
(අ) මේ ප්‍රකාශය කරන ලද්දේ කිනම් අවස්ථාවක ද?
(ආ) මෙහි 'මපුතණුවන්' ලෙස හැඳින්වෙන්නේ කවරෙක් ද?

(viii) පහත දැක්වෙන ජාතක කථා පදනම් කර ගෙන ලියැවී ඇති කාව්‍ය ග්‍රන්ථ නම් කරන්න.
(අ) සත්තුභත්ත ජාතකය
(ආ) චන්ද කින්නර ජාතකය

(ix) "කැරලුත් මහෝත්සාහයෙන් විද ගත් ගස් සිදුරුවලින් ගිරවුන් ප්‍රයෝජන විඳිනා සේ මා රැස් කළ සම්පතින් වුවමනා ප්‍රයෝජන විඳින්නේ බත් බැළයාණෝ ය."
(අ) මේ ප්‍රකාශය කරන්නේ කවරෙක් ද?
(ආ) මේ ප්‍රකාශය රසවත් කිරීමට භාවිත කර ඇති කාව්‍ය අලංකාරය නම් කරන්න.

(x) (අ) 'කිඳුරු වලප' කවි පෙළ රචනා කර ඇති කාව්‍ය ආකෘතිය කුමක් ද?
(ආ) යසෝදරාවත රචනයේ දී භාවිත කර ඇති සුප්‍රකට විරිත නම් කරන්න.

(ලකුණු 02 × 10 = 20 යි.)

අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

1. (i) (අ) ලතීෆ් කාශ්මීරි
(ආ) උදාරත්වය/ අවංකත්වය/ නිහතමානි බව වැනි සුදුසු උත්තරයක් තිබිය යුතු ය.

(ii) (අ) පියසේන
(ආ) තුනේ ඉඳපු පුංචි බේබි හතරේ පන්තියට ගිහින්
තුනේ ඉඳපු මම හතරට යන්නේ කවදාද ඉතින්

(iii) (අ) මහාචාර්ය ඒ.වී. සුරවීර
(ආ) බඩගින්නේ සිටීමට සිදු වන බව
ආහාර කිසිවක් නොලැබෙන බව වැනි සුදුසු උත්තරයක් තිබිය යුතු ය.

(iv) (අ) මගුල් ප්‍රස්තාව
(ආ) යූ.ඒ. ගුණසේකර

(v) (අ) නොමළ බිළිඳෙකි/ සෙමින් මිය යන බිළිඳෙකි/ පණ අදින බිළිඳෙකි
(ආ) කෙටිකතා රචනය/ නව කථා පරිවර්තනය/ පුවත්පත් විශේෂාංග හා තීරු ලිපි

(vi) (අ) දඹදෙණිය
(ආ) මහනුවර


(vii) (අ) සාකේත නුවර සිටු දේවියගේ ශීර්ෂාබාධය සුව කළ අවස්ථාව
(ආ) ජීවක වෛද්‍යවරයා

(viii) (අ) කාව්‍යශේඛරය
(ආ) සඳ කිඳුරු දා කව


(ix) (අ) ගන්ධක සිටුවරයා
(ආ) උපමාලංකාර

(x) (අ) සිව්පද ආකෘතිය
(ආ) සමුද්‍රඝෝෂ විරිත/ සමුදුරු ගොස් විරිත

1 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන




1 ප්‍රශ්නය තෝරාගෙන ඇති පිරිස 98%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් හිමිවේ.
ඉන් ලකුණු 00 - 05 ප්‍රාන්තරයේ 14%ක් ද,
ලකුණු 06 - 10 ප්‍රාන්තරයේ 20%ක් ද,
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 31%ක් ද,
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 35%ක් ද,
ලකුණු ලබාගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 10ට අඩුවෙන් ලබාගත් පිරිස 34%කි.




මෙම ප්‍රශ්නයේ අනුකොටස් 10කි. ඒ අතුරෙන් III කොටස (අ) අනුකොටස සඳහා පහසුතාව 91%ක්ද II කොටස (අ) අනුකොටස සඳහා පහසුතාව 86%ක්ද (vi) (අ) අනුකොටස සඳහා පහසුතාව 84%ක්ද III (අ) සඳහා පහසුතාව 81%ක්ද වේ.

එහෙත් පහසුතාව අඩුම කොටස් වන්නේ (v) කොටස (ආ) අනුකොටස් ද (vii) (අ), (ආ) අනුකොටස් ද (ix) කොටස (ආ) අනුකොටස ද වන අතර ඒවා අනු පිළිවෙළින් 25%, 30%, 44%, 48% වේ.

පොදුවේ ගත කළ සෙසු ප්‍රශ්න සඳහා පහසුතාව 50% සිට 75% දක්වා ලබාගෙන ඇති බව පෙනේ.

මෙසේ වීමට හේතු ලෙස පහත සඳහන් කරුණු ඉදිරිපත් කළ හැකිය. (v) කොටස (ආ) අනු කොටසින් දයාසේන ගුණසිංහයන් සිය ප්‍රතිභාව දැක්වූ තවත් සාහිත්‍යාංගයක් දැක්වීමට ද, (vii) කොටස (අ) සහ (ආ) අනු කොටස් සඳහා පූජාවලිය ඇසුරෙන් අවස්ථා සම්බන්ධ දැක්වීමට ද (ix) කොටස (ආ) අනු කොටස කාව්‍යාලංකාර පිළිබඳවද නිශ්චිතව පිළිතුරු සැපයීමට බොහෝ අපේක්ෂකයන් අපොහොසත් වී ඇත. නිර්දිෂ්ට ග්‍රන්ථ පරිශීලනයේ ඇති දුර්වලතාව මේ සඳහා බලපා ඇති බව පෙනේ.

## 02 ප්‍රශ්නය

**අපේක්ෂණය :** දෙවන ප්‍රශ්නය ද අනිවාර්යය. මෙහිදී නිර්දිෂ්ට පාඨ පිළිබඳ අවබෝධය ඇතිව පාඨයෙහි අදහස දෙනු ලබන තද කළු අකුරෙන් මුද්‍රිත කොටස්වල අර්ථය වෙන් වෙන්ව නිසි ලෙස ලියා ඉන්පසු මුළු කොටසේම අර්ථය ලිහිල් බසින් ලිවීමේ කුසලතාව මැන බැලීම මෙහිදී මූලික අපේක්ෂාව විය.

**2.** පහත දැක්වෙන ගද්‍ය හා පද්‍ය පාඨවල **තද කළු අකුරෙන්** මුද්‍රිත කොටස්වල අර්ථය වෙන් වෙන් ව ලියන්න. ඉන් පසු මුළු කොටසේ ම අර්ථය ලිහිල් බසින් ලියන්න.

(i) "පෙර අප දැන ඇඳින
ඉඳිනා හෙයින් නොව වෙන
ගෙයි ඇති **නොපදමින**
කළෙමු වියදම් මොබ තිබූ **දන**"

(ii) "..... ජීවකයන් තමා **වඩාගත්** පවතුත් ඔවුන් ශිල්ප උගත් පරිදිත් **කල්‍යාණ** වූ ගුණ ඇති පරිදිත් කී ය."

(iii) "**සුදු සක** ලෙසට ඇත් පැටියෙක් විත් යහනේ
සුදු සොඬ ටිකෙන් මගෙ බඩ පිරිමදිති අනේ
**සුදු යම් දෙයක්** සිදු වෙයි මම දුටු සිනේ
සුදසුන් නිරිඳුනේ මොකදැ'යි ඔය සිනේ"

(iv) "...... අපාය නමැති **වඩබාමුඛයෙහි** වැටී **අනයව්‍යසනයට** පැමිණෙන්නා වූ සත්ත්ව සමූහයා සේ ....."

(ලකුණු 05 × 04 = 20 යි.)

**අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය**

(i) නොපදමින - අග හිඟකම නිසා/ අඩු පාඩු හේතුවෙනි
දන - වස්තුව/ කහවණු/ මුදල්/ ධනය/සල්ල

පෙර කාලයේ (අතීතයේ) සිට අප වෙනසක් නැතිව හැඳිනගෙන සිටි නිසා ගෙදර ඇති අග හිඟකම් හේතුවෙන් මෙහි තබා තිබූ ධනය වියදම් කළෙමු.

(ii) වඩාගත් - ඇති දැඩි කරගත්/ වර්ධනය කරගත්/ හදාවඩා ගත්/ ලොකුමහත් කර ගත්/ පෝෂණය කර ගත්
කල්‍යාණ - යහපත්/ හොඳ/ සිත්ගන්නාසුලු

ජීවකයින් තමා හදාවඩා ගත් තොරතුරුත් ඔහුගේ ශිල්පය ඉගෙනගත් ආකාරයත්, යහපත් ගති ගුණ ඇති ආකාරයත් පැවසී ය.

(iii) සුදු සක - සුදු පැහැති හක් ගෙඩියක්/ ශ්වේත සංඛයක්
සුදු යම් දෙයක් - යහපත් දෙයක්/ හොඳ දෙයක්/ සුබ දෙයක්/ ශුභදායක සිදුවීමක්


සුදු පැහැති හක් ගෙඩියක ආකාරයේ ඇත් පැටියෙකු යහනට පැමිණ සුදු සොඬෙන් ටිකෙන් ටික අනේ මගේ බඩ පිරිමදියි. සුද්ධෝදන රජතුමනි, ඔය සිහිනය කුමක් ද?

(iv) වඩබා මුඛයෙහි - මුහුදු පතුලේ ඇතැයි සැලකෙන විශාල ගිනි කඳ/ වඩබාග්නිය පටන් ගන්නා තන්හි


අනයව්‍යසනයට - නොයෙක් විනාශයන්ට/ අනේක දුක් පීඩාවලට

අපාය නැමති (නරකාදිය නැමති) මුහුද පතුලේ ඇතැ යි සැලකෙන ගිනි කඳෙහි වැටී නොයෙක් කරදර දුක් පීඩාවලට පත් වන සත්ව සමූහය වගේ

**2 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන**




අයදුම්කරුවන්ගේ ප්‍රතිචාරයන් දෙස බැලීමේදී මෙම ප්‍රශ්නය තෝරා ගැනීමේ ප්‍රතිචාරය 95%ක ප්‍රතිශතයක් ගත්ත ද නිවැරදි පිළිතුරු ඉදිරිපත් කිරීමේදී අඩු ප්‍රතිශතයක් ගෙන ඇත. ඒ අනුව
ඉන් ලකුණු 00-05 ප්‍රාන්තරයෙහි 28%ක් ද
ලකුණු 06-10 ප්‍රාන්තරයෙහි 29%ක් ද
ලකුණු 11-15 ප්‍රාන්තරයෙහි 25%ක් ද
ලකුණු 16-20 ප්‍රාන්තරයෙහි 18%ක් ද
ලකුණු ලබා ගෙන ඇත.




මෙම ප්‍රශ්නයේ අනු කොටස් (i, ii, iii, iv) සඳහා පහසුතාව පිළිවෙළින් 58%, 53%, 47%, 26% වේ. මෙහිදී I, II අනු කොටස්වල පහසුතාව වැඩිවීමට හේතු වූයේ කාව්‍යශේඛරයෙන් උපුටාගත් "සිඳුවූ සෙයින් අඳහස" පාඩමේ ඇතුළත් පද්‍යයේ සරල බවත්, පූජාවලියේ ජීවක කථා වස්තුවෙන් උපුටා ගත් පාඨය සරල වීමත්ය. අඩුම පහසුතාව 26%ක් ලබා ඇත්තේ iv අනු කොටස සඳහා සද්ධර්මාලංකාරයේ උත්තරරෝලිය කථා වස්තුවෙන් උපුටාගත් පාඨයයි. එයට හේතු වී ඇත්තේ පාඩම අවසානයේ ඇති මෙම ඡේදය කෙරෙහි ගුරු සිසු අවධානය අඩුවීම බව කිව හැකිය.

සමස්තයක් වශයෙන් ගත් කළ ගද්‍ය, පද්‍ය. නාට්‍ය කොටස්වල දුරවබෝධ වදන්හි අර්ථ පැහැදිලි කරලීමත්, අර්ථාවබෝධය වර්ධනය කරලීමට පන්ති කාමරය තුළ අපේක්ෂකයින් යොමු කරලීම වැදගත් වේ. විශේෂයෙන්ම කළු අකුරින් දක්වා ඇති වචනවල පමණක් නොව සමස්ත කොටසේම අර්ථ ලිවීම වැදගත් බව අයදුම්කරුවන්ට අවධාරණය කළ යුතුවේ.

සිංහල ගද්‍ය පද්‍ය පාඨවල දුරවබෝධ වචනවල තේරුම් කටපාඩම් කරවීම, නිරන්තර අභ්‍යාසවල යෙදවීම තුළින් සාර්ථක පිළිතුරු අපේක්ෂා කළ හැකිය.

03 ප්‍රශ්නය

- **3, 4** යන ප්‍රශ්න සඳහා වන උත්තරයක වචන **125**ක් පමණ තිබීම සෑහේ.

**3.** (i) දිළිඳුකමේ පීඩිත බව හා
(ii) අවංකකමේ යහපත් බව

**නිරූපණයට කතුවරයා දක්වා ඇති දක්ෂතාව 'පොළෝ කුහරයෙන් පැමිණි මිනිසා' කෙටිකතාවෙන් එක් කරුණකට නිදසුන් දෙක බැගින් දක්වමින් අගයන්න.** (ලකුණු 15 යි.)

අපේක්ෂිත පිළිතුර

(i) දිළිඳුකමේ පීඩිත බව

පොළෝ කුහරයෙන් පැමිණි මිනිසා කෙටිකතාවේ දිළිඳුකමේ පීඩිත බව නිරූපණයට කතුවරයා දක්වා ඇති දක්ෂතා හෙළි වන අවස්ථා කිහිපයක් මෙසේය.

- රාසුල් ජු ගේ බාහිර ස්වරූපය තුළින් මතු වන දිළිඳුකම
- කුලී වැඩ කිරීමෙන් සුළු මුදලක් ලැබීම ඇතැම් විට කිසිවක් නොලැබීම
- කිසිදු උගත්කමක් නොමැති වීම නිසා රැකියාවක් නොලැබීම
- යුද ගැටුම් මිනිසා උන්හිටි තැන් අහිමි වී අසරණ වීම
- කුසගින්න නිවා ගැනීමට තරම්වත් ආහාරයක් ඇතැම්විට නොලැබීම

මෙවැනි කරුණු දෙකක්වත් නිදසුන් සහිතව පැහැදිලි කිරීම අවශ්‍ය වේ.

(ii) අවංකකමේ යහපත් බව

- අවංකකමේ පහපත් බව නිරූපණය කිරීමේ " පහත සඳහන් කරුණු ගැන අවධානය යොමු කරන්න.
- මුදල් ලබා ගැනීමට වඩා භාරගත් කාර්යය මැනවින් ඉටු කිරීමට රාසුල් ජු උත්සාහ ගැනීම
- සේවයට කැපවීම
- සාධාරණ ලෙස ගාස්තු අය කිරීම
- ඉටු කළ කාර්යයට පෙරළා පැසසුම් අපේක්ෂා නොකිරීම

**උදාහරණ සඳහා ලකුණු 04 යි**
**සමස්ත විස්තරයට ලකුණු 11 යි**
**මුළු ලකුණු 15 යි**

**නැතහොත්**

**සිංහල අලුත් අවුරුදු කාලය**
**(i) ස්වාභාවික පරිසරය කෙරෙහි හා**
**(ii) මිනිස් ක්‍රියාකාරකම් කෙරෙහි බලපාන ආකාරය**
**'වසන්ත සමය' පැදි පෙළෙහි මැනවින් නිරූපිත ය. එක් කරුණකට නිදසුන් දෙක බැගින් දක්වමින් විමසන්න.**
**(ලකුණු 15 යි.)**

අපේක්ෂිත පිළිතුර

(i) ස්වාභාවික පිසරය

වසන්ත සමය පැදි පෙළෙහි එන ස්වාභාවික පරිසරය නිරූපිත අවස්ථා කීහිපයක් මෙසේය. එරබදු, බක්මී, නා ගස්, නෙළුම් මල්වලින් බර වීම

- කුරුල්ලන්ගේ නාදය පැතිර යාම
- මීවදවල පැණි පිරීම
- අඹගස් දලු ලෑම
- මල්වල සුවඳ පැතිරීම
- කජු පුහුලන් කෑමට වවුලන් පැමිණීම

(ii) මිනිස් ක්‍රියාකාරකම්


මෙම කවි පංතියෙන් මතු වන මිනිස් ක්‍රියාකාරකම් කිහිපයක් සඳහන් වේ.

- කජු ඇහිඳීමට දරුවන් ඇදී යාම
- තරුණ තරුණියන් අතර ඇතිවන ප්‍රේම සම්බන්ධතා
- අමනාප වූවන් සමගි වීම
- අලූත් ආහාර පිසීම

ආදි ක්‍රියාකාරකම්වලින් දෙකක්වත් නිදසුන් දක්වා පැහැදිලි කිරීම අපේක්ෂිත ය.


(උදාහරණ සඳහා ලකුණු 04 යි)
(සමස්ත විස්තරයට ලකුණු 11 යි)
(මුළු ලකුණු 15 යි)

3 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන




තුන්වන ප්‍රශ්නය ද අනිවාර්ය ප්‍රශ්නයකි. අයදුම්කරුවන්ගෙන් මෙම ප්‍රශ්නය සඳහා පිළිතුරු සපයා ඇත්තේ 92% පමණි. මෙම ප්‍රශ්නයට ලකුණු 15ක් හිමිවෙයි.

ඉන් ලකුණු 00-03 ප්‍රාන්තරයෙහි 17%ක් ද
ලකුණු 04-07 ප්‍රාන්තරයෙහි 19%ක් ද
ලකුණු 08-11 ප්‍රාන්තරයෙහි 28%ක් ද
ලකුණු 12-15 ප්‍රාන්තරයෙහි 36%ක් ද
ලකුණු ලබා ගෙන ඇත.




මෙම ප්‍රශ්නය විකල්ප ප්‍රශ්න දෙකකින් යුක්ත වන අතර ඉන් එක් ප්‍රශ්නයකට පමණක් පිළිතුරු සැපයිය යුතුය. එම ප්‍රශ්න දෙක අතුරෙන්, පළමුවන ප්‍රශ්නයෙහි පහසුතාව 52% කි. නැතහොත් ප්‍රශ්නයෙහි පහසුතාව 63 කි.

මෙහි පළමුවන ප්‍රශ්නයේ පහසුතාවට වඩා නැතහොත් ප්‍රශ්නයේ පහසුතාව වැඩි වී ඇති බව පෙනේ. මෙයට හේතුව නූතන සාහිත්‍යයේ ගද්‍ය කොටසක් වන පොළෝ කුහරයෙන් ආ මිනිසා කෙටිකතාවට පිළිතුරු ලිවීමට වඩා පහසුතාවක් නැතහොත් ප්‍රශ්නය වන වසන්ත සමය ඇසුරින් සකස් වී තිබීම හේතුවන්නට ඇත.

සමස්තයක් වශයෙන් ගත් කළ මෙකී ප්‍රශ්න පිළිබඳ පන්ති කාමරයේදී සාකච්ඡා කිරීම, ප්‍රායෝගික ජීවිතයට සම්බන්ධ කිරීමේ ක්‍රියාකාරකම් සංවිධානය කිරීම තුළින් නිර්දිෂ්ට කෘති කෙරේ අයදුම්කරුවන් ප්‍රතිචාර වර්ධනය කර පිළිතුරු සැපයීමේ හැකියාව සතුටුදායක මට්ටමකට ළඟා කරගත හැකි වනු ඇත.

## 04 ප්‍රශ්නය

**4.** (i) **අනුප්‍රාස භාවිතය සහ**
(ii) **එළිසම භාවිතය**

**සඳ කිඳුරු දා කවෙහි සාර්ථකත්වයට ඉවහල් වී ඇති ආකාරය 'කිඳුරු වලප' ඇසුරෙන් නිදසුන් දෙක බැගින් දක්වමින පැහැදිලි කරන්න.** (ලකුණු 15 යි.)

(i) සඳකිඳුරු දා කවෙහි සා ර්ථකත්වය හේතු වන අනුප්‍රාස භාවිතයට හෙළි වන අවස්ථා මෙසේය

සමාන ශබ්ද එක ළඟ යෙදීම මගින් අපේක්ෂිත අදහස් තීව්‍ර කිරීම
මුව මී පොවා පියා
මන පිනා පියා, මරා පියා
සිහිලැල්ලේයා, පවනැල්ලේයා
සුපුල්වන, එකල්වන, විපුල්වන, තැවුල් වන
පසිද්දේ, පෙම් බැඳැ සැප විඳැ, සොඳිනේ, නොවද්දේ, ලුද්දේ, විද්දේ

සැම කවියක් පාසා ම සමාන ශබ්ද භාවිත කිරීම මගින් කවියා අනුප්‍රාසය මතු කරයි මෙහි" නිදසුන් දෙකක් අදාළ කවි මගින් ඉදිරිපත් කිරීම ප්‍රමාණවත් වේ.

(ii) එළිසමය භාවිතය

මෙහි සෑම කවියක් ම අවසාන වන්නේ සමාන අක්ෂර යෙදීමෙනි. එසේම සෑම කවියක ම ආරම්භයේ "සමාන අක්ෂර සහිත වචන දැක්වේ. ඇතැම් කවිවල මුල, මැද, අග යන ස්ථාන තුනෙහි ම එළිසමය රැකී ඇත.

මේ කරුණු තහවුරු කිරීමට නිදසුන් කවි දෙකක්වත් දක්වා තිබීම අවශ්‍යයයි.

(මෙම උදාහරණ හෝ වෙනත් ගැළපෙන උදාහරණ ද නිවැරදි සේ පිළිගන්න.
එක් කොටසකට උදාහරණ දෙකක් දක්වා තිබීම ප්‍රමාණවත්ය.)

**උදාහරණ සඳහා ලකුණු 04 යි**

**සමස්ත විස්තරයට ලකුණු 11 යි**

**මුළු ලකුණු 15 යි**

**නැතහොත්**

**(i) තණ්හාව, විනාශය ගෙන දෙන බව හා**

**(ii) දූරදර්ශී වීම සාර්ථක ජීවිතයකට පදනම වන බව**

**වේදබ්භ ජාතකය ඇසුරෙන් එක් කරුණකට නිදසුන් දෙක බැගින් දක්වමින් පෙන්වා දෙන්න.** (ලකුණු 15 යි.)

අපේක්ෂිත පිළිතුර

නැතහොත්

(i) තණ්හාව, විනාශය ගෙන දෙන බව වේදබ්භ ජාතකයෙන් හෙළිවන අවස්ථා කිහිපයක් මෙසේය.

- පෙසෙනකචෝර නම් සොර කණ්ඩායමේ ක්‍රියා කලාපය විනාශයට හේතු වූ බව
- තවත් සොර කණ්ඩායමක් පැමිණ වස්තුව උදුරා ගැනීමට දරන ප්‍රයත්න විනාශය ගෙන දුන් බව
- අවසානයේ "ඉතුරු වූ සොරුන් දෙදෙනාගේ විනාශයට තණ්හාව හේතු වූ බව
- වේදබ්භ බමුණාගේ විනාශයට ද තණ්හාව හේතු වූ බව වැනි සිදුවීම් දෙකක් නිදසුන් මගින් පැහැදිලි කිරීම ප්‍රමාණවත් වේ.

(ii) දූරදර්ශී වීම සාර්ථක විතයකට පදනම් වන බව හෙළි වන අවස්ථා මෙසේය

- සොර කණ්ඩායමට හසු වූ අවස්ථාවේ "බෝසත් ශිෂ්‍යයා ගුරුවරයාට උපදෙස් දීම
- අන්තේවාසිකයා සොරුන් දමා ගිය වස්තුව තමන්ගේ භාරයට සෘජුව නොගෙන උපායශීලීව ගෙන්වා ගැනීම හා එම වස්තුව පිනට දහමට යෙදවීම

මේ කරුණු නිදසුන් මගින් හෙළි වන ආකාරය පැහැදිලි කිරීම අපේක්ෂිත ය.


(මෙම උදාහරණ හෝ වෙනත් ගැළපෙන උදාහරණ ද නිවැරදි සේ පිළිගන්න.
එක් කොටසකට උදාහරණ දෙකක් දක්වා තිබීම ප්‍රමාණවත්ය.)

**උදාහරණ සඳහා ලකුණු 04 යි**

**සමස්ත විස්තරයට ලකුණු 11 යි**

**මුළු ලකුණු 15 යි**

4 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන





අනිවාර්ය ප්‍රශ්නයකි. එය ද අයදුම්කරුවන්ගේ පහසුව සඳහා කොටස් දෙකකින් යුක්තය.
පළමු කොටසේ සඳහන් වී ඇත්තේ "සඳකිඳුරු දා කව් පද්‍යයෙන් උපුටා ගත් ප්‍රශ්නයකි.

නැතහොත් ප්‍රශ්නය ජාතක කථා පොතේ වේදබ්භ ජාතිකය ඇසුරෙන් සැකසී ඇත.

ලකුණු 15කින් සමන්විත මෙම ප්‍රශ්නය සඳහා
- ලකුණු 00-03 ප්‍රාන්තරයෙන් 14%ක් ද
- ලකුණු 04-07 ප්‍රාන්තරයෙන් 21%ක් ද
- ලකුණු 08-11 ප්‍රාන්තරයෙන් 36%ක් ද
- ලකුණු 12-15 ප්‍රාන්තරයෙන් 29%ක් ද

ලකුණු ලබා ගෙන ඇත.




4 ප්‍රශ්නය විකල්ප ප්‍රශ්න දෙකකින් යුක්ත වූ අතර ඉන් එක් ප්‍රශ්නයකට පමණක් පිළිතුරු සැපයිය යුතුය.

මෙහිදී "සඳකිඳුරු දා කව" ප්‍රශ්නය සඳහා අයදුම්කරුවන් ලබාගත් පහසුතාව 54% වන අතර වේදබ්භ ජාතකය ඇසුරෙන් සකස් වූ නැතහොත් ප්‍රශ්නයට ලබාගත් පහසුතාව 44%කි. ඒ අනුව උදාහරණ සැපයීමේදී සඳකිඳුරු දා කව අයැදුම්කරුවන්ට සරල වීමත් වේදබ්භ ජාතකය ඇසුරෙන් උදාහරණ සැපයීම සංකීර්ණවීමත් දැකිය හැකිය.

සඳකිඳුරු කවෙන් පිළිතුරු සැපයීමේදී උදාහරණ පද්‍ය පාඨ උපුටා දැක්වීම හා අදාළ විස්තර කිරීම් කළයුතු අතර බොහෝ අයැදුම්කරුවන් පද්‍ය පාඨ ඉදිරිපත් කිරීමටත් අදාළ විස්තර ප්‍රශ්නයට ගැළපෙන පරිදි යොමු කිරීමටත් අපොහොසත් වී ඇති බව පෙනේ.

නිර්දිෂ්ට ග්‍රන්ථ ඇසුරෙන් විමසිය හැකි ප්‍රශ්න පිළිබඳ ව අයැදුම්කරුවන් දැනුවත් කිරීමත් ප්‍රශ්නයකට අදාළ ව පිළිතුරු ගොනු කර ගැනීමට හුරුකිරීමත් අවශ්‍ය බැවින් පන්ති කාමරයේදී ඒ පිළිබඳ අවධානය යොමු කිරීමට ගුරුභවතුන් කටයුතු කළයුතු බව අවධාරණය කෙරේ.

05 ප්‍රශ්නය

- **5, 6, 7** ප්‍රශ්නවලින් **එකකට** පමණක් උත්තර ලියන්න. උත්තරයක වචන **100**ක් පමණ තිබීම සෑහේ.

**5.** කථකයාගේ හැඟීම් ප්‍රකාශ කිරීම සඳහා උචිත භාෂා විලාසයක් භාවිත කිරීමට කවියා උත්සුක වී ඇති ආකාරය 'පියසේන ඇසූ ප්‍රශ්නයක්' පැදි පෙළෙන් නිදසුන් **තුනක්** දක්වමින් විස්තර කරන්න. (ලකුණු 10 යි.)

අපේක්ෂිත උත්තරය

කථකයගේ හැඟීම් ප්‍රකාශ කිරීම සඳහා උචිත භාෂා විලාසයක් භාවිත කිරීමට කවියා උත්සුක වී ඇති ආකාරය

- සරල බස් වහර භාවිතය
- කුඩා දරුවන්ට උචිත කට වහර භාවිතය
- පියසේන නම් ළමයා ලවා ම ප්‍රකාශ ලෙස ඉදිරිපත් කිරීම
- දෙපද ආකෘතිය තුළින් හැඟීම් ප්‍රකාශ කිරීම
- ප්‍රශ්න වාචී ස්වරූපයෙන් කවිය නිමවා තිබීම


(මෙම උදාහරණ හෝ වෙනත් ගැළපෙන උදාහරණ ද නිවැරදි සේ පිළිගන්න.)

**උදාහරණ සඳහා ලකුණු 03 යි**

**සමස්ත විස්තරයට ලකුණු 07 යි**

**මුළු ලකුණු 10 යි**


## 5 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන




මෙම ප්‍රශ්නය පියසේන ඇසූ ප්‍රශ්නයක් ඇසුරෙන් සැකසී ඇත.

අයදුම්කරුවන්ගෙන් 73%ක් පමණ ඊට පිළිතුරු සපයා තිබිණ. සමස්ත පහසුතාව 65%කි. ලකුණු 6ත් 10ත් අතර ලබාගෙන ඇති ප්‍රතිශතය 70%කි. 30%ත් ලබාගෙන ඇත්තේ ලකුණු 06ට අඩුවෙනි.

ලකුණු 10ක් හිමිවන මෙම ප්‍රශ්නය සඳහා ලබා ඇති ලකුණු ගණනය කිරීමේදී
ඉන් ලකුණු 00-02 අතර ප්‍රාන්තරය 07%ක් ද
ලකුණු 03-05 අතර ප්‍රාන්තරය 23%ක් ද
ලකුණු 06-07 අතර ප්‍රාන්තරය 36%ක් ද
ලකුණු 08-10 අතර ප්‍රාන්තරය 34%ක් ද
ලකුණු ලබා ගෙන ඇත.




නිර්දිෂ්ට නූතන සාහිත්‍යය කෘති පිළිබඳ ව වැඩි අවධානයක් යොමු කිරීමත්, ඒ ඇසුරෙන් විමසිය හැකි ප්‍රශ්න කෙරෙහි අයැදුම්කරුවන්ගේ අවධානය යොමු කිරීමත්, නිරන්තර අභ්‍යාසවල යෙදවීමත් මගින් මෙවැනි ප්‍රශ්නවලට උපරිම ලකුණු ලබා ගැනීමට අවස්ථාව සැලසිය හැකිය. ඒ පිළිබඳ ව ගුරුභවතුන්ගේ අවධානය යොමු විය යුතු බව අවධාරණය කෙරේ.

ප්‍රශ්න අංකය - 06

**6.** "යහපත් සිතින් සුළු දෙයක් දන් දීමෙන් පවා ඉතා විශාල ප්‍රතිලාභ ලැබිය හැකි බව 'උත්තරෝලිය වස්තුවෙන්' පෙන්වා දෙයි." නිදසුන් **තුනක්** සහිත ව පහදන්න. (ලකුණු 10 යි.)

**අපේක්ෂිත උත්තරය**


යහපත් සිතින් සුළු දෙයක් දන් දීමෙන් පවා ඉතා විශාල ප්‍රතිලාභ ලැබිය හැකි බව උත්තරෝලිය වස්තුවෙන් පෙන්වා දෙයි.

- තමාගේ ආහාරයට තිබූ පිළිණි කටු අලය භක්තියෙන් පූජා කිරීම
- දෙවන ආත්මයේ මවුකුස සිටිය දීම උතුරාලු වැවේ ඔහු වෙනුවෙන් නිධානයක් පහළ වීම
- නිධානයෙන් ලැබෙන සම්පත් ඔහුගේ අවශ්‍යතා සඳහා පමණක් යෙදවීමට හැකි වීම
- තමා කළ කුශලයෙන් ලද වස්තුව දෙවියන්ට, රජුන්ට පවා උදුරාගන්නට හෝ නසා දමන්නට නොහැකි වීම
- රජුගේ ප්‍රසාදය හිමිවීම හා ගම්වර, දාස දාසීන් ආදිය ලැබීම
- දෙව් ලොව ඉපදීම


මෙයින් උදාහරණ තුනක් ඉදිරිපත් කර තිබේනම් සාර්ථක පිළිතුරක් සේ පිළිගන්න.

**උදාහරණ සඳහා ලකුණු 03 යි**
**සමස්ත විස්තරයට ලකුණු 07 යි**
**මුළු ලකුණු 10 යි**

**6 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන**




මෙම ප්‍රශ්නය සඳහා පිළිතුරු සැපයූ අයදුම්කරුවන්ගේ ප්‍රතිශතය 09%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 10ක් හිමිවේ.
ඉන් ලකුණු 00-02 අතර ප්‍රාන්තරය 30%ක් ද
ලකුණු 03-05 අතර ප්‍රාන්තරය 29%ක් ද
ලකුණු 06-07 අතර ප්‍රාන්තරය 22%ක් ද
ලකුණු 08-10 අතර ප්‍රාන්තරය 19%ක් ද
ලකුණු ලබා ගෙන ඇත.




උත්තරෝලිය වස්තුව මුල් කරගෙන ලියැවුණු මෙම ප්‍රශ්නයෙහි සමස්ත පහසුතාව 43%කි. මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයූ අයදුම්කරුවන්ගෙන් 59%ක්ම ලබා ගෙන ඇත්තේ ලකුණු 06ට අඩුවෙනි. 6ත් 10ත් අතර ලකුණු ලබාගෙන ඇති සංඛ්‍යාව 41%කි.

5, 6, 7, යන ප්‍රශ්නවලින් අඩුම පහසුතාවක් ද ලබාගෙන ඇති මෙම ප්‍රශ්නයට අඩු ලකුණු ප්‍රමාණයක් ලැබීමට හේතු වී ඇත්තේ නිර්දිෂ්ට කතාව පිළිබඳ ව අයදුම්කරුවන්ගේ අවධානය නිසි පරිදි යොමු වී නොතිබීමත්, පුරාතන ගද්‍ය සාහිත්‍යය අවබෝධ කර ගැනීමට අවශ්‍ය නිසි මගපෙන්වීමක් නොලැබීමත් විය හැකිය.

07 ප්‍රශ්නය

**7.** **"ප්‍රබල නාට්‍යමය අවස්ථා ගොඩනැංවීම සාර්ථක නාට්‍යයක ලක්ෂණයකි." 'මඟුල් ප්‍රස්තාව' නාට්‍යයෙන් නිදසුන් තුනක් දක්වමින් තහවුරු කරන්න.** (ලකුණු 10 යි.)

**අපේක්ෂිත පිළිතුර**

ප්‍රබල නාට්‍යමය අවස්ථා ගොඩනැංවීම සාර්ථක නාට්‍යයක ලක්ෂණයකි.

මගුල් ප්‍රස්තාව නාට්‍යයෙහි,


- ලව්නේරිස්, තෙපානිස් හමුවීමට පැමිණි කාරණය කීමට උත්සාහ දරන අවස්ථාව
- ලව්නේරිස් පැමිණ කාරණය නොදන්නා නන්දාවතී ඔහු හමුවට පැමිණි අවස්ථාව
- ගෝනහේන ඉඩමේ උරුමය ගැන මත ගැටෙන අවස්ථාව
- තෙපානිස් හා නන්දාවතී විසින් ලව්නේරිස් නිවසින් බැහැර කරන අවස්ථාව
- ලව්නේරිස් පැමිණි කාරණය නන්දාවතී දැන ගත් අවස්ථාව
- හඳයාත් වල්ලියාත් ගැන නන්දාවතී, ලව්නේරිස් හා තෙපානිස් අතර ඇති වන සංවාදය

ආදි නිදසුන් අවස්ථා තුනක් " ඇත්නම් සාර්ථක පිළිතුරක් සේ සලකන්න.


(නිදසුන් 3 ක් ඉදිරිපත් කරමින් කරුණු දැක්වීම ප්‍රමාණවත් ය.
ගැළපෙන වෙනත් නිදසුන් ද පිළිගන්න.)

**උදාහරණ සඳහා ලකුණු 03 යි**
**සමස්ත විස්තරයට ලකුණු 07 යි**
**මුළු ලකුණු 10 යි**

7 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන




මගුල් ප්‍රස්තාව නාට්‍යය පාදක කරගෙන සැකසුණු මෙම ප්‍රශ්නය තෝරා ගෙන ඇති අයදුම්කරුවන් සංඛ්‍යාව 9%කි. මෙහි සමස්ත පහසුතාව 46%කි. ලකුණු 10ක් හිමිවන මෙම ප්‍රශ්නය සඳහා අයදුම්කරුවන් ලකුණු ලබාගෙන ඇති ආකාරය බලන කල
ඉන් ලකුණු 00 - 02 ප්‍රාන්තරයෙන් 30%ක් ද,
ලකුණු 03 - 05 ප්‍රාන්තරයෙන් 34%ක් ද,
ලකුණු 06 - 07 ප්‍රාන්තරයෙන් 23%ක් ද,
ලකුණු 08 - 10 ප්‍රාන්තරයෙන් 13%ක් ද,
ලබාගෙන ඇත.





පරිවර්තන නාට්‍යයක් වන මෙයට පිළිතුරු සපයා ඇත්තේ ඉතාමත් අඩු අයදුම්කරුවන් සංඛ්‍යාවකි. පිළිතුරු සපයා ඇති අයදුම්කරුවන් අතුරෙන් ලකුණු 6ට වඩා අඩුවෙන් ලබාගෙන ඇති සංඛ්‍යාව 64%කි. එම 64% අතරෙන් 00ත් 2ත් අතර ලකුණු ලබාගෙන ඇති සංඛ්‍යාව 30% කි. ලකුණු 6ත් හෝ 10ත් අතර ලබාගෙන ඇති සංඛ්‍යාව 36%කි. ඒ අනුව පැහැදිලි වන්නේ මෙම ප්‍රශ්නයට අයදුම්කරුවන් සපයා ඇති පිළිතුරු ප්‍රශස්ත මට්ටමක නොතිබූ බවයි. මෙම ප්‍රශ්නය තෝරාගත් අයදුම්කරුවන් සංඛ්‍යාව අඩුවීමත්, ලකුණු ලබාගැනීම දුර්වල මට්ටමක පැවතීමත් මගින් නාට්‍ය පිළිබඳ ව ඔවුන් තුළ ඇති අනවබෝධය ඉස්මතුවේ. නාට්‍ය පෙළ රසවිඳීමටත් එමගින් මතු කෙරෙන සමහර ප්‍රශ්න කෙරෙහි අවධානය යොමු කරවීමටත්, රසාස්වාදය හා විචාරයට අවශ්‍ය මග පෙන්වීමටත් ගුරුභවතුන් වඩාත් උත්සුක විය යුතු බව අවධාරණය කෙරේ.

* පිළිතුරු සැපයීමේදී III වන ප්‍රශ්න පත්‍රය පිළිබඳව පොදුවේ බලන කල වැඩිම පහසුතාව ලබාගත් ප්‍රශ්න ලෙස 1 සහ 5 දැක්විය හැකිය. එවායේ පහසුතාව 65%කි.

3, 4 ප්‍රශ්න පිළිවෙළින් 57%, 50% පහසුතා පෙන්නුම් කරන අතර, 2, 7 ප්‍රශ්න 46%ක පහසුතාවක් පෙන්නුම් කරයි. අඩුම පහසුතාවක් දක්වන්නේ 6 වන ප්‍රශ්නයටයි. එහි පහසුතාව 43%කි. ඒ අනුව 3 වන ප්‍රශ්න පත්‍රයේ සමස්ත පහසුතාව 53%කි.

සිංහල භාෂාව හා සාහිත්‍යය ප්‍රශ්න පත්‍රය දෙස සමස්තයක් වශයෙන් බලන කල්හි ප්‍රශ්න පත්‍ර තුනෙහි සමස්ත පහසුතාව පහත පරිදි වේ.
I ප්‍රශ්න පත්‍රයෙන් සමස්ත පහසුතාව 52%කි.
II ප්‍රශ්න පත්‍රයෙහි සමස්ත පහසුතාව 65%කි.
III ප්‍රශ්න පත්‍රයෙහි සමස්ත පහසුතාව 53%කි.



## III කොටස

### 3. පිළිතුරු සැපයීමේදී සැලකිලිමත් විය යුතු කරුණු හා යෝජනා

### 3.1 පිළිතුරු සැපයීමේදී සැලකිලිමත් විය යුතු කරුණු

**පොදු උපදෙස්**

* ප්‍රශ්න පත්‍රයේ ඇති මූලික උපදෙස් කියවා හොඳින් තේරුම් ගත යුතුය. එක් එක් කොටසින් කොපමණ ප්‍රශ්න සංඛ්‍යාවකට පිළිතුරු සැපයිය යුතු ද, කුමන ප්‍රශ්න අනිවාර්යය ද, කොපමණ කාලයක් ලැබේ ද, කොපමණ ලකුණු ලැබේ ද, යන කරුණු පිළිබඳ ව සැලකිලිමත් විය යුතු අතර ප්‍රශ්න හොඳින් කියවා නිරවුල් අවබෝධයක් ඇති කරගෙන ප්‍රශ්න තෝරා ගත යුතුය.

* I වන පත්‍රයේ ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේදී වඩාත් නිවැරදි **එක්** පිළිතුරක් පමණක් තෝරා ගත යුතුය. තවද එක් කතිර ලකුණක් පමණක් යෙදිය යුතුය. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයූවා දැයි සුපරීක්ෂාකාරී විය යුතුය.

* II පත්‍රයේ හා III පත්‍රයේ ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේදී සෑම ප්‍රධාන ප්‍රශ්නයක්ම අලුත් පිටුවකින් ආරම්භ කළ යුතුය.

* නිවැරදි හා පැහැදිලි අත් අකුරුවලින් පිළිතුරු ලිවිය යුතුය.

* අයදුම්කරුගේ විභාග අංකය සෑම පිටුවකම අදාළ ස්ථානයේ ලිවිය යුතුය.

* නිශ්චිත කෙටි පිළිතුරු ලිවීමට අවශ්‍ය අවස්ථාවලදී දීර්ඝ විස්තර ඇතුළත් නොකිරීම මෙන්ම විස්තරාත්මක පිළිතුරු සැපයිය යුතු අවස්ථාවලදී කෙටි පිළිතුරු සැපයීම ද නොකළ යුතුය. අදාළ අවස්ථාවලදී සුදුසු නිදසුන් ඉදිරිපත් කළ යුතුය.

* පිළිතුරු සමන්විත විය යුතු වචන සංඛ්‍යාව දී ඇති විට, එම වචන සංඛ්‍යාවට හැකි තරම් ආසන්න වචන සංඛ්‍යාවකින් යුතු වන සේ පිළිතුරු සංවිධානය කර ගත යුතුය. එසේ නොවීම ලකුණු අඩුවෙන් ලැබීමට හේතු විය හැකි බැවිනි.

**විශේෂ උපදෙස් :**

* අත් අකුරු සහ අක්ෂර වින්‍යාසය පිළිබඳ ව විශේෂයෙන් සැලකිලිමත් විය යුතුය.

* ශිල්පීය දක්ෂතා (පද බෙදීම, විරාම ලක්ෂණ, ඡේද අදාළ පරිදි වෙන් කොට තිබීම යන අංග) පිළිබඳ ව විශේෂයෙන් සැලකිලිමත් විය යුතුය.

## 3.2 ඉගෙනුම් හා ඉගැන්වීම් පිළිබඳ අදහස් හා යෝජනා

- ★ සිංහල අක්ෂර මාලාව පිළිබඳ ව පෙළපොත්වල ඇති පාඩම් දෘශ්‍යාධාර භාවිත කරමින් හා ගුරු මාර්ගෝපදේශ ග්‍රන්ථ පරිශීලනය කරමින් නිවැරදි ව ලිවීමේ හැකියාව ප්‍රගුණ කළ යුතුය.
- ★ උක්තාඛ්‍යාත පද සම්බන්ධය පිළිබඳව 10 වන ශ්‍රේණියේ පෙළපොතෙහි අදාළ පාඩම් දෙක අභ්‍යාසවල යොදවමින් 10, 11 ශ්‍රේණි දෙකේදී ම ක්‍රියාකාරකම්වල නිරත කළ යුතුය.
- ★ පැරණි ගද්‍ය සාහිත්‍ය පාඩම් සිසුන් ලවා කියවීම හා කියවීමෙන් අවබෝධය ලබා ගැනීමට අවස්ථාව ලැබෙන පරිදි අභ්‍යාස සැලසුම් කළ යුතුය.
- ★ රචනා ලිවීමේදී ව්‍යුහගත රචනාවක් යනු කුමක් දැයි පැහැදිලි කර, අ.පො.ස.(සා.පෙළ) විභාගයේදී එවන් රචනාවකට ලකුණු ලැබෙන පිළිවෙළ හා ලකුණු ලබා ගැනීමට අනුගමනය කළ යුතු ක්‍රමවේදය පිළිබඳව 10 වන ශ්‍රේණියේදී ම මග පෙන්වීම කළ යුතුය.
- ★ ප්‍රායෝගික ලේඛන ලිවීමේදී ඒ ඒ ලේඛනවල වෙනස හඳුන්වා දී ආකෘතියේ වෙනස්කම් සිසුන්ට පැහැදිලි කර දිය යුතුය.
- ★ සාහිත්‍ය පෙළපොතෙහි ඇතුළත් පාඩම් රසාස්වාදය සඳහා ඉඩ ප්‍රස්තා ලැබෙන පරිදි හැකි සෑම විට ම නාට්‍යානුසාරයෙන් ඉගැන්වීමට සුදුසු ඉගෙනුම්-ඉගැන්වීම් අවස්ථා සංවිධානය කරගත යුතුය.
- ★ ව්‍යාකරණ ඉගැන්වීමේදී, කවිය, ගීතය හා ප්‍රායෝගික ජීවිතය ඇසුරෙන් නිදර්ශන සපයමින් රසවත් ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රම ගුරුවරුන් විසින් නිර්මාණය කරගත යුතුය.
- ★ කර්තෘකාරක හා කර්මකාරක වාක්‍ය පිළිබඳ සිසුන්ගේ අවබෝධය සතුටුදායක නොවන බැවින් සරු ඉගැන්වීම් ක්‍රම මගින් භාවිත හැකියාව නැංවීමට පියවර ගත යුතුය.
- ★ සමානාර්ථ, විරුද්ධාර්ථ හා බහුඅර්ථ පද ඇතුළු වාක් කෝෂය සංවර්ධනය සඳහා උපකාර වන සරල අභ්‍යාසවල නිතර යෙදීමට අවස්ථා සම්පාදනය කළ යුතුය.
- ★ අක්ෂර වින්‍යාසය බොහෝ විට වැරදි ලෙස භාවිත කෙරෙන වචන තෝරා ගෙන ඒවා නිවැරදිව භාවිත කිරීම සඳහා සතතාභ්‍යාස කළ යුතුය.
- ★ බාහිර පොත් පත් කියවීමට පෙලඹෙන පරිදි විෂය සමගාමී කටයුතු සංවිධානය කළ යුතුය.
- ★ පන්ති කාමර ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියට අමතර ව සිසුන් නිර්මාණකරණයෙහි යෙදවීමට ද උනන්දු විය යුතුය.
- ★ ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සැලසුම් කිරීමේදී අඩු සාධන මට්ටමක් සහිත සිසුන් කෙරෙහි වැඩි අවධානයක් යොමු කළ යුතුය.
- ★ අත් පත්‍රිකා, රාජකාරි ලිපි ඇතුළු ලේඛන කුසලතා ප්‍රවර්ධනය සඳහා ප්‍රායෝගික ලේඛන අත්දැකීම් සිසුනට ලබාදීමට ක්‍රියා කළ යුතුය.
- ★ වාර විභාග ලකුණු පදනම් කර ගනිමින් සිංහල භාෂාව හා සාහිත්‍යය විෂයය සමත් වීමේ ලකුණු සීමාවට ආසන්න වී ඇති සිසුන් සඳහා කෙටි කාලීන ප්‍රතිකාරක වැඩ සටහන් ක්‍රියාත්මක කළ යුතුය.
- ★ සංවේදී භාවයෙන් හා රසඥතාවෙන් පිරිපුන් රසිකයකු බිහි කිරීමෙහිලා සාහිත්‍යයෙන් සිදුවනුයේ අපමණ මෙහෙයකි. එවන් පුද්ගලයින් සමාජයට මහගු සම්පතකි. සමාජය මිනිස්කමින් පුරවන්නට නම් සාහිත්‍යය කෙරෙහි වඩාත් හොඳින් සිසුන් යොමු කරවීම කාලීන අවශ්‍යතාවකි. මේ පිළිබඳ ගුරු භවතුන් ඇතුළු අදාළ බලධාරීන්ගේ අවධානය යොමු විය යුතුය.

## III ප්‍රශ්න පත්‍රය

2.3.1 III ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය

කාලය පැය 02 යි. මුළු ලකුණු 80 කි.

සිංහල භාෂාව හා සාහිත්‍යය III ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න 7කින් සමන්විතය.
මෙහි 1, 2, 3, 4 ප්‍රශ්න අනිවාර්ය වේ.

නිර්දිෂ්ට ග්‍රන්ථ පිළිබඳව අපේක්ෂකයින්ගේ අවබෝධය විචාරාත්මක හා තර්කානුකූල දැනුම, භාෂා ඥානය, සාහිත්‍යාවබෝධය හා රසවින්දන හැකියාව පරීක්ෂා කෙරෙන පළමු ප්‍රශ්නය සඳහා අනුකොටස් දහයක් ඇතුළත් වේ. එක් අනු ප්‍රශ්නයක එක් කොටසකට ලකුණු 1 බැගින් මුළු ලකුණු 20කි.

නිර්දිෂ්ට සාහිත්‍යය ග්‍රන්ථ පරිශීලනය පිළිබඳ පරිචය ඇගයීම කෙරෙයි.

සිංහල භාෂාව හා සාහිත්‍යය
III පත්‍රයේ 2, 3, 4 ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීම අනිවාර්ය වූ අතර එහි 2 වන ප්‍රශ්නය සඳහා පහසුතාව 49%කි.

3 වන ප්‍රශ්නය කොටස් 2කින් සමන්විත වූ අතර වැඩිම පහසුතාව 76%ක් ලබාගෙන ඇත්තේ 3 වන ප්‍රශ්නයේ II කොටසට වේ. එහි I කොටසට පහසුතාව 63%කි. එය 3, 4 ප්‍රශ්නවල අඩුම පහසුතාවය වේ.

4 වන ප්‍රශ්නය ද කොටස් දෙකකින් යුක්ත වන අතර II කොටසේ පහසුත්ව 68%ක් වන විට I කොටසේ පහසුතාව 64%කි.

5, 6, 7 ප්‍රශ්න අපේක්ෂක තෝරා ගැනීමේ මත සැකසුණකි. මෙහිදී වැඩිම පහසුතාව 68% ලබාගෙන ඇත්තේ 6 වන ප්‍රශ්නයට වේ. දුෂ්කරම පහසුතාව 48%ක් වූ අතර එය 5 වන ප්‍රශ්නය සඳහා ලබා ගෙන තිබුණි.

සමස්තයක් ලෙස බැලූ විට බොහෝ අපේක්ෂකයින්ගේ සිත්ගත් ප්‍රශ්නය බවට පත්ව ඇත්තේ "වැස්ස" පද්‍ය නිර්මාණය වූ බව පැහැදිලි වන අතර අඩුම පහසුතාව ලබාගත් "අපටත් දවසක ඉර පායාදෝ" කෙටි කතාව ආශ්‍රිත ශිෂ්‍ය රුචිකත්වය හා රස වින්දනය කෙරේ ඇති මට්ටම පැහැදිලි වේ.